This is a reproduction of a library book that was digitized by Google as part of an ongoing effort to preserve the information in books and make it universally accessible.

Google books

https://books.google.com

Hosted by Google

# පටුන.

පිටේ
1 ... ... මූලාරම්භය:
2 ... ... 1 සරණය:
3 ... ... 2 සරණගමනය:
5 ... ... 3 සරණගමනවිභාගය:
7 ... ... 4 සරණගමන ඵලය:
21 ... ... 5 සරණකෙලසීමය:
,, ... ... 6 සරණභෙදය:
22 ... ... 7 ප්‍රතිග්‍රහණ ප්‍රශ්නය:
29 ... ... 8 සර්වඥතාඥනප්‍රශ්නය.
31 ... ... 9 ප්‍රාණඝාතය:
37 ... .. 10 අදත්තාදානය:
48 ...11 කාමමිථ්‍යාචාරය:
52 ... ...12 මුසාවාදය:
55 .. ...13 පෛශුන්‍යය:
58 ... ...14 පරුෂවචනය:
60 ... ...15 සම්ඵප්‍රලාපය:
63 ... ...16 අභිධ්‍යාවය:
66 ... ...17 ව්‍යාපාදය:
67 ... ...18 මිථ්‍යාදෘෂ්ටිය:
69 ... ...19 නොකටයුතු කර්මකෙලසයෝ:
70 ... ...20 නොපැමිණියයුතුඅගතිකාරණ.
71 ... ...21 වස්තුවිනාශයට නිධිකාරණ:
76 ... ...22 සෙවනය නොකටයුතු අමිත්‍රයෝ:
77 ... ...23 සෙවනය කටයුතු මිත්‍රයෝ:
78 ... ...24 ආරක්‍ෂා කටයුතු සදිශාවෝ:
79 ... ... ,, මවුපියන්ට දරුවන් විසින් කටයුතු පරොපකාරනම්:
80 ... ... ,, ගුරුවරයින්ට ශිෂ්‍යයින් විසින් කටයුතු පරොපකාර නම්:
81 ... ... ,, ගුරුවරයින්විසින් ගොලයින්ට කටයුතු පරොපකාරනම්:

Hosted by Google

පිටේ.
82 ... ... ,, ස්වාමිපුරුෂයාවිසින් ස්ත්‍රීට කටයුතු ප
චොපකාර නම්:
,, ... ... ,, ස්ත්‍රී විසින් ස්වාමියාහට කටයුතු පචො
පකාර නම්:
83 ... ... ,, මිත්‍රයන් සහ අමාත්‍යයන්ට කටයුතු ප
චොපකාර නම්.
,, ... ... ,, මිත්‍රයන් සහ මූලාදෑනින් විසින් සෙසු
අයට කටයුතු පචොපකාර නම්:
84 ... ... ,, දසකම්කරු පුරුෂාදීන්ට ස්වාමියාවි
සින් කටයුතු පචොපකාර නම්:
85 ... ... ,, දැසිදැස් කම්කරු ආදීන් විසින් ස්වාමි
යාහට කටයුතු පචොපකාර නම්:
,, ... ... ,, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ප්‍රත්‍යදායකයන්
විසින් කටයුතු පචොපකාර නම්:
86 ... ... ,, ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් ප්‍රත්‍යදායක
කාවරුන්ට කටයුතු උපකාර සය නම්:
88 ... ...25 වස්තුව ප්‍රයොජන ගන්නා විධිය:
89 ... ...26 ස්ත්‍රීන්ගේ සහපත් පැවැත්ම:
91 ... ...27 මෙලො සැපදුක් ලැබීම:
93 ... ...28 ශීලවිභාගය:
93 ... ...29 සත්වයින්ගේ පිරිසිදුවීම:

Hosted by Google

## ශුද්ධි පත්‍රය.

| පිට. | පේළි | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 3 | 1 | කෙරෙත් | කෙරෙහි, |
| ,, | 7 | සනාදීන් | සී, යනාදීන්, |
| ,, | 8 | කෙරෙත් | කෙරෙහි, |
| 5 | 31 | භාවූයෙන් | භාවූපගමන, |
| 6 | 8 | අනිච්චසී | අනිච්චසී කියාහෝ නමස්කාර පාඨය ප මණක් කියා වැඳී මෙත්හෝ සරණ ග නවේ: |
| ,, | 18 | වැඳීමසතර | සතරා |
| ,, | 22 | අනාජ්ඣ | අනාජ්ඣයකුද්‍ද, |
| 7 | 8 | සලකාවළිද | සලකාවාරත්‍රයෙන් |
| ,, | 21 | දුක්‍ෂයකිරිම | දුක්ඛක්‍ෂයකිරිම, |
| 10 | 17 | භනානං | භනානං, |
| 13 | 8 | නෙම්මාණරතී | නිම්මාණරතී, |
| 14 | 4 | සම්පත | සම්පත්ඇති, |
| ,, | 11 | ආදිත්නිසා | ආදිත්ගෙන්වන්නාවූ |
| 15 | 8 | කළාභ | කෙලේශ, |
| ,, | 19 | ගර්භනිවූ | ගර්භිණිවූ, |
| 17 | 7 | කප්පං | කම්මං, |
| ,, | 11 | සුතුදැද | සුතුක්‍රියාද, |
| ,, | 14 | කරන්නානට | කරන්නාවූන්ට, |
| 20 | 10 | පළමුවැනි සොවාන් | සොවන්, |
| 21 | 26 | ජම්වානතාදි | ජම්මනතරාදී, |
| 25 | 14 | අනුපදිසෙස පරිනිර්වාණ | අනුපධිසෙසනිර්වාණ |
| 28 | 5 | පෙරජාතිකල | පෙරජාතියෙහිකල, |
| 31 | 30 | විධවේ | විවිධවෙ, |
| 33 | 10 | විසාල්හිආදි | විසාල්ආදි, |
| 34 | 22 | සාවස | සවස, |
| ,, | 31 | ආගනතුකයෝ | ආගනතුකයෝ |
| 37 | 8 | ආකාශගතවූවිද | ආකාශගතවිද, |

Hosted by Google

| පිට. | පේළිය. | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| ,, | 10 | ප්‍රවිෂ්‍ටවූවද | ප්‍රවිෂ්‍ටවීද, |
| 88 | 8 | කියනලද් | කියනලද්දේශව, |
| 89 | 18 | සාමිනා | ස්වාමිනු, |
| ,, | 14 | එසුබඳද | ඊසුබද්දද, |
| ,, | 16 | ගයතො නම් | ගත්තො නම් |
| 40 | 16 | එපමණකින් යතුඅඩි කයි | |
| ,, | 17 | නොදෙක | නොදැක, |
| 44 | 10 | අසැවි | අසත්වා, |
| 45 | 2 | නෑරියේමය | නෑරියෝමය, |
| ,, | 13 | ගියෝ | ගියේ, |
| 46 | 17 | එසුබදවාපුව | සුසුවයවාපුව, |
| ,, | 26 | ඔවුන්ගේ | ඔහුගේ, |
| 48 | 7 | මෛථුන | මෙථුන, |
| 57 | 8 | මෙවනය | සෙවනය, |
| ,, | 17 | රථාවාගති | රථාවාහනීය: |
| 59 | 19 | බුංසනය කෙරේ | ධ්වංසනයකෙරෙති, |
| ,, | ,, | ගහනීකෙරේ | ගහනීකෙරෙති, |
| ,, | 14 | පහරදේ | පහරදෙති, |
| ,, | ,, | අක්‍රොෂකෙරේ | අක්‍රොසකෙරෙති, |
| ,, | 22 | ගැල් | ගැල්, |
| | | ,, | සෙසුතැන්ද මෙසේද තයුතු, |
| 60 | 28 | සතැටුවූයේයයි | තුටුවූයේයයි, |
| 68 | 80 | තුවණමෙනොයාබලායතුද | |
| 64 | 1 | ඔවුන්ගේරැස්කිරීමද යන්නලහටගෙදියයුතු | |
| 66 | 22 | නොපෙරළියාවූ | නොපෙරළියාවූ, |
| 68 | 18 | යථාසිදං | යථසිදං, |
| 70 | 20 | ති | වැඩිවිතිබේ, |
| 74 | 10 | සරණසත්‍රියක් | සත්‍රියක් සරණ; |
| 75 | 21 | සතියක් | සතිසක්, |
| ,, | 27 | එතෙජ | එතෙජ, |

Hosted by Google

| පිට | පේළිය | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 76 | 27 | අපයසහාය | අපායසහාය, |
| 82 | ,, | තමන්ගේ යහ | තමාගේ විශයුතු, |
| 88 | 31 | සාපතෙය්‍ය | සාපතෙය්‍යං, |
| 84 | 9 | බුණුපුරැ | මුණුපුරැ. |
| 101 | 1 | ඇඬිම් | හැනැවිම්. |
| ,, | 28 | අයමෙම | අයමේව, |
| 94 | 80 | කතසස | කාතසස, |
| ,, | 85 | නාහයථාභිසසතෙකධා | යථාභිනාහසසතෙකධා |

1—2: පොම්බදෙක ශුඩකාරන්ට තෙලබූනබැවින් සමහරතැන් මද මද වැරදිවලින් යුක්තව තිබෙති ඊට පඬුවෝ අසතුටු නොවෙත්වා:

Hosted by Google

Hosted by Google

# ජිනධර්මවිකාශනීය.

සුබුද්ධ සම්බොධි සුරසෙණාදිතං
විසුද්ධ සද්ධම්ම මිසුද්ධසඤ්චයං
පබුද්ධවෙණෙය්‍ය සරොජපනාතිකං
සුබුද්ධසබ්බඤ්ඤු දිවාපතිං නමෙ.

සර්වලොක ශිවංකර ත්‍රෛලොකාචාය්‍ය සම්‍යක් සම්බුද්ධ සර්වඥපදප්‍රාප්ත අප භාග්‍යවතුන් වහන්සේ විසින් සියළු ලෝවැසියන් කෙරෙහි පතළ මහාකරුණාගුණයෙන් දෙලෝ වැඩ පිණිස වදාළ, හිතොපදෙශ ධර්මයන් අතුරෙන් සරණය, සරණ ගමනය, සරණගමන විභාගය, සරණ ගමන ඵලය, සරණ කෙලෙසීමය, සරණ භෙදය, යනමේ සරණ ශීල විභාගයෝද, ප්‍රතිග්‍රහණ ප්‍රශ්නය, සර්වඥතාඥාන ප්‍රශ්නය, යනමේ ප්‍රශ්නයෝද, ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, යන කායදුශ්චරිතයද, මෘෂාවාදය, පෛශුන්‍යය, පරුෂවචනය, සම්ඵප්‍රලාපය, යන වාක් දුශ්චරිතයද, අභිධ්‍යාය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය, යන මනො දුශ්චරිතයද, නොකටයුතු කර්ම කෙලශයෝද, නොපැමිණියයුතු අගති කාරණද වස්තුවිභාගයට නිසි කාරණද, සෙවනය නොකටයුතු අමිත්‍රයොද, සෙවනය කටයුතු මිත්‍රයොද, ආරක්ෂා කටයුතු සදිශාවෝද, වස්තුව ප්‍රයොජනගන්නා විධියද, ස්ත්‍රීන්විසින් තමන්ගෙයි කටයුතු ධර්මයෝද. මේ ලෝසැපදුක් ලැබෙණ ක්‍රමයද, ශීලවිභාගයද, සත්වයින්ගේ පිරිසිදුවීමද, යනමේ එක්තිස් වැදෑරුම්වූ ධර්මකොට්ඨාසයෝ සුඛාව බොධය පිණිස එක දෙශ මාත්‍රයක් මෙහි දක්වනු ලැබෙති.

Hosted by Google

## 1 සරණය:

බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි, යනු තුන්සරණයයි, මෙම තුන්සරණයට අයිති බුද්ධ ධර්ම සංඝ යන වස්තුත්‍රය දෙව්මිනිස් සහිත සියළු ලෝවාසීන්ට රත්නයෝනම්වෙති මෙහිබුද්ධරත්නයනම්: ශ්‍රේයශ්‍රීදීපනී,; යෙහි දක්වනලද ක්‍රමයෙන් සමත්‍රිංශත් පාරමී ධර්මයන් පුරා ලොව්තුරාබුදුව නවඅරහාදි බුද්ධගුණෝපෙත භාග්‍යවත් අභිනීත් සම්‍යක් සම්බුද්ධවූ සියල්ලදත් උත්තමයන්වහන්සේය, ධර්ම රත්නයනම්, උන්වහන්සේ විසින් දෙව්මිනිස් සහිත ලොකයාහට ස්වර්ගාපවර්ග මාර්ග දක්වා දෙශනාකරවදාළ සපර්යාප්තික නවලොකොත්තර ශ්‍රී සද්ධර්මය, සංඝ රත්නයනම්, දහම්වූ පරිද්දෙන් පිළිපදිනා නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රවූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සංඝයාය, කවරහෙයකින් මේවස්තුත්‍රය රත්නවෙද්දයත්—

1

චිත්තීකතං මහග්ඝංච අතුලං දුල්ලභදස්සනං
අනොමසත්තපරිභොගං රතනං තෙනපවුච්චති.

යම් වස්තුවක් සිත්අලවාද, මහත් අගැයිද, අසමානද, දුර්ලභ දැකුම් ඇත්තේද, අලාමක සත්වයන්ගේ පරිභොගයවේද එසේ හෙයින් ඒ වස්තුව රත්නයයි කියනු ලැබේ—

මෙසේ සිත් ඇලවීම් ආදී වශයෙන් බුද්ධාදී වස්තුත්‍රය රත්න නම් වෙති—

මේ තුනුරුවන් කවර හෙයකින් සත්වයන්ට සරණවෙද්ද, සීතොෂ්ණාදිය නසන්නෙන් ත්‍රාණය සරණය යන නම් ලබන පරිද්දෙන්ම බුද්ධාදී තුනුරුවන් සරණ ගතයන්ගේ භය තැතිගැණීම් දුක් අපායගමන් රාගාදී කෙලෙස් නසන හෙයින්ද සත්වයන්ට හිත සැප එළවීමෙන් සසර දුකින් එතරකර සැනසිලි දෙන හෙයින්ද සරණ නම් වෙති—

Hosted by Google

## 2 සරණගමනය

තවද මෙම තුනුරුවන් කෙරෙන් සියළු සත්වයන්ට අග්‍ර හෙයින් පලමුකොට බුද්ධ රත්නයද උන්වහන්සේගෙන් හටගත් බැවින් දෙවෙනි කොට ධර්මරත්නයද, එම ධර්මය ධරණ හෙයින් තුන්වැනිව සංඝරත්නයද දක්වන ලදී, එ හෙයින් කීයේ මැසි~~~ ලොක සෙට්ඨතා පුණ්ණචන්දොවිය බුද්ධො, යතාදීන් සියළු ලොකයා කෙරෙන් ශ්‍රෙෂ්ඨ බැවින් බුද්ධරත්නය පූර්ණ චන්ද්‍රයා වැන්න, ධර්මරත්නය සඳරැස් සමූහයා වැන්න, සද්ධර්ම නැමති සඳරැසින් ලොකොත්තර සැපතට පැමිණි සංඝ රත්නය, සඳරැසින් අහ්ලාදිත ලොකයාවැන්න, බුද්ධරත්නය තරුණ සූර්ය්‍යයා වැන්න, ධර්මරත්නය හිරුරැස් සමූහය වැන්න, සද්ධර්ම නැමති හිරු රැසින් දුරලන මොහාන්ධකාර ඇති සංඝරත්නය, හිරුරැසින් අඳුරුවිදහා ආලොකමත් ලොකයා වැන්න, කෙලෙස් වනදැවීම කාරණ හෙයින් බුද්ධරත්නය ලැව්ගිනිලන පුරුෂොත්තම කෙනෙක් වැන්න, සත්වයින්ගේ කෙලෙස්වන දවන හෙයින් ධර්මරත්නය වනදවන ගින්නක්වැන්න, දවනලද කෙලෙස් ඇතිබැවින් පින්කෙත්වූ සංඝරත්නය වනදහනයෙන් ශුද්ධවූ ක්ෂෙත්‍ර භූමියක් වැන්න, බුද්ධරත්නය මහත් මේඝයක්වැන්න, ධර්මරත්නය වෘෂ්ටිජලයක් වැන්න, සංසිඳුනු කෙලෙස් නැමති රජස් ඇති සංඝරත්නයතෙම, වෘෂ්ටිනිපාතයෙන් සංසිඳුනු රජස් ඇති ජනපදය වැන්න, බුද්ධරත්නය යහපත් අශ්වාචාරි කෙනෙක් වැන්න, ධර්මරත්නය අජානීය අශ්වයන් හික්මවන උපාය වැන්න, සංඝරත්නය සුවිනීත අජානීය අශ්වසමූහයාවැන්න, බුද්ධරත්නය මිසදිටු නැමති හුල්උදුරණ සල්ලකත්ත වෛද්‍යාචාර්‍ය්‍ය කෙනෙක් වැන්න, ධර්මරත්නය මිසදිටු නැමති

හුල්උදුරණ උපායක් වැන්න සංඝරත්නය උපුටා හරණලද මිසදිටුනැමති හුල්ඇතිජනසමූහයා වැන්න, බුද්ධරත්නය යහපත් මාර්ගදෙශක කෙනෙක් වැන්න, ධර්මරත්නය ක්ෂෙම්වූනිරුපද්‍ර භූමියක් වැන්නසංඝරත්නය නිරුපද්‍ර මාර්ගයටපැමිණිජනසමූහයාවැන්න,සංසාර සාගරයෙන්එතරකරවනහෙයින් බුද්ධරත්නය යහපත් නාවික පුරුෂයෙක් වැන්න,ධර්මරත්නය නැවක්වැන්න,සංඝරත්නය සංසාර සාගරයෙන් තීරප්‍රාප්ත ජනසමූහයා වැන්න, බුද්ධරත්නය හිමාල පර්වතරාජයා වැන්න, ධර්මරත්නය හිමාලපර්වතයෙන් හටගත් ඖෂධ වැන්න, සංඝරත්නය ඖෂධ පානයෙන් කෙලෙස් නැමති-ආමවිරහිත ජනසමූහයා වැන්න; බුද්ධරත්නය සප්තාර්‍ය්‍යධනය දෙනහෙයින් ධනාධිපතිකෙනෙක්වැන්න, ධර්මරත්නය ඔහුගෙන් ප්‍රභවධනය වැන්න, ලබනලද ආර්‍ය්‍ය ධනඇති සංඝරත්නය ධනවත් ජනසමූහයාවැන්න, බුද්ධරත්නය රුවන් ආකරයක් වැන්න, ධර්මරත්නය එහි උපන් මිණිරුවන් වැන්න, සංඝරත්නය අගම් නැමති මිණිරුවන්ගත් ජනසමූහයා වැන්න, බුද්ධරත්නය රජකුමරුවන් සරහන පුරුෂකෙනෙක් වැන්න, ධර්මරත්නය සරහන ආභරණයන්වැන්න, අහම් නැමති ආභරණයෙන් සැරසුනු සංඝරත්නය අලංකාරවත් රාජකුමාර සමූහයා වැන්න, අහම් නැමති දායාද දෙන හෙයින් බුද්ධරත්නය පියතර පියාන කෙනෙක් වැන්න, ධර්මරත්නය දායාද වැන්න, අගම් නැමති දායාද හැරගත් සංඝරත්නය දායාද ලැබූ පුත්‍රසමූහයාවැන්න, මෙසේ සියළු ලෝකයාහට මේ මේ ලෙසින් හිත සැප එලවීමට නාථභූත හෙයින් පලමු කොට බුද්ධරත්නයද, ඊයළුව සත්වයන්ට හිතසැප එලවීමට වස්තුවක් බැවින් දෙවෙනිකොට ධර්මරත්නයද, හිත සැප බවට පැමිණි පුද්ගල සමූහයා බැවින් තුන්වෙනිකොට සංඝරත්නයද, යනමේ සම්වාය රත්නවූ තුනුරුවන්කො

රෙහි ශ්‍රද්ධා මූලිකව ප්‍රසන්නසිත ඉපදවීම සරණ ගමන් නම්—

### 3 සරණගමන විභාගය.

ලොකොත්තර සරණගමනය, ලෞකික සරණ ගමනයයි, කියා ද්විප්‍රකාරවූයේ සරණගමන විභාග නම්— එයින් ලොකොත්තර සරණ ගමනය නම් දක්නාලද චතුස්සත්‍යය ඇත්තාහුගෙ සොවාන් ආදී මාර්ග ඵලයන්ට පැමිණි ඇසිල්ලෙහි සරණගමනය කිළිටිවූකරණ කෙලෙසුන් මුල්සිඳිනිවන අරමුණුවීමෙන් තුන්රුවන් ගරුකොට අචල ශ්‍රද්ධාවෙන් සිඳවින්නාවූ සරණ ගමනයයි—

ලෞකික සරණ ගමනය නම්, සරණ සීලය කිළිටිවූකරන්නාවූ කෙලෙසුන් හැඟීමට අවකාශනොදී යටකර ගැණීමෙන් රත්නත්‍රයෙහි ගුණ අරමුණු කොට පැහැදීම මුල්ව හටගන්නාවූ පෘථග්ජනයන්ගේ සරණ ගමනයයි—

මෙසේ සිඳවන ලෞකික සරණ ගමනය තෙම ආත්ම සන්නිය්‍යාතන සරණ ගමනය, තත්පරායනසරණගමනය, ශිෂ්‍යභාවූපගමනසරණගමනය, ප්‍රණිපාතසරණ ගමනයයි කියා සතරාකාරවේ, මෙහි ආත්මය පිදීමෙන් යන සරණයනම්, අද පටන් මාගේ ආත්මය බුද්ධරත්නයට පාවාදෙමි ධර්මරත්නයට මාගේ ආත්මය පාවාදෙමි, සංඝරත්නයට මාගේ ආත්මය පාවාදෙමි, මම එසේවූ බව දනිත්වායි මෙසේ රත්නත්‍රයට ආත්මය පිදීම් වසයෙන් සරණයාමයි— තත්පරායනයෙන් පිහිටන සරණ ගමනයනම් අදපටන් බුද්ධරත්නය පිහිටකොට ඇත්තෙමි ධර්මරත්නය පිහිටකොට ඇත්තෙමි, සංඝරත්නය පිහිටකොට ඇත්තෙමි, මා මෙසේවූ බව දනිත්වායි රත්නත්‍රයසරණකොට යාමියි— ශිෂ්‍යභාවූපයන් යන සරණ ගමනයනම්, අද පටන් මම

Hosted by Google

බුදුරජාණන්වහන්සේගේශිෂ්‍යයෙමි. ධම්මරත්න
යාගේ ශිෂ්‍යයෙමි, සංඝරත්නයාගේ ශිෂ්‍යයෙමි,
මා මෙසේවූබව දනිත්වායි මෙසේ තමන් ශිෂ්‍ය බව
ට පැමිණ සරණයැමයි~~~~

ප්‍රණිපාත සරණගමනයනම් අදපටන් මාගේ
වැඳීම හුනස්නෙන් නැගී සිටීම ඇඳිලි බැඳීම සාමී
චිකර්ම කිරීම මේ ආදී සියළුම බුහුමන් කිරීම ර
ත්නත්‍රයට කෙරෙමි මා මෙසේ බව දනිත්වායි
මේ ප්‍රණිපාතයෙන් සරණයැමයි~~~~ මෙහි විභා
ග සරණත්‍රය දීපනියෙන් ප්‍රකාශිතයි~~~~ මේ
සතරාකාර සරණ ගමනයන්අතුරෙන් මෙම ප්‍රණි
පාත සරණ ගමනය ඥාතිභය ආචාර්‍ය්‍ය දක්ෂිණෙ
ය්‍ය ප්‍රණිපාතයයිකියා වැඳීම සතර වැදෑරුම්වේ
මෙසින් දක්ෂිණෙය්‍ය ප්‍රණිපාතය හැර සෙසු ත්‍රිවි
ධ ප්‍රණිපාතයන්ගෙන් සරණසීලය නොපිහිටයි
හේ කෙසේද ශාක්‍ය වංශයෙහි කෙනෙක් හෝ
කෝලිය වංශයෙහි කෙනෙක්හෝ බුදුරජාණන්
වහන්සේ අපගේ නෑයෙක්යයි නෑකම උදෙසා
වඳීද ඔහුට සරණසීලය නොපිහිටයි, යමෙක්
තෙම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ රජු
න්ගෙන් වැඳුම් පිදුම් ලබන්නාවූ මහානුභා සම්
පන්න කෙනෙක අපි නොවැන්දමෝනම් අනර්ථ
කෙරෙයි යන භයින් වඳීද ඔහුටද සරණ සීලය
නොපිහිටයි, යමෙක් තෙම බුදුරජාණන් වහන්
සේ බෝධිසත්ව කාලයෙහි උන්වහන්සේගෙන්
ඉගනගත් යමක් සලකාහෝ බුදුඋනායින් පසු
වවත් උන්වහන්සේගෙන් යම් අනුශාසනාවක්
ඉගෙන මූන්වහන්සේ මාගේ ගුරුවරයයි ගුරු
කම උදෙසාහෝ වඳීද ඔහුටද සරණසීලය නො
පිහිටයි, යමෙක් තෙම මේ බුදුරජාණන් වහන්සේ
නම් ලෝකයෙහි අග්‍ර දක්ෂිණෙය්‍ය උත්තමයන් ව
හන්සේය හෙවත් පරලෝ උදෙසා කරණ වැඳීම්
පිදීම් ආදී සියළුම පූජාදිය පිලිගැන්මට සුදුසුයයි

Hosted by Google

සිතා· උන්වහන්සේගේ නවඅරහාදී උත්තම ගුණයෝ සලකා වදිද, එසේ වැඳීමෙන් පමණක් සරණ සීලය පිහිටයි—මෙසේ සරණසීලයෙහි පිහිටි බුද්ධාගම්කාර තෙමේ අන්‍ය තීර්ථකයෙක්හට හෙවත් බුද්ධාගමෙන් පිටත් මිථ්‍යාදෘෂ්ටි ගුරුවරයෙකුට නොහොත් ඔවුන් කෙරෙහි පැවිදිවූ යමෙකුට නෑකමක් සලකා වදිද ඔහුගේ සරණ සීලය නොබිඳෙ, පැවිදිනුවූ නෑයෙක්හට වැඳීමත් එසේමය, රජ රජ්මහ අමාත්‍යාදීන්ට නොවැන්දහොත් ඔවුන් හිංසාපීඩාදී අනර්ථයකුදු පමුනුවති යන භයින් වදිද ඔහුගේ සරණ සීලයත් නොබිඳෙ, තවද යම් සරණ ගතයෙක් තෙමෙ අන්‍යතීර්ථක මිසදිටුවන්කෙරෙන් යම් කිසි ශිල්ප ශාස්ත්‍රාදියක්ඉගෙන ඒ ගුරුකම් සලකා වැන්දේද ඔහුගේද සරණසීලය නොබිඳේ, මේ කියනලද ක්‍රමයෙන් සරණගමණ විභාගවූ සරණසීලයෙහි ප්‍රභෙද දැනගතයුතු—

---

## 4 සරණගමන ඵලය.

ලෝකොත්තර සරණගමනයෙහි ඵලය, විපාකය ආනිසංසයයි කියා විවිධවේ එහි සතර ශ්‍රාමාණ්‍යඵලයෝ විපාක පලනම් වෙති, සියළුම සංසාරදුක්ෂයකිරීම ආනිසංස ඵලනම්වේ, තවද ලෝකොත්තර සරණගමණයෙන් යුත් පුද්ගල තෙම කිසි කලෙකත් කිසිම සංස්කාර ධර්මයක් නිත්‍ය-සැප ආත්මවසයෙන් නොගන්නේය, මාතෘ ඝාතක, පිතෘ ඝාතක, අරහන්ත ඝාතක, ලොහිතුප්පාදක, සංඝ භෙදකයයි කියනලද ආනන්තරිය කර්මයන්ද නොකරන්නේයි, මේද ලෝකොත්තර සරණ ගමනයාගේ ආනිසංස ඵලනම්වේ—එබව මෙසේද දක්වනලදී—පෙර කසුප් බුදුන් දවස එක්තරා කුලපුත්‍රයෙක් එම ශාසනයෙහි පැවිදිව එක් උපාසකයෙක් විසින් කරවන

Hosted by Google

ලද ආරාමයක නේවාසිකව වාසය කරන්නේය
එසමයෙහි රූක්ෂචීවරධර එක් රහත්තෙර කෙ
නෙකුන් වහන්සේ හිසකෙස් හරවා ගන්නා පි
ණිස අරණ්‍යයෙන් නික්ම ගමට එන්නේ, ඒ
උපාසකතෙමේ තෙරුන්වහන්සේ දැක වැඩම
වන ඉරියව්වෙහි පැහැදී කපුවාලවා හිස කෙස්
දැලිරවුල් කපවා ප්‍රණීත ආහාර වළඳවා සහ
පත් සිවුරු පිළිගන්වා සැප සයනය පිණිස විහාර
යෙහි සෙනසුන් තිබ්බවා සාමින්වහන්ස මෙහි
විසුව මැනවයි කියා තමන්ගේ ආරාමයෙහි වැස්
විය, ඒ දුටු ආවාසික භික්‍ෂුතෙම ඊෂ්‍යාමාශ්චර්‍ය්‍යය
යෙන් මඩනාලද සිත්ඇතිව ඒ රහත් තෙරුන්
වහන්සේ අරභයා කියන්නේ ඇවැත්නි මේතෙ
ලඹියාගේ බත් අනුභවයටවඩා අසුචිකෑම ඉතා
උතුම්,මේ නැගැම්යා විසින් කරණ කොසො රෙහ
නයට වඩා තල්ඇටයකින් කේසසන් ඉගිලිම
ඉතා උතුම්, උපාසකයා විසින් දුන් වස්ත්‍ර හැඳීම
ට වඩා නග්නව හැසිරීම ඉතා උතුම්, මොහු වි
සින් දෙනලද ඇඳේ සයනය කරණවාට වඩා බිම
සයනය ඉතා උතුමැයි කීහ.......මෙසේ රහතන්
වහන්සේ උදෙසා එරුසබස් කීමෙන් ආයෙඝී
පවාද පාපය ඒ භික්‍ෂුවට සිඩවූ බැවින් දෘෂ්ටධර්ම
වේද්‍ය කර්ම්වශයෙන් එකනෙහිම ඔහු වැසිගිලි
යටවැද කිරිබත් වඩන්නකු මෙන් අතින් අසූ
චිගෙණ බඩපුරා කා මූත්‍රද පානය කළේය.......
රහතන්ට අක්‍රොශකිරිමනම්වූ ආයෙඝීපවාද අ
කුසලය කරණකොටගෙන මෙබඳු කටුක විපා
ක ඉහාත්මයෙහිම දෙනබව ඇසූ පින්වතුන් විසි
න් ඒ සම්‍රාණ ගුණ නැති හෙයින් දෘෂ්ට ධර්මවෙ
ද්‍යය නොවෙතත් පරලෝ නරකාදිඅනන්තදුක්
ලැබෙන බැවින් දෙමව්පියා, ගුරුවර, මහණ බමු
ණන්ආදි ගුණවතුන්ට නින්‍දාගර්හා නොකොට ඒ
රුසබස් නොකියා ඔවුන් වෙත මෙත් සිත් පහල
කිරීමෙන් ඉවසන සුළුව වාසය කටයුතු.......නා

Hosted by Google

වද ආක්ෂෙපවාදකළ ඒ භික්ෂුව මේනියායෙන් දිවි හිමියෙන්සිට මරණින්මතු අවීචියෙහි ඉපිද බුද්ධාන්තරයක්ම මහදුක්විඳ එයින් චුතව අපබුදුන්'දවස රජගහනුවර සමීපයෙහි ආඪ්‍ය සම්පත් ඇති කුලගෘහයක ඉපද ඔහු ලදරුකාල යෙහිම නහසිරි' ආදී යමක් පොවනු ලබන්නේ ඒද නොබී මලමූත්‍රම බොන්නේය බත්කවනුලබන්නේ ඒද නොකා අශුචිම කන්නේය භූමියෙහිම සයනය කරන්නේය නග්නවම හැසිරෙන්නේය මෙසේ මොහු මලමූත්‍රාහාර යෙන්ම. වැඩෙමින් වයස් පැමිණි කල්හිද මලමූත්‍රම අනුභව කරමින් නග්නව භූමියෙහිම සයනය කරන්නේය ඉක්බිති මවුපියෝ ඔහු එයින් වලක්වන්ට නොහැකිව මොහු අපගේ කුලයට සුදුසු නොවේ ආජීවකයින්ටම සුදුසුයයි කියා නෑයන් විසින් කුලගෘහයෙන් පිටපත්කරණලදුව තල්ගෙඩියෙන් හිසරැවුල් උපුටා නග්නප්‍රව්‍රජ්‍යාවට පැමිණියේ, දෙවනු අජීවකයන්විසින් දහරණලදුව මලපහරන්නාවූ එක්පිට්සි පාසානයක් පිටට පැමිණ රාත්‍රි අසුචිඅනුභවකොට දහවල් එක්පයින් සිට වාතය අනුභව කරන්නාක්මෙන් මුඛය ඇරගෙණ සිටින්නේය, ආරාධනාද නොඉවසන්නේය පින් කැමැත්තන් විසින් දෙනලද ආහාර ඔවුන්ට වැඩ පිණිසයයි කියා මසක්ට වරක් බැගින් කුසපත් අගින්ගෙන දිවයින් ලොවින්නේය——

මෙසේ උග්‍රතපස් රකිම්යි මනුෂ්‍යයින් විචාකොට රාත්‍රි අසුචිපහරණතැන් කරගොස් නොත්වූ අසුචියෙහි ප්‍රාණීන් ඇතැයි සිතා නොකා වියලිඅසුචිම කන්නේය, මේ ක්‍රමයෙන් මොහුට පස්පනස් අවුරුද්දක් ඉක්මගියාහුය—— මෙම ජම්බුකාජීවකානෙම තෘෂ්ණ හැත්තෙක, මහත් තපස් ඇත්තෙක, උතුම් අල්පෙච්ඡ තාවයෙන් යුක්තයයි මහජන සමූහයා රැවටී ඔහුට නැමී, යටහත්ව ඇඳුම් පිදීම් ආදිය කරන්නේය—— ඉක්බිති

Hosted by Google

තෙත් අපහාග්‍යවතුන් වහන්සේ ලොව පහල වූ පසු, එක් දිනක් මහකරුණා ගුණයෙන් ලොව බලා වදාරණ සේක්, ජම්බුකා ජීවකයින්ට රහත්වීමට හේතු සම්පත්ඇති බවදැක වදාර හුදකලාවම ඔහු සමීපයට වැඩමවා ධර්ම්මදේශනා කොට සොවාන්ඵලයෙහි පිහිටවා එහි භික්ෂුභාවයෙන්පැවිදි උපසම්පදාකොට අර්හත්ඵලයෙහි පිහිටවූසේක — කසුප් බුදුන් දවස විසිදහසක් අව්රුදු ශ්‍රමණධර්ම්මය රැක්කාවූ ආනිසංසයෙන් රහත්වූ බවද ආයෙෂිප වාද අකුසලයෙන් මෙම අනාත්ම ආත්මයෙහි පවා නග්න ප්‍රව්‍රජ්‍යාවෙන් දුක්වින්ද බවද දතයුතු — තවද රහත්වූ මෙම් ජම්බුකා ජීවකයන් පිරිනිවන් පානා දිනයෙහි රැස්වූ සිව්පිරිස්මැද ප්‍රීතිවාක්‍ය වසයෙන් දක්වනසේක් —

2 පච පඤ්ඤ සවස්සානි රජෝජල්ලම ධාරයිං
හුංජනෙතා මාසිකං භත්තං කෙසමස්සුංඅලොචයිං —

3 එකපාදෙන අට්ඨාසිං ආසනං පරිවජ්ජයිං
සුක්ඛගුථානිචඛාදිං උද්දෙසංච නසාදයිං —

4 එතාදිසං කරිත්වාන බහුං දුග්ගති ගාමිනං
වුය්හමානො මහොඝෙන බුද්ධං සරණ මාගමිං.

5 සරණාගමනං පස්ස ධම්මස්සච සුධම්මතං
තිස්සොවිජ්ජා අනුප්පත්තො කතං බුද්ධස්ස සාසනනති —

පස්පනස් අවුරුද්දක් මුළුල්ලෙහි රජස්මල දැරැයෙමි, මසකට වරක් බත් අනුභව කෙරෙමි, හිසකෙස් දැලිරැවුල් උදුරා හැරියෙමි, එක් පාදයකින් සිටියෙමි, අසුන්වල හිඳීම හැරියෙමි, වියළ අසූචිද කෑව්, උද්දෙසීම් හෙවත් ආරාධනාද නොඉවසුයෙමි, දුගති ගාමිවූ මෙවැනි බොහෝ අකුසල්කොටකාමොඝාදී මහොඝයෙන් සංසාර සාගරයට ගෙනයනු ලබන්නාවූ මම බුදුන්, දහම්

Hosted by Google

සංඝ යන, තුන්සරණය ගත්තෙම්. එපමණකින්
ත්‍රිවිද්‍යාවටද පැමිණියෙම්, බුද්ධරජාණන්වහන්සේ
ගේ අවවාදයද මා විසින් කරණලද්දේය, ලො
කොත්තර සරණ ගමනයාගේ මහත්තාඞයබල
වසී ප්‍රකාශකළ සේක……මේ ලොකොත්තර
සරණ ගමනයෙහි ආනිසංස ඵලනම් වේ……
ලෞකික සරණ ගමනඵල වනාහි භව සම්පත්භා
ගෝග සම්පත්ද සිඩවන්නේය, ඒකෙසේද……

6 යෙකෙචි බුධං සරණං ගතාසෙන තෙගමිස්ස
නති අපායං
පහායමානුසං දෙහං දෙවකායං පරිපූරෙස්ස
නති……

යම් කිසිවෙක් බුදුන් සරණ ගියෝද ඔවුන් අපා
යට නොයත් ; මනුෂ්‍ය දෙහය හැර දෙව්ලෝඉප
දීමෙන් දෙව නිකායපුර වන්නාහ මෙසේම
යෙකෙචිධම්මං සරණං ගතාසෙ, යෙකෙචිසංඝං
සරණංගතාසෙ සි, ධම්ම සංඝරත්නයන්හිද යොදා
අර්ථ දතයුතු……මෙසිද ලෞකික සරණගමන
යාගේ උපකෙලශයෝ සිඳිමෙන් සරණ ගියෝ
අපායට නොයත්නෝය, සරණ ගමනයෙන් යුක්ත
වූවත් අකුසල් කළෝනම් අපායට යන්නාහුය
එහි දුක්විඳ අනතයෙන් සරණනිසංසය මුල්ව
සසරදුක් කෙලවර කරන්නෝයයි යනු ගාථාවෙ
හි භාවයයි……

අථඛො සක්කො දෙවානමින්දො, අසීතියා දෙ
වතා සහස්සෙහි සද්ධිං……පෙ……දිබ්බෙහිග
න්ධෙහි දිබ්බෙහි පොට්ඨබ්බෙහි……ඉක්බිත්තෙ
න් එක් දිනක් සක්දෙව්, රජතෙම අසූදහසක්දෙ
වියන් සමග ආයුෂ්මත් මුගලන් මහතෙරුන්වහ
න්සේ කරා පැමිණ වැඳ එකත්පස්ව සිටියේය
මෙසේ සිටි සක්දෙව් රජ හට ආයුෂ්මත් මුගලන්
මහතෙරුන් වහන්සේ මේ වචනය වදාළසේක
ශක්‍රදේවෙන්ද්‍රය බුද්ධාදී තුනුරුවන් සරණයැම

Hosted by Google

යහපත තු තුරුවන් සරණ හෙතු කොටගෙන මේ
මනුෂ්‍ය ලොකයෙහි ඇතැම් කෙනෙක් කාබුන්
මරණින්මතු ස්වර්ගලොකයෙහි උපදින්නේය ඔහු
එහි උපන් සෙසු දෙවියන් දසකාරණයකින් අභි
භවනය කෙරෙති, ඒ කවරේද, දිව්‍යමයවූ ආයුෂ
යෙන්ද දිව්‍යමයවූ වර්ණයෙන්ද දිව්‍යමයවූ සැප
තින්ද දිව්‍යමයවූ යසසින්ද දිව්‍යමයවූ අධිපතිකම්
න්ද ඇසට ප්‍රියවූ දිව්‍යමය රූපයෙන්ද කනට ප්‍රියවූ
දිව්‍යමය ශබ්දයෙන්ද නාසයට ප්‍රියවූ දිව්‍යමය සුවඳි
න්ද දිවට මිහිරිවූ දිව්‍යමයරසයෙන්ද ශරීරයටසැ
පවූ දිව්‍යමය පහසින්ද යනමේ දසකාරණයෙන් සෙ
සු දෙවියන් මැඩ පවත්වා සැපවිඳිනාහ....තවද
එක්සමයෙක්හි සනං කුමාර නම් මහාබ්‍රහ්මතෙ
මේ තව්තිසා දෙව්ලොවට අවුත් සුදම්දෙව් සභා
වෙහි සක්දෙව් රජහුගේ ආසනයෙහි දිවපිරිස් පි
රිවරාහිද සරණගමනයාගේ ඵලානිසංස දක්වන
පිණිස මෙසේ කීයේය, එබාපින්වත්නි, යම් කිසි
කෙනෙක් බුදුන් සරණ ගියාහුද දහම් සරණ ගියා
හුද සඟ සරණ ගියාහුද සීලයෙහිද පරිපූරකාරී
වූ ඒ සත්වයෝ කාබුන් මරණින් මතු සමහර කෙ
නෙක් පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ ඒකී භාව
ය වපැමිණෙත් සමහර කෙනෙක් නිර්මාණරති
දෙවියන්ගේද සමහර කෙනෙක් තොෂිත නම් දෙවි
යන්ගේද සමහර කෙනෙක් යාම නම් දෙවියන්ගේ
ද සමහර කෙනෙක් තවුතිසා දෙවියන්ගේද සමහ
ර කෙනෙක් චාතුර්මහාරාජිකා දෙවියන්ගේද, ස
භාවෙහි ඉපිද ගාන්ධර්වනිකාය සම්පූර්ණ කෙරෙ
ත්යයි කීයේය....මෙමසදිව්‍යලොකයෙහි දිවසැ
පවිඳිනා ආයුප්‍රමාණය මිනිස් ගණනින් දක්වනු ලැ
බේ....චාතුර්මහාරාජික දෙවියන්ට අනූලක්ෂය
ක්අවුරුද්දට ආයුසය, තවුතිසාවැසි දෙවියන්ට
තුන්කෙල සැටලක්ෂයක් අවුරුද්දට ආයුසය, යාම
නම් දෙව්ලෝවැසිදෙවියන්ට තුදුස්කෙල සතලිස්
ලක්ෂයක් අවුරද්දට ආයුසය, තුසීපුරවැසි දෙවි

යන්ට සත්පනස්කෙල සැටලක්ෂයක් අවුරුද්දට ආයුසය නිර්මාණරතී දෙව්ලෝ දෙවියන්ට දෙසිය තිස්කෙල සතළිස්ලක්ෂයක් අවුරුද්දට ආයුසය; පරනිර්මිත වසවර්ති දෙව්ලෝ දෙවියන්ට නවසිය එක්විසිකෙල සැටලක්ෂයක් අවුරුද්දට ආයුසය අනන්තර මරණයක් දාවුවෝහම් එහි උපන් සත්ව යෝ මේතාක්කල් ඒ ඒ තැන සැපවිඳ කුසල බල ඇත්තෝ දෙවනු අනුලෝමප්‍රතිලෝම වශයෙන්ද එහි සැප විඳින්නෝය...... තවද අපබුදුන්දවස සැවැත්නුවර බොහෝ සැපත් ඇති සුමන නම් සිටාන කෙනෙක්විය, ඔහුගේ භාර්‍යාතොමෝ සුජම්පතිකා නම් විය, ඔවුන් දෙදෙන සමගිව වසන්නාහු මැනා භාගයෙහි පුත්‍රකෙනෙකුන්හා දියනි කෙනෙක්ද ලදහ, ඉක්බිති ඒ දරුදෙදෙන ලදරුකාලයෙහිම, දෙමාපියන් කාලක්‍රියා කරන්නාහු වැඩිමහළු පුතනුවන් ලඟට කැඳවා පුත්‍රය තොපි නිසිසානයක සල්ස්වාලන්ට අපට නොහැකිවූමනා, එබැවින් මේගෙයි සියළුසම්පත් තෙපි පිමරගෙන තොපගේ මේ බාල නැගනියන් වැඩිවිය වයස් පැමිණි කල්හි ඈට කටයුතු සැලැස්වීමද තොපටම බාරයයි කියා නැගනියන් අතගෙන වැඩිමහළු පුතනුවන් අනාතිබා කුම්හු දෙදෙන කාලක්‍රියා කළාහ...... ඉක්බිති කුමාරයා සැපසේ වැස කල්යාමකින් නැගනියන් සුදුසු කුලයකට සරණ පාවාදී තමාද සමාන කුලයකින් කුමාරිකා කෙනෙකුන් ගෙනවුත් වසන්නාහ, මැනා භාගයෙහි ඒ සිටුකුමාර යන්ගේ නැගනියෝ ගර්භනිව එක් දවසක් ස්වාමිපුරුෂයාහට තමන් බෑනනුවන් දක්නා කැමිති බවකියා කානබොනාදී ආදි සුදුසු පඬුරුත් ගෙන්වාගෙන ස්වාමියාත් සමග ඔවුන් දෙදෙන සැවැත්නුවරට වත්හ, එකල ලෝකාධිපතිවූ අපබුදුරජානන්වහන්සේ සවනක් ඝන බුදුරැශ්මි මාලාවන් අසදිශ විනිදුවමින් භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලදුව සැවැත්නුවරව විහාරයෙන් අංගනකුකාව පිග එන්නාවූ ඒ

අඹු සැමි දෙදෙන රත්ගිරසේ බබලන උත්වහන්සේ දැක පහන් සිතින් පසඟපිහිටුවා වැඳ එකත්පස්ව සිටියාහ.෴ ඉක්බිති බුදුරජාණන්වහන්සේ ඒ දෙමහල්ලන් සෝවාන් වීමට හෙතු සම්පත් නියාදැන ඔවුන් දෙදෙනා සරණසීලයෙහි පිහිටුවා. තොපට යම් කිසි විටක කිසි දුකෙක් උපන්නේවී නම් එකල්හි තථාගතවූ මම සිහි කටයුතුයයි වදාරණසේක෴

7

යංකිංචිභයමුප්පණ්ණං රාජචොරාදි සම්භවං
තදාසරෙය්‍යසම්බුඩං නිවජ්ජෙනාතදුපද්දවං.

රාජ චොර ශස්ත්‍ර ආදීන් නිසා යම් කිසි භයෙක් උපන්නේවී නම් එකල්හි ඒ උපද්‍රවයෙන් කිසි විනාසයක් නොවේවා කැමැත්තහු විසින් ඇඳහිලිඇතිව සම්‍යක් සම්බුඩයන් වහන්සේ සිහි කට යුත්තේය෴

8

යංචෙ උපද්දවංහොති යක්ඛපෙතාදි සම්භවං
තදාසරෙය්‍යසම්බුඩං නිවජ්ජෙනාතදුපද්දවං.

යම් කලෙක යක්‍ෂ ප්‍රෙත පිසාචයන්හා සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස් ආදීන් විසින්ද, හා පොලොන් දුර ළිඹු රුවූ දීඝ ජාතීන්හා ගිනි අවු සුලන් දිය සෙන ආදීන්ද, ශූල හිසරුජා ආදී රොගයෙන් හා, විෂම්වූ, ශීතොෂ්ණාදී ඍතුපෙරලීම් ආදියෙන් වත්නාවූද, යම් කිසි භයෙක් උපද්‍රවයෙක් වීත් නම් එකල්හි ඒ උපද්‍රවය නොකමැත්තහු විසින් ඇඳහිලි ඇතිව සම්‍යක් සම්බුඩයන් වහන්සේ සිහි කටයුත්තේය෴

9

ඡච්චූහාවෙ යදා යුඩං කාරෙය්‍යෙනා භාපිප්නතුහං
සරිතබ්බං තදා බුඩං පරසෙනෙතනාතනාභොජය
නානි෴

ඉඳින් යම් කාලෙක්හි තම හට ජය පතන්නාවූ අනාතිශයෙයතාවෙන් වැඳහෙව පුරුෂු සවිග යුඩක

රත්හාවූ සඬයා විසින්ද එකල්හි පස්මරුන් බිඳ
ජගත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ඇඳහිලි
ඇතිව සිහි කට සුඛ ලත්සෙය.―ඉක්බිති ඔවුන් දෙ
දෙන එතෙපුල් මුදුහෙන් පිළිගෙන සතුටින් පිනා
පයෙන පිහිටුවා වැද අවසර ගෙන ගියෝය.―
ඉක්බිති වැඩිමහල් සහෝදරතෙම තමන් වෙතට
පැමිණි ඒ දෙදෙනා දැක මහත් සන්තෝසයෙන්
බොහෝ සත්කාර සම්මාන කළාහ, ඒ කුමාරිකාව
ගේ ස්වාමිපුරුෂ තෙමේද එහි ස්වල්ප දිනක් වැස තා
මන් භාර්‍ය්‍යාව ඇගේ වැඩිමහළු සහෝදරයා හට
භාරකර මගේ ගෙමේ කටයුතු මට බොහෝ ඇතැයි
කියා ඒ පුරුෂතෙම තමන් ගමට ගියේය, ඉක්බිති
ඇගේ බෑනනුවන් තමන්ගේ භාර්‍ය්‍යාව කැඳවා සො
හුර මාගේ මේ නැගනියන්ට සියළු කටයුතුදෑ අඩු
වක්නොව කරවයි විධාන කළේය.―එතැන් ප
ටන් ඈට බත් පැන් ආදිය දීමෙන් වත් කරන්නී
ඇගේ අත්පා ග්‍රීවා භරණාදියෙහි ලොභ උපදවා
හටගත් ඇගේ ඒ ලොභය සංසිඳවා ගතනොහී
නොකා නොබී නිරාහාරව ගිලන් තැනැත්තියක්
මෙන් සුළු ඇඳකට නැගී හිස වසා පෙරවගෙන
වැද හොත්තීය, එකල ඇගේ ස්වාමියා ගෙට
අවුත් ඇඳට නැගී හුන් තමන්ගේ භාර්‍ය්‍යාව දැක
අතින් පිට පිරිමැද සොඳුර නොපට අපාසු කිම්
දැයි විචාළේය, ඕ නොමෝ එබසට මුංවන් නොබැ
ස ඉන්නී ස්වල්පවිටක්ම විචාළ කළ කෙඳිරිගගා ස්වා
මිණි ඇති අපාසු කියන්ට නොපිළිවනැයි කියා
නැවතත් නරකොට විචාළ කල්හි කියන්නී, අ
න කර පැලඳි ආභරණ කැමැත්තෙම්සි ඉඳුරා
කීම සුදුසු නොවෙයි ඇගේ හදමස් ලැම්ද මස්
අක්මා පපු අතුතු යන පංච මධුර මාංසය කැමෙත්
තෙම් කී කල්හි ඒ කාතනායෙන්ම ඇ මරන්නාහ,
එකල උන් පැලඳි සියළු ආභරණ මටම වන්
නේයයි සිතා ඉක්බිති ස්වාමිණි තුඹ නැගනියන්
ගේ පංචමධුර මාංසය අනුභවකරණු පිණිස මට

Hosted by Google

දෙළුක් උපන ඉදින් එය නොලද්දේ නම් මාගේ දිවි නැත්තෙමය මතු මා නොපතවයි කීහ෴ එපවත් ඇසූ ඒ පුරුෂතෙම සොඳුර මිනී මැරීම නම් මහා සාවද්‍යය බොහෝ නින්ද්‍යය ඉතා බැරි දෙයකැයි නොයෙක් කාරණ කියා අඬුව ගිවිස්වා ගතහොත් ඒ පුෂීතෙම ඉතා අඩු ශොධහෙයින් ඇ කෙරෙහි අතිසයින් පිළිබඳ සිත් ඇතිව කාමයෙන් මූර්ජාව මොහයෙන් මුලාව කටයුතු නොකට යුතු සලකා ගතහොත් ඇගේ අනාඥ වචනය යහපතැයි ගිවිස්සේය෴

10

හායන්ති ඉධ ලොකත්‍ථා හායන්ති පරලොකිකා
හායන්ති මහතො අත්‍ථා යෙඉත්ථීනංවසංගතා.

මේ ලොකයෙහි ස්ත්‍රීවසඟයට පැමිණි අඥානයෝ මෙලෝ පරලෝ දෙකෙන් වන්නාවූ මහත් වාඩෙන් පිරිහෙන්නෝය෴

11

එසා මාතා පිතා එසො භගිනි භාතරො ඉමෙ
ගරුතබ්බෙ නජානන්ති යෙඉත්ථීනං වසංගතා

තවද ස්ත්‍රීවසඟයටගිය අඥානයෝ මැතොමෝ මෑනියෝය මේතෙම පියානෝය මොවුන් බෑනාඳුවෝය නැගනියෝය සහාදීන් මේ සත්කාරංගරුකාර කටයුත්තෝයයි නොදන්නෝය෴

12

කාරණා කාරණං හෙතතං කතාකබ්බං වානවා ඉදං
කාමන්‍ධකතා නජානන්ති යෙඉත්ථීනංවසංගතා.

සුචි අසුචි දෙක්හි විභාගනොදත් ජාත්‍යන්‍ධයාසේ කාමයෙන් අන්‍ධහෙයින් ස්ත්‍රීවසඟයට ගිය අඥානයෝ මේ කාරණය මේ අකාරණය මේ කටයුත්තාය මේ නොකටයුත්තායයි යන යමක් නොදන්නෝය෴

18

පාණංවා අති පාතෙන්ති හොන්තිවා පාර දාරිකා
භාසන්ති අලිකං වාචං යෙඉත්ථීනංවසංගතා.

තවද සත්‍ව වසඟයටගිය අඥානයෝ මෙලෝ පරලෝ දෙක්හි කිසිභයක් ලැජ්ජාවක් නැතිව ප්‍රාණවධ හෝ කරන්නෝය පරදාර ක්‍රියායෙහිද යුක්තවන්නෝය බොහෝසේ නොසැබෑ වචනද කියන්නෝය—

14

සඞ්වෙජ්ජදදිකං ථෙය්‍යං මිජ්ජපානංචපෙසුනං
කාරෙනාතිසාහසං කප්පං යෙභූතාපීනංවසංගතා.

තවද සත්‍ව වසඟයට ගිය අඥානයෝ උමත් කිරීම් ආදී සොරකම් හා රාමරපානය හා කේලාම්ද කියන්නෝය, වෙනත් සාහසිකවූ නොකට යුතුදෑද කරන්නෝය—

15

අනොඅච්ජරියංලොකෙ සරනතානංහයාවහං
හරියායවසංගන්ත්වා සොදරිං හනාතුමිච්ජති.

අනේ මේ ලොකයෙහි *සිහිකරන්නාහට පවා ඉතා භය ඵලවන්නාවූ අශ්චර්යයක් ඇසුව මැනව, නෑකම්ක් නැති ඉතා ධූර්තවූ තමා අඹුවගේ බස්ගෙන කුසෙහි හොත් නැගනියන් මරණු කැමතිවිය— ඉක්බිති සාහසිකවූ ඒ පව්බූ පුරුෂතෙම ගර්භණීවූ තමාගේ නැගනියන් ලඟට කැඳවා කියනුයේ, නෑගෙනියනි අපගේ මව්පියන් දූත් නය ඉල්වා ගනුමින, අප දෙදෙනා දැක නය ගැත්තන් අපට ඒ නය දුන්නාවූ විනම් යහපත් වේදැයි කීයේය; ඒ අසා සහෝදරී විසින්ද යහපතැයි ගිවිසි කල්හි සැප යානාවක නැගනියන් හිඳුවා නය ගැත්තන්ගේ ගමට යන්නාක් මෙන් රථය පැදගොස් එක් වනයකට පැමිණ යානාව මගින් ඉවත්කොට තබා ඒ කුමාරිකාව හඬව හඬවාම අත අල්වා ඇදගෙන වන ලැහැබකට ගෙනගොස් මෙහිදී මැගේ හිස කපම්-සි, සිතා කෙස් වැටිය අල්වා ගෙන බිම හෙළ්යේය— එකානෙහි ඒ කුමාරිකාවන්ට කම්ජ වාතය සෙලඋනේය, කුමාරිකා තොමෝ

තමන් බෑනන් කෙරෙහි ලැජ්ජාවෙන් ස්වාමීනි
මට දූන් කම්මීජ වාතය සෙලවිහ එබැවින් මා වඳ
පියනතෙක් මදක් ඉවත්ව සිටිය මැනවැයි
නොයෙක් ලෙස යාඥාකොට කියාත් ඉවත් කර
ගන්ට නොහැකිවම පුත්‍රයෙක් වැදූහ; ඉක්බිති
ඒ දුෂ්ට පුරුෂ තෙම සමීපයෙහි තුග රෑකා
ක් දෑකා මෑ ගෙනගොස් තුගරැක් මුලදී මරම්-යි
සිතා තැවතත් හිසකේ අල්වා ඇද්දේය; එකල්
හි ඒ කුමාරිකාවෝ කියන්නාහු ස්වාමිනි තුබ බෑ
නාහුවන්ගේ මුහුණ බලා ඔහට සෙනහයෙන් මා
නොමරා හැරපුව මැනවැයි කියමින් දෙහොත්
මුදුන්දී වඳිමින් යාඥාකොට දිවි ඉල්ලූයේය.——
ඉක්බිති ඒ වඩ පුෂී තෙම ඇගේ ඒ බොලඳවූ බැ
ගෑපත් වචනය නොඇසෙන්නාක් මෙන්ම මරන්
ටම උත්සහ කලේය; එවෙලෙහි ඇ තොමෝ
ඉදින් මම මූරගාපීත් නම් ඒ ශබ්දයෙන් කිසි
වෙක් අවුත් බෑනාහුවන්ට යම් නපුරක් කාලෙ වී
නම් ඒ යහපත් නොවෙයි සිතා බෑනන් කෙරෙහි
සෙනහයෙන් බෑනණෝ නැගී නිස්ශබ්දව තමන්
සැවැත් නුවරදී ගත් සරණ සීලයම සිහි කර
මින් හොත්තාහ.—— ඉක්බිති තමන් වැඩිමහල්
බෑණා කෙරෙහි පතුරුවන ලද මෛත්‍රී ආනුභාව
යෙන්හා, සිහි කරණලද සරණ සීලානු භාව
යෙන්ද, ඒ තුගරැකා අධිග්‍රහිත දේවතාවා සිත
නුයේ මෙබඳු සීලාචාර සම්පණ්ණ ගුණවත් මේ
සත්‍රී තොමෝ මෙතැන්හි මරණ ලද්දේ වීනම්,
ඒ කාරණායෙන් මම දෙව් සභාවට වැද්ද නොග
නිති-යි, සිතා ඒ කුමාරිකාවගේ ස්වාමියාගේ වේ
සයෙන්- අවුත්, ඒ පවිටු පුෂීයා භයගන්වා එන
නිත් අඩවා තොපි නොබවයි කුමාරිකාව අස්ව
සා ලදරුවා සහිත මැනිකොත් රථයක හිඳුවා
ගෙන එදවස්ම සැවැත් නුවරට අවුත් ඇතුළු නු
වර සාලාවක කුමාරිය සතප්වා දිව්‍යපුත්‍රතෙම
අන්තර්ධාන වූයේය.——

Hosted by Google

16

සබ්බසම්පත්තිදාතාරං සබ්බලොකෙක නායකං
මහාපියෙහිභාවෙන්ති තංවෙපාලෙන්තිදෙවතා.

ලෞකික ලොකොත්තර [illegible] සම්පත් දෙන්ට සමත්වූ සියළු ලෝ වැසියන්ට අසහාය නායකවූ බුද්ධරාජයන් වහන්සේ භක්ති ප්‍රේමයෙන් යමෙක් සිහිකෙළේනම් දෙවතාවෝද පිව්වගල්ව ඔවුන් එකාන්තයෙන්ම රකිත්නාහ.

17

මුහුත්තංපිච යොමෙත්තං භාවෙතියදි සාධුකං
තංවෙපාලෙන්තිදෙවාපි තොසයන්තුපාසකාති

ඉදින් යම් කෙනෙක් මද ඇසිල්ලක් වී නමුත් සහපත් මෛත්‍රී සිත වඩත් නම් ඒකාන්තයෙන්ම දෙවතාවෝද ඔවුන් රක්ෂාකොට සතුටු පඩුරු එලවීමෙන් සන්තොස කරත්නාහ. ඉක්බිති ඒ ස්ත්‍රීගේ ස්වාමි තෙම කිසි කටයුත්තක් පිණිස අවුත් නුවරින් නික්මෙනුයේ, සාලාවෙහි හුන් තමන්ගේ භාර්‍යාව දැක තී කවර අවසක ආසිද-කවුරු තොප මෙතනට ගෙන අවිදැයි විචාලේය; එපවත් ඇසූ ඈතොමෝ දෙවතාවා විසින් ගෙන ආබව නොදන්නී, තුබ කුමක් කියන්නේද මා කැඳවා ගෙන ආ දෑ තුබ වේදැයි කීය; එකල්හි පුරුෂ තෙම තී කුමක් කියසිද තීගේ බෑනන්ගේ ගමදී තී දුටු දවස් පටන් අදට සාර මසක් පිරුනේය මෙතෙක් කල් මම එක දවසකත් තොප නොදුටුයෙමි, තී මා සමග කෙසේ අවුදැයි විචාලේය; එ තෙපුල් අසා කුමාරිකා තොමෝ එසේ නම් ස්වාමිනි මේ රහස අන් හට නොකිය මැනවැයි කියා බෑනන් විසින් තමන් මරන්ට කළ උපක්‍රම සියල්ලම නොවලහ කීහ. ඒ අසා ඈගේ ස්වාමි තෙම කළකිරි මහත්වූ භයට පැමිණ ඒ ස්ත්‍රී තමන්ගේ ගෙටම කැඳවා ගෙනගොස් කීප දිනක් ගිය කල්හි ඒ දෙමහල්ලන් එක්ව

ශාස්තෲන් වහන්සේට ආරාධනාකොට මහ දන්දී වළඳවා ඒ දෙමහල්ලෝ බුදුන් වැඳ එකත්පස්ව උන්නාහුය෴ ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ භගවතුන් වහන්සේගේ සරණ සීලානුභාවයෙන් තමන්ගේ දිවි ලත් බව ප්‍රකාශකොට පුතනුවන් ලවා බුදුන්ගේ ශ්‍රී පාදය වන්දවා සරණ කුමාර යයි නම් කළාහුය; බුදුරජාණන් වහන්සේද ඔවුන්ගේ අදහස් දැන කාලානුරූපවූ ධර්මයක් වදාළසේක; දේශනාවගේ අවසානයෙහි ඒ දෙමහල්ලෝම පළමුවැනි සෝවාන් ඵලය ලැබුවාහුය; ඉක්බිති ඔවුන්ගේ පුත්වූ සරණ කුමාරයෝ විසි වයස් පැමිණ බුදු සසුන් වැද මහනව විදසුණ වඩා රහත්ව සරණ ස්ථවිරයන් වහන්සේයයි යන නමින් ප්‍රසිද්ධව බුදු සසුන් බැබලවූ සේක.

18 ධනම්පිම්නසෙවං දෙව දෙවං සරනතා
පරම තර පතිට්ඨං පාපුනන්තීති මනුජා:
භගවතිගුණ රාසිං ජානමානා ජනාහො
භජථ සරණසීලං සබ්බථා සබ්බකාලං෴

මෙසේ දෙවාති දෙවවූ බුදු රජාණන් වහන්සේ මද විනසක පවා සැදැහැයෙන් සිහි කරන්නාවූ සත්වයෝ අසරණ අවස්ථාවෙහි උතුම්වූ ප්‍රතිෂ්ඨාවට පැමිණ සුවපත්වූවෝයයි දැන භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විද්‍යමානවූ ශෛයාර්ථාදී පනියෙහි පළමුවෙනි භාගයෙහි දක්වනලද නවඅරහාදී බුදුගුණ සමූහය දන්නා පින්වත් සත්වයිනි සර්වප්‍රකාරයෙන් හැමකල්හිම සරණ සීලය භජනය කරව්; මෙසේ උන්වහන්සේගේ ගුණයෝ සිහි කොට සියළුම උපද්‍රවයෙන් මිදී දෙලෝවන්නාවූ සියළුම අර්ථ සිද්ධියට පැමිණෙන්ට උත්සාහ කළ මැනවි෴ තවද ශ්‍රීම සරණ ස්ථවිර වස්තුවෙන් මෙලොවදීම ලැබූ සරණ ගමන ඵලය සහ මෛත්‍රී වැඩීමෙහි ගුණද සත්වයන්ගේ වසඟයට පැමිණීමෙහි ආදී නවයන්ද දැන සරණ

සීලාදියෙහි පිහිටා යතීන්ගේ වසඟයටද තොපමණ සගමොක් සිරි සැප අත් පත් කටයුත්තේමය— මෙසේ ලෞකික සරණ ගමන යාගේ ඵලනම්, දෙව් මිනිස් දෙගතියෙහි නොයෙක් භවභෝග සම්පත් ලැබීමෙන් අප්‍රමාණ සැප ලැබීමය— සරණ ගමන ඵලයෝ සැකවින් මෙසේ දතයුතු—

---

5 සරණ කෙලසීම.

සරණ ගමනයාගේ කෙලසීමනම්, සෝවාන් ආදී අධිගම ලාභීන්ගේ ලෝකෝත්තර සරණ සීලය කිළුටු නොවේ පෘථක් ජනයින්ගේ ලෞකික සරණසීලය වනාහි තුනුරුවන් ගුණ වසන සිහි මුලාවූ අඥාණතාවයෙන්ද බුදුන්දෝ නොවේදෝ යනාදීන් බුද්ධ, ධම්ම, සංඝ, සික්ඛා, පූර්වාන්ත, අපරාන්ත, පූර්වාන්තාපරාන්ත, ප්‍රතීත්‍ය සමුත්පාද, යන අට තැන්හි පැවති සංසය සංඛ්‍යාත විචිකිච්ඡාවෙන්ද, බුද්ධාදී තුනුරුවන් සම්බන්ධවූ ගුණයෝ අගුණ වසයෙන් කල්පනා කිරීමෙන් පෙරලා ගන්නා මිත්‍යා ඥාණයෙන්ද, වෙනත් තුනුරුවන් වෙනුවට පවත්නා අනාදර අගෞරව ආදියෙන්ද කිළුටුවේ, එසේවුව මහත් ද්‍යුතික මහත් විප්ඵාර නොවේ; ලෞකික සරණ ගමන යාගේ කිළුටුවීම මෙසේයින් දතයුතු—

---

6 සරණභේදය.

සරණ ගමනයාගේ බිඳීමනම්, සෝවාන් ආදී අධිගමලාභී ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ජන්මාන්තරයෙහිද අන්‍ය ශාස්තෘ කෙනෙක් සරණ කොට නොයන බැවින් එකී ලෝකෝත්තර සරණගමනයාගේ බිඳීමෙක් කිසි සේත් නොවේ; පෘථක් ජනයන්ගේ ලෞකික සරණ ගමනය වනාහි වරද සහිතවූ බිඳීමය නිවරදිවූ බිඳීමයයි විවිධවේ; අන්‍ය ශාස්තෘන් කෙරෙහි නොහොත් දෙව් බඹුන් ආදී බුද්ධාගමෙන් පිටත් අන් කිසිවෙක් නො

Hosted by Google

රෙහි පරලෝ වැඩ පිණිස දක්ෂිණාර්හ වශයෙන් ආත්මය පිදීමෙන්ද, එසේම ඔවුන් ප්‍රසිට කොට ගැණීමෙන්ද, එසේම ඔවුන්ට ගෝලයෝ වීමෙන්ද, එසේම ඔවුන් වැඳීමෙන්ද, යනාදීන් ඔවුන්ගේ සරණ යෑමෙන් වන්නාවූ සරණ ගමනයාගේ බිඳීමෙන් මිථ්‍යා ලබ්ධිකයෙක්වූ බැවින් නරකාදී සිව් අපායෙහි ඉපිද දුක්වූ අනිෂ්ට ඵල දෙන්නේය, එහෙයින් එය වරද සහිත බිඳීම නම් වේ, අන්‍ය ශාස්තෘන් කෙරෙහි ආත්ම පිදීම් ආදි වශයෙන් ගමක් නොකරණ ලද සරණ ගතයාගේ මරණයෙහිදී සරණ බිඳීමෙන් මතු ජන්මවල අනිෂ්ට විපාක නොදෙන බැවින් නිවරදිවූ බිඳීම නම් වේ෴ තවද අපමණ දුක් ලැබීමට හේතුවූ මිසදුටු ආගම්වැලඳ නොගෙන පරලෝ වැඩකාමී සියල්ලන් විසින්ම පලමුවෙන් පිහිටිය යුතු ගුණ ධර්මයක් වන්නාවූ අති සංක්ෂෙපයෙන් දක්වන ලද මේ සරණ සීලයෙහි විභාග දැන හැඳින, එම සරණ සීලයෙහි පිහිටා සග මොක් සිරි සැප අත් පත් කරන්ට උත්සාහා කටයුතු මෙතෙකින් සරණසීල විභාග නිමි෴

---

## 7 ප්‍රතිග්‍රහන ප්‍රශ්ණය.

බුද්ධ රත්නයට කරණලද පූජාදිය නොම ඉවසීම ගැණ මිලිඳු නාගසේන දෙදෙනාගේ ප්‍රශ්නොත්තර෴ ස්වාමිනි නාගසේනයන්වහන්ස අන්‍ය තීර්ථකයෝ මෙසේ කියන්නාහුය, ඉදින් සර්වඥතෙම ලෝකයා විසින් කරණපූජාදිය අලයෙන් ඉවසනසේක් වීනම් කෙලෙශ පරි නිර්වාණයෙන් පරි නොනිම්සේක ලෝකයාහා සංයුක්තසේක භවයට ඇතුලත්සේක ලෝකයා කෙරෙහි සාධාරණ සේක ඉදින් කෙලෙශ පරි නිර්වාණය කලසේක් වීනම් ලෝකයාහා අමිශ්‍රසේක සියළුම භව සංඛ්‍යාත අලයෙන් මිදුනු සේක ලෝකයා කෙරෙහි සාධාරණ නොවන සේක, එහෙයින්

Hosted by Google

ජීවමාන කාලයෙහිත් උන්වහන්සේට කරණ ලද පූජාදිය නොම ඉවසන බැවින් එය කිස්වත් තේය වඩවන්නේය නිෂ්ඵල වන්නේයයි කියති, ස්වාමිනි මේ දෙකලවරඇති උභතඃ කොටික ප්‍රශ්ණය තුබවහන්සේ කරන පැමිණියේය විසඳා වදාල මැනවැයි කීහ ------ නාගසේන තෙරුන් වහන්සේ වදුරණසේක් මහරජ අප භාග්‍යවතුන් වහන්සේ අනුපාදන පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිව්සේක, එහෙයින් උන්වහන්සේ ලොකයාගේ පූජා සත්කාරාදිය දැන්නොම ඉවසන සේක බොධි මූලයෙහිදීම් ආලයකොට ගන්නා ආසා නොමෝ පහකරණ ලද්දීය, එහෙයින් ජීවමාන කාලයෙහිත් ආලය වසයෙන් යමක් නොඉවසන සේක, එබව ශාරි පුත්‍රස්ථවිරසාමීන් විසින්ද.

19

පූජියන්තා අසම්සමා සදෙව මානුසෙහිතෙ
නසාදියන්ති සක්කාරං බුද්ධානං එසධම්මතාති.

යනාදීන් දෙවියන් සහිත මනුෂ්‍යයන් විසින් අසම සමවූ සර්වඥ වරයෝ පුදනු ලබන්නාහුය, උන්වහන්සේලා ඒ සත්කාරාදිය ආලයක්කොට නොඉවසත් අනන්තවූ බුදුවරයන් වහන්සේලාගේ මේ ධර්මතාවයයි කියා දක්වනලද බැවින් ජීවමාන කාලයෙහිද ආලයෙන් යමක් නොඉවසන බව දතයුතු ------ තවද මහරජානෙනි භාග්‍යවතුන්වහන්සේ පිරිනිව්සේක එහෙයින් ලෝකයාගේ පූජාදිය දැන් නොම ඉවසන සේක, නොම ඉවසන්නාවූ උන්වහන්සේගේ ධාතු පරිනිර්වාණය නොවූ බැවින් ඒ සාරීරික පාරිභොගික ධාතු රත්නය දෙව් මිනිසුන් පිහිට කොට උන්වහන්සේගේ නව අරහාදි ගුණෙපත ඥාණ රත්නය අරමුණුකොටගෙන පිළිවෙත් පුරන්නෝ ත්‍රිවිධ සම්පත්ති ලබන්නාන, යම්සේ මහරජ මහත්වූ ගිනි කඳක් දිලිසෙමින් ඇවිලි නොමේම නිමියේනම් කිමෙක්ද මහරජ ඒ යි

නිකඳ ත්‍රිණ කාෂ්ට කඩපෙහලි ආහාරයෙන් ඉවසත්
තේදැයි විචාලහ, ස්වාමීනි ඒ ගිනිකඳ ඇවිලෙමින්
සිටත් ත්‍රිණ කාෂ්ට කඩපෙහෙලි ආහාරයෙන් තොම
ඉවසන කල නිවී ගියාවූ උපශාන්තවූ අපෙතනිකාවූ
ඒ ගිනිකඳ ත්‍රිණ කාෂ්ටාදිය ඉවසාද තොම
ඉවසත්තේමය, එසේ නම් මහ රජ ඒ ගි
නිකඳ නිවී උපශාන්ත කල්හි ලෝකයෙහි ගිනි
ශූන්‍ය වේදැයි විචාලසේක, නැත ස්වාමීනි කා
ෂ්ටය ගිනි ඉපදවීමට කාරණ වන්නේය ගිනි
කැමති යමෙක් ඇද්ද ඒ තෙම තමන්ගේ ශක්
ති බල වීය්‍යීයෙන් කාෂ්ටමථනය කොට ගිනි
උපදවා ගෙන ඒ ගින්නෙන් කටයුතු කර්මාන්ත
යන් කරන්නාහුයයි කීහ, එසේ නම් මහරජ
තොම ඉවසත්තාවූ තථාගතයන්වහන්සේට කා
රණලද පූජා සත්කාරාදිය වඳවන්නේය හිස්
වන්නේය නිෂ්ඵල වන්නේයයි කියන්නාවූ මිථ්‍යා
වාදීන්ගේවචනය අසත්‍ය වන්නේය හිස්වන්නේය,
හේ කෙසේද, මහරජ යම්සේ මහත්වූ ගිනික
ඳ දිලියෙමින් ඇවිලෙන්නේ වේද එමෙන්ම අප භා
ග්‍යවතුන්වහන්සේද දස සහශ්‍රී ලොක ධාතු
යෙහි අනන්තවූ බුඞ ශ්‍රීන් දිලිහුනු සේක; මහ
රජ යම්සේ ඒ මහත් ගිනිකඳ තෙම දිලිහී ගොස්
නිවීයේ වේද එමෙන්ම අප භාග්‍යවතුන් වහන්
සේද දස දහසක් සක්වල බුඞශ්‍රීන් දිලිහෙමින්
වැඩ සිට පිරිනිවී සේක, මහරජ යම්සේ ඇවිලී
ගිය ගිනි කඳ තෙම ත්‍රිණ කාෂ්ටාදිය තමන්
කැමැත්තෙන් තොම ඉවසාද එමෙන්ම ලොක
යාහට හිත වැඩ කැමැත්තාවූ ජීවමාන තථා
ගතයන්වහන්සේද ලොකයා කරණලද පූජා
දිය ආහාරයෙහි ඉවසීම පහකලාහුය සත්සිදෙ
විචාහුය, යම්සේ මහරජ ගිනි කැමති මනුෂ්‍යයෝ
ගිනි නිවී ගිය කල්හිත් තමන්ගේ ථාමබල වීය්‍යී
යෙන් කාෂ්ටය මථනය කොට ගිනි උපදවා ගෙ
න එයින් කටයුතුදෑ කරන්නාහුද එමෙන්ම දිව්‍ය

මනුෂ්‍යයෝ පිරිණිවියාවූ කිසිවක් නොඉවසන්නාවූ
තථාගතයන්වහන්සේගේ ධාතු රත්නය පිහිට
කොට ගෙණ උන්වහන්සේගේ නවඅරහාදී ගු
ණෝපේත ශ්‍රුත රත්නය අරමුණු කොට ගෙණ
මහාකොට පිළිවෙත් පුරන්නෝ ස්වර්ගමෝක්‍ෂ
සැප ලබන්නාහුය, මහරජ මේ කාරණයෙනුත්
පිරිණිවියාවූ කිසිවක් නොඉවසන්නාවූ තථාගත
යන්වහන්සේට කරණලද පූජා සත්කාරාදිය
වඳ නොවන්නේය සඵලද වන්නේය; මිථ්‍යාවා
දීන්ගේ වචනය අසත්‍ය වන්නේය හිස් වන්නේ
ය——නවද මහරජ යම්සේ මහත් වාතයක්
සිව්දිග හමාපැතිර සංසිඳුනේවේද එමෙන්ම අප
භාග්‍යවතුන්වහන්සේද සීතල මධුර සුඛුම මෛ
ත්‍රී වාතය තුන්ලෝ පතුරුවා හමා අනුපදි
සෙස පරිනිර්වාණ ධාතුවෙන් පිරිණිවිසේක; මහ
රජ යම්සේ සංසිඳුනු වාතයාගේ ඉපදවීම පිණිස
තල් වැට ආදිය ප්‍රත්‍යවේද: එමෙන්ම තථාගත
යන්වහන්සේගේ ශාරීරික පාරිභෝගික ධාතු
රත්නයද නවඅරහාදී ගුණෝපේත ශ්‍රුත රත්
නයද ත්‍රිවිධ සම්පත් ප්‍රතිලාභය පිණිස ප්‍රත්‍ය
වන්නේය, මහරජ යම්සේ ග්‍රීෂ්මයෙන් පීඩිත මනු
ෂ්‍යයෝ තමන්ගේ බලවීර්‍ය්‍යයෙන් සංසිඳුනු වාතය
තල්වැට ආදීන් උපදවා ගෙණ තමන් ශරීර දාහය
නිවා ගනිද්ද, එමෙන්ම දිව්‍ය මනුෂ්‍යයෝද පිරි
ණිවියාවූ කිසිවක් නොඉවසන්නාවූ තථාගතයන්
වහන්සේගේ ධාතු රත්නයද ශ්‍රුත රත්නයද
යථාශක්තීන් පුදා කුසල් නැමති සිසිලස පවන්
උපදවා ගෙණ රාග ද්වේෂ මෝහ නැමැති අග්නි
සන්තාප උෂ්ණය ව්‍යප සමනය කෙරෙති, මහ
රජ මේ කාරණයෙන්ද පිරිණිවියාවූ කිසිවක්
නොඉවසන්නාවූ තථාගතයන්වහන්සේට කර
ණලද සත්කාරාදිය වඳ නොවන්නේය සඵලද
වන්නේය, මිථ්‍යාවාදීන්ගේ වචනය අසත්‍යවන්
නේය හිස් වන්නේය——නවද මහරජ යම්

Hosted by Google

සේ පුරුෂයෙක් විද්‍යමාන හෙයියෙන් තමන්ගේ ආකොටණශක්තියෙන් ශබ්දය උපදවාද එමෙන්ම අප භාග්‍යවතුන්වහන්සේගේ ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශනාදීන් වැඩුණු හෙයි සමාන ධාතුරත්නයද ධර්‍ම විනයද අනුශාසනාවද තමන්වැනි ශාස්තෘකොට තබා වදාරමින් තොරම් පිරිණිවී සේක, පිරිණිවී පසු ශබ්ද සමාන ස්වර්ගාපවර්ග සැප කැමති දෙව් මිනිස් ආදීහු ධාතු රත්නයද ධර්‍ම විනයද අනු ශාසනාවද ප්‍රත්‍යක්ෂ කොට ගෙණ තම තමන් ශක්ති පරිද්දෙන් පුද ශබ්ද සමාන ත්‍රිවිධ සම්පත් ලබන්නාහුය— සියා ඛොපනානන්ද— පෙ— යොවො ආනන්දමයාධම්මොච විනයොච දෙසිතොපඤ්ඤත්තො සොවොමමච්චයෙනසත්ථා— ආනන්දය තොපට වනාහි අතීත ශාස්තෘන්ගේ බුද්ධ වචනයක් ඇත අපගේ ශාස්තෘන්වහන්සේ මෙකල්හි නැතැයි යන සිතක් වන්නේවේද, ආනන්දය ඒ කාරණය එසේ නොදත යුත්තේය ආනන්දය තොපට මා විසින් යම් ධර්‍මයක් විනයක් දෙශනා කරණලදද පණවන ලදද ඒ ධර්‍ම විනය තොප මාගේ ඇවෑමෙන් තොපට අනුශාසනා කරණ ශාස්තෘ කෙනෙණැයි කියා පිරිණිවන් මංචකයෙහිදී වදාළ සේක, මේ කාරණයෙන්ද පිරිණිවියාවූ කිසිවක් නොඉවසන්නාවූ තථාගතයන්වහන්සේට කරණලද පූජා සත්කාරාදිය වඳවන්නේය නිෂ්ඵල වන්නේයයි කියන්නාවූ ඒ තීර්ථකයන්ගේ වචනය මිථ්‍යා වන්නේය අභූත වන්නේය බොරු වන්නේය විරුද්ධ වන්නේය විපරීත වන්නේය දුක් වන්නේය දුක්ඛ විපාක වන්නේය අපාය ගාමිනී වන්නේය— තවද මහරජ යම් සේ මහා පෘථිවි තොමෝ කිසිම බීජ ජාතියක් ආලයෙන් නොමඉවසාද, එමෙන්ම තථාගතයන් වහන්සේද ආලයෙන් කිසිවක් නොම ඉවසනසේක යම්සේ බීජ ජාතීහු පෘථිවිය නිසා සටගෙණදැඩි

මූල් පිහිටා පුෂ්ප ඵල දැරීම වේද්ද, [එමෙන්ම දිව්‍ය මනුෂ්‍යයින්ට පිරිණිවියාවූ කිසිවක් නොමිඉවසන්නාවූ තථාගතයන්වහන්සේගේ ධාතු රත්නය හා ශ්‍රැත රත්නයද කාරණකොට ගෙණ පොළෝ යට බැසී දැඩි මුල් නැමති අලෝභ අද්වේෂ අමෝහ යන කුසල මූලයෝ පිහිටන ලද්දාහුය, සමාධි නැමති වෘක්ෂ ස්කන්ධයන්හා සද්ධර්ම නැමති අරටුව ඇති සතර සංවරශීල නැමති ශාඛාවෝ විස්තීර්ණව පතළාහුය, පඤ්චවිධ විමුක්ති නැමති පඤ්චවර්ණ පුෂ්පයන්හා ශ්‍රාමණ්‍ය මාර්ග ඵල නැමති අමෘතඵල ධාරණවෙද්‍යවති, මහරජ මෙම කාරණ යෙතූත් පිරිණිවියාවූ කිසිවක් නොමිඉවසන්නාවූ තථාගතයන් වහන්සේට කාරණලද පූජා සත්කාරාදිය වඳනොවන්නේය සඵල වන්නේය මිථ්‍යාවාදීන්ගේ වචනය අසත්‍ය වන්නේය හිස් වන්නේය——මෙසේ මිළිඳුරජ විසින් විචාළ ප්‍රශ්නය නාගසේන මහතෙරුන් වහන්සේ විසින් මෙලෙස විසඳාවදාළ බැවින්ද——

20

තිට්ඨන්තෙ නිබ්බුතෙචාපි සමෙචිත්තෙ සමංඵලං
චෙතොපණිධි හෙතුහි සත්තා ගච්ඡන්තිසුග්ගතිං

භාග්‍යවතුන්වහන්සේ ජීවමානව වැඩසිටිකල්හිද පිරිණිවී කල්හිද උන්වහන්සේ කෙරෙහි සම සිත්ඇති කල්හි සමඵලවේ, එසේ හෙයින් සත්වයන්ගේ චෙතොප්‍රණිධිය හෙතුකොට සුගතියට යෙත් යයි දක්වනහෙයින්ද, පිරිණිවියාවූ තථාගතයන්වහන්සේ උදෙසා කරණලද පූජා සත්කාරදිය කරන්නන්ගේ චිත්ත ශුද්ධියෙන් ජීවමාන කාලයෙහි මෙන්ම සමඵල ලැබෙන්නේයයි දතයුතු. නවද නොම්ඉවසන බුද්ධරත්නයට කරණලද අපරාධ ගැණ දුක් ලැබෙණ බවට කාරණ—— යම්සේ මහරජ මේ මනුෂ්‍යයෝ අට අනූවක් පමණ රොගයෝ අපගේ මේ ශරීරයෙහි උපදිත්වයි

Hosted by Google

කිසා කැමතිව ඉවසන්නාහුදැයි විචාළසේක;
නැත ස්වාමිනි කීහ, මහරජ ඒ රොගයො නො
මඉවසන මනුෂ්‍යයන්ගේ ශරීරයෙහි කුමක් හෙ
යින් උපදින්නාහුදැයි විචාළසේක; ස්වාමිනි පෙ
රජාතිකළ දුශ්චරිතාදියෙනුත් රොගයෝ උපදිති,
මහරජ පෙර ජාතියෙහි කළ අකුශල කර්මය මේ
ජාතියට දිව ඒනම් මේ ජාතියෙහි කරණලද අකු
ශල කර්මයද වඳ නොවන්නේය-සඵල වන්නේය
මහරජ මෙම කාරණයෙනුත් පිරිණිවියාවූ කිසි
වක් නොම ඉවසන්නාම්වූ තථාගතයන්වහන්
සේට කරණලද අනාදර අගෞරව ආදියද වද
නොවන්නේය සඵලද වන්නේය...... නවද මහ
රජ නන්දනම් යක්‍ෂතෙම සැරියුත් මහ තෙරුන්
වහන්සේට අපසාදනය කොට අතින්පහරක්ගසා
ඒ අකුශල කර්ම බලයෙන් පෘථිවිය පළාගෙණ
නරකයට ගිය බව නොප විසින් පෙර අසන ලද්
දේදැයි විචාළසේක; එසේය ස්වාමිනි අසනලද්
දෙමි ලොකයෙහිත් එබව ප්‍රකට වියයි කීහ; කි
මෙක්ද මහරජ සැරියුත්මහතෙරුන් වහන්සේ
නන්දනම් යක්‍ෂයාගේ පෘථිවිය ගැලීම කැමතිව
ඉවසූසේක්දැයි විචාළසේක; අනේ ස්වාමිනි දෙ
වියන් සහිත ලොකයා නැතිව යන්නේවී න
මුත් හිර සඳ පෘථිවියෙහි වැටෙන්නේ වී නමුත්
මහමෙර විසිර යන්නේවීනමුත් සැරියුත් මහ
තෙරුන්වහන්සේ අනුන්ට වන දුකක් සතුටින්
නොම ඉවසන සේක; ඊට කාරණ නම්, කිපෙ
න සුළුවූ ක්‍රොධ සිත සැරියුත්මහතෙරුන් වහ
න්සේ විසින් ආයසීමාගී ශුභ ශස්ත්‍රයෙන් සිඳහ
රණ ලද්දේය, එබැවින් උන්වහන්සේගේ දිවිත
සන්නාවූත් කෙරෙහිත් කොපයෙක් නොකරණ
සේකැයි කීහ, ඉදින් මහරජ් උන්වහන්සේ න
න්දනම් යක්‍ෂයාගේ පෘථිවිගිලියාම නොම්ඉවසූසේක්
නම් කුමක් පිණිස යක්‍ෂතෙම පෘථිවිය ගැලුනේ
දැයි විචාළසේක, ස්වාමිනි ඌ කළ අකුශලය

Hosted by Google

කලවත්හෙයිහැයි කීහ, මහරජ ඉදින් අකුශල කර්ම බලයෙන් නන්දනම් යක්‍ෂතෙම පෘථුවියෙහි ගැලුනේනම් සිතින් නොම ඉවසන්නාහටත් කරණලද අපරාධය නොම මෙසේ අපායෙහිම හෙළන බැවින් පිරිණිවියාවූ කිසිවක් නොම ඉවසන්නාවූ තථාගතයන්වහන්සේට කරණලද අනාදර අගෞරවයෝද පරලෝ දුක් දෙන බැවින් වද නොවන්නේය සඵල වන්නේය මේ කාරණයෙන්ද තීර්ථකයන්ගේ වචනය මිථ්‍යා වන්නේය අභූත වන්නේය බොරු වන්නේය විරුද්ධ වන්නේය විපරිතවන්නේය දුක් දෙන්නේය දුක්ඛ විපාක වන්නේය අපායගාමිනිවන්නේය; මෙසේ දෙකළවර අල්වා සූක්‍ෂම්වූ මේ උභතෝ කොටික ප්‍රශ්නය විචාළ මිලිඳු මහරජහට යම්සේ අඹකනු කැමති දෝහලිත පුරුෂයෙක් හට අම්‍ර න ඵලභරිත මහා අඹ වෘක්‍ෂයක් සොලවාඑ කලක් මෙන් නාගසෙනස්ථවිරයන්වහන්සේ විසින් නොයෙක් උපමා දක්වමින් රජුහුගේ දෘෂ්ටි ජාලය විධ්වංශනය කර වදාළසේක.—

## 8 සර්වඥතාඥාන ප්‍රශ්නය.

ස්වාමීනි නාගසෙනයන්වහන්ස භාග්‍යවතුන්වහන්සේ සියල්ලම දක්නා සේක්දැයි විචාළේය, එසේය මහරජ උන්වහන්සේ සියල්ලම දක්නාසේක එසේදවුවත් උන්වහන්සේගේ සර්වඥතාඥාන දර්ශනය නිතර එලඹ සිටින්නේ නොවෙයි ආවජ්ජන පටිබද්ධං භගවතො සබ්බඤ්ඤුත ඤාණං ආවජ්ජිත්වා යදිච්ඡකං ජානාති-යි, භාග්‍යවතුන්වහන්සේගේ සර්වඥතාඥානය ආවර්ජනාවපළිබඳය ආවර්ජනාකොට කැමතිදෙය දැන වදාරණ සේකැයි කීසේක, එසේනම් නාගසෙනයන්වහන්ස ඉදින් තථාගතයන්වහන්සේගේ සොයා දැකීමෙන් සර්වඥතාඥානය වේනම් උන්වහන්සේ අසර්වඥසේකැයි කීයේය.—එසේනම් මහරජ

මහා ධන ඇත්තාවූ මහාභොග ඇත්තාවූ රන්රු
වන්ආදී බොහෝ උපකරණ ඇත්තාවූ සියළුම
සැපතින් ආඪ්‍යවූ ධනවතාතයෙකුගේ බොහෝ
කොට්ඨගුල් ආදීයෙහි හැල් යව තල මුං උඳු
ඇතුළුවූ පූර්වණ්නාදී සප්තවිධ ධාන්‍යයන් හා
ගිතෙල් තෙල් වෙඬරු කිරි දීකිරි මීපැණි ආදී
යෙන්ද යුක්තවූ ඒ ධනවතාතයාගේ ගෙදෙරට
බත්කනු කැමැත්තෙන් ආසේවිනම් ඔහුගේ ගෙයි
පිසන ලද භොජනද නිමාවූයෙනම් අමුතු බත්
දෙනු පිණිස කොට්ඨගුල් ආදියකින් සහල් ආදිය
ගෙණ පිසන්නේය, කීමෙක්ද මහරජ ඒ මහා
භොගී පුරුෂතෙම මෙපමණක් භොජන විකල
මාත්‍රයකින්ම නිර්ධනිවූ දුගියෙක් වේදැයි විචාළ
සේක, නැත ස්වාමිනි සක්විතිරජහුගේ ගෙයි
පවා අකාලයෙහි බත් නැති වන්නේය ග්‍රහපති
යාගේ ගෙයි කියනුම කවරේදැයි කීහ, මහරජ
එමෙන්ම තථාගතයන්වහන්සේගේ සර්වඥතාඥ
නය ආවජ්ජනාව පිළිබඳ බැවින් ආවජ්ජනා කො
ට කැමති දෙයක් අනාවරණව දැක වදාරණ
සේක...... නවද මහරජ යම්සේ හටගත් ඵල
ඇත්තාවූ ඵල පොකුරු භාරයෙන් හරිතවූ ඒ ඒ
අතට නැමී තිබෙණ අතු පතර ඇති මහත් ඵල
රුකක් වේද එම රුක් සෙවන වැටුනාවූ කිසි
ඵලයක් එහි නැත්තේනම් කිමෙක්ද මහරජ ඒ
ඵල වෘක්ෂයතෙම එහි වැටුනු ඵල නැති පමණ
කින්ම ඵල නැති රුකක් වේදැයි විචාළසේක,
නැත ස්වාමිනි ඒ වෘක්ෂය ඵල වැටීම පිළිබඳකොට
ඇත්තාහ ඵල වැටුනු කල්හි කැමති කැමති
අය ඵල ලබන්නේයයි කීහ, මහරජ එපරිද්
දෙන්ම තථාගතයන්වහන්සේගේ සර්වඥතාඥ
නය ආවජ්ජනාව පිළිබඳකොට ඇත්තේය ඥාන
යෙන් ආවජ්ජනාකොට බලා කැමති දෙයක් අනා
වරණව දැක වදාරණසේකැයි කීසේක......
නවද මහරජ යම්සේ සතරමහත් දිවයිනට අධි
පතිවූ චක්‍රරත්නයෙන් සම්පූර්ණ ආඥාභා සම්ප

Hosted by Google

ත්‍රාත් චක්‍රවර්තිරාජයතෙම යම් දවසෙක සිට චක්‍ර
රත්නය පැමිණෙවයි කියා චක්‍රරත්නය සිහි ක
රන්නේද එසේ සිහිකළ කල්හි චක්‍රරත්නය තා
මත් සමීපයට පැමිණෙන්නේය, මහරජ එමෙන්ම
අප තිලොගුරු තථාගතයන්වහන්සේ ආවර්ජිතා
කර වදාරමින් කාලත්‍රයෙහි කැමතිදෙයක්ම අනා
වරණව දැක වදාරණසේක්යැයි කී සේක.....
එකල්හි ඉතා ප්‍රසන්නවූ මිළිඳු මහරජ තෙම
ස්වාමිනි නාගසෙනයන්වහන්ස වදාළ මේ කාර
ණ ඉතා යහපත–අපබුදුරජාණන්වහන්සේ සිය
ල්ල දැන වදාරණසේක්මය එසේ හෙයින් ඒ උතු
මන්වහන්සේ සර්වඥසේක්යැයි කියා අපි පිළිගනුම්
හයි කීයේය..... සියල්ලදත් උතුම් සර්වඥතා
ඥානය ගැණ මේ අතිසංක්ෂෙප කථාවයි.....

---

## 9 ප්‍රාණඝාතය.

සැවැත් නුවර නිසාදෙව්රම් වෙහෙර වැඩවාස
යකාරවදාරණ භාග්‍යවතුන්වහන්සේවිසින් ගෙර
ණුන්ට ශික්ෂාපද වෙන්කිරීම පිණිස ප්‍රාණඝාතය
ආදිකොට ජාත රූප රජතය අවසන්කොට දශශි
ක්ෂාවක්වදාරණ ලදද, එයින් පළමුවෙනි පාණාති
පාතයනම්, පාණෙතිජීවිතින්ද්‍රියපටිබද්ධඛන්ධසන්
තිතං උපදාය පඤ්ඤතෙනාතා සත්තෝ,ති–ප්‍රාණය නම්
ජීවිතෙන්ද්‍රිය පිළිබඳ ස්කන්ධ සන්තතිය එයගෙණ
පණවනලද සත්වයයි, ඒ ප්‍රාණියාගේ තෙලිම් ප්‍රාණ
තිපාතනම්වේ, ප්‍රාණ වධකිරීමය ප්‍රාණඝාත කිරීම
යසිද කියනලදී..... මේප්‍රාණඝාතයයි කියනලද
සතුන් මැරීම ආදී පච පාපයෙහිම අග "සෙද්‍යථා
පාදීපනි,, යෙහි දක්වනලදී..... එහි කියනලද
පවාහයෙන් යුක්තව ප්‍රාණඝාත පාපය සිඩවේ,
තේද අල්ප සාවද්‍ය මහා සාවද්‍ය වශයෙන් විධ
වේ, එනි කුරුකුහුඹුවක්හුගේ නැසීම අල්ප සා
වද්‍යය ඒටවධා මහත් මහත් තිරිසතුන්ගේ මැ
රීම උපක්‍රම මහත් බැවින්මහා සාවද්‍යය දුශ්ශීල

Hosted by Google

මිනිසක්හුගේ මැරීම එයට වඩා මහා සාවද්‍යය සරණශීලාදී ඒ ඒ ගුණවතුන්ගේ මැරීම ගුණාධිකාවසයෙන් මහත් මහත් වරද වන්නේමය, එසේ හෙයින් ප්‍රාණඝාත කිරීම ආසෙවිත භාවිත බහුලීකෘත කරණලද සත්වතෙම නරකයෙහි උපදවා නොයෙක්දහස්වරුෂමුළුල්ලෙහි මහ දුක්දෙද්, තිරිසන් යොනියෙහි බළු කවුඩු ආදීන්ව උපදවා නොයෙක් දුක් දේ නිජ්ඣාමතණ්හිකාදිප්‍රෙත යොනියෙහි උපදවා අනන්තඃ කල්පයෙහිදු බත් පැන් නොලදින් කුසතුලෙහි ඇවිල නැගෙන්නාවූ මහ ගින්නෙන් දදු බැගෑ හඬින් හඬමින් සෙම් සොටු මාත්‍රයකුදු නොලැබ මහ දුක් විඳුවන්නේය හැමට කුඩාවූ ප්‍රාණඝාත අකුශලයාගේ විපාක යෙන්ද යමෙක් මිනිස්පියක් ලදනම් අල්පායුස්ක බවට පැමිණේ හෙවත් ලදරු වයසේම මරණයවේ, මෙසේවන හෙයින් සියළු ප්‍රාණඝාත යම් මහා සාවද්‍යය එහෙයින් පන්සිල් රක්නහු විසින්ද පෙහෙවස් රක්නහු විසින්ද

21

ඛුද්දකාහම්පි ජන්තූනං ජීවිතං ජීවිතං විය
අත්තනොරක්ඛිතබ්බංව හිතකාමෙන අත්තනා.

පරලෝ වැඩ කැමැති තමන් විසින් කුඩා සතුන්ගේද ජීවිතය තමන්ගේ ජීවිතයමෙන් රක්‍ෂා කටයුතු, තවද ප්‍රාණඝාතකළාහු උපනුපන් තන්හි ශරීරාවයව විකල වීමය උසට සමාන මහත නැති වීමය ජවබල නැතිවීමය මනාව බිමපිහිටන දෙපතුල් නැතිවීමය දුර්වර්ණවීමය මෘදු මොලොක් අතුල් පතුල් නැතිවීමය දුර්වල වීමය නොපැකිළ කියන බස් නැති වීමය සියළු ලෝකයාහට අප්‍රිය වීමය නැතිගැණීමය අනුන් විසින් නසන්ට පුළුවන් වීමය අනුන්ගේ ප්‍රයොගයෙන් මරණය වීමය පිරිවර ජනයන් නැතිවීමය විරූප වීමය වෛවර්ණ්‍යවීමය බෝහෝ ලෙඩ ඇතිවීමය බොහෝ දුක් ඇතිවීමය ප්‍රිය මනාප අයගෙන් වෙන්වීමය ආයු

Hosted by Google

සමදවීමය යන මේආදී අනිෂ්ට එල විපාක දැන ගතයුතු —

22 සබ්බාපි භොගධනයඤ්ඤ විසෙසලාභි
රූපෙන භොසම්කරධ ජසනානි හොපි
යොයොබ්බණෙපි මරණං ලභතෙඅකාමං
කාමංසදුතු පරපාණහරෙනහරෙහි —

පින්වත්නි යම් සත්වයෙක් තෙමේ පරලොවදී එකානතයෙන් ප්‍රාණඝාත කළේද ඒ ප්‍රාණඝාත කළ සත්වතෙම සියළු වස්ත්‍රා භරණාදි උපභොග ද මුතුමැණික්ආදී ධනයද විසාල්හිආදි ධාන්‍යයද අතිසයින් ලබන්නේද රූපීන් අනභයා සම්පන්නවූයේද යෞවන අවස්ථාවෙහිද නොකැමැතිසේ මරණයට පැමිණෙන්නේය — සමහරු ප්‍රාණඝාත පවුකොට ආකාසයෙහි සිටියාහුද සමුද්‍ර මධ්‍යයෙහි සිටියාහුද පර්වත ගුහාවට ප්‍රවිෂ්ටවූවාහුද ඒ පාපකර්ම විපාකයෙන් මිදීමක් නොලද්දාහු මිය — ගේකෙසේදයත් — ශාස්ත්‍රෘන්වහන්සේ දෙවුරම් වෙහෙර වැඩවසන කල්හි බොහෝ භික්ෂූන්වහන්සේ බුදුන් දක්නා පිණිස එනසේක් එක් ගමකට පිඩු පිණිස පැමිණියාහු ගම්වැස්සෝ ඔවුන්ගේ පාත්‍රාගෙණ ආසන ශාලාවෙහි වඩා හිඳුවා කැඳ අවුළපත් පිළිගන්වා වලදන වේලා එනතෙක් බණඅසමින් උන්නාහුය, එවේලෙහි එක් ස්ත්‍රියක් බත් පිස තබා සූපව්‍යංජන බදින්නී බඳුන්පතුලෙන් ගිනිඇවිලී ගෙයි සෙවෙනි වැදගත එයින් එක් තෘණකැරැල්ලක් ගිනි ඇවිලී අහසට නැන්ගේය එවේලෙහි එක් කාවුඩෙක් අනසින් යන්නේ ඒ තෘණ කැරැල්ලෙහි ග්‍රීවය වෙළී ගින්නෙන් දා ගමමැද වැටුනේය, භික්ෂූන් ඒ දැක ඇවැත්නි කවුඩාටවූ ලාව බලව් මොහු කළ අකුශල කර්මය භාග්‍යවතුන්වහන්සේ අතින් විචාරම්හයි නික්මුනොය — තවත් භික්ෂූන් ගණනක් බුදුන් දක්නා පිණිස නැව නැගී එනසේක් නැව මුහුදු මැදදී නිශ්චලව

Hosted by Google

සිටියේය එහි සිටි මනුෂ්‍යයෝ කාලකන්නියෙක්
මෙහි ඇතැයි සිතා ඒ ඒ අයගේ නාම්ලියා කුස
පත් දැමූවෝය, නාවිකයාගේ භාර්‍යාව යෞවන
වයසෙහි පිහිටිය දැක්ක යුක්තිය සතුවූ එළවන්
නීය ඇගේනම ලිවූකුසපත ගිලින අන් වැරද්ද
කින් මෙසේ වීද්‍යෙහොයි සිතා තුන් විටක් දක්
වාම කුසපත්දමා තුන්විටම ගිලුනු හෙයින් නි
මෙක්ද, ස්වාමිනියි ඒ හැමදෙනම නාවිකයන්
මුහුණ බැළූහ, නාවිකතෙමද මේ තැනැත්ති
යනිසා බොහෝදෙනා නසන්ට පිළිවන්ද, මැනො
මෝ දියට දමවයි කීහ, ඇද එබවදැන හඬන්නී
ඒ අසා නාවිකතෙම කියන්නේ මාගේ ආභරණ
හැසිරෙන් කම් කිම්ද එය ගලවාගෙණ කඩරෙද්
දක් හන්දවා දියට දමව වැලිත් පැන්බ් ඉපිලෙන්
නවුන් බලාසිටිය නොහෙම් එහෙයින් වැලිකළ
යක්ද කරබැඳ දමවයි කීහ, ඔවුන්ද එසේකළෙය
ඈ නොමෝ එම විගස ගිලී යාමෙන් මස් කෑස්
බත්ට ගොදුරු වූයේය, භික්ෂූන්ද එපවත් දැන
මෑ කළ කර්ම්ය අන්කාවරෙක් දනිත්දැයි අප භා
ග්‍යවතුන්වහන්සේ විචාරම්හයි නැව්න්බැස නික්
ම ගියෝය.—— අනිකුත් භික්ෂූන් සත්දෙනෙක්
භාග්‍යවතුන්වහන්සේ දක්නට වැඩමවන්නේ සා
වස එක් විහාරයකට පැමිණ සැතපෙන තැන්
විචාළෙය එක් ගල් ලෙණක් ලැබ සත්දෙනම
රාත්‍රී එහි සැතපුනේය, එදවස් රෑ කුළුගෙයක්
පමණ ගලක් පෙරළී අවුත් ලෙණ්දොර වැසීගි
යේය, එබව දැන නේවාසික භික්ෂූන් සමිප ගම්
වැසියන්ද රැස්කරවා උත්සාහකොටත් ඒ ගල
ඉවත්කොටගත නුහුනුවෝය, මෙසේ කල්හිත්
සත් දිනක් මුළුල්ලෙහි ගලසොල්වාලිය නොහැ
කිවිය ආගන්තුගයෝද සතිය මුළුල්ලෙහි බත්
පැන් නොලදින් දුක් වින්දේය සත්වෙනි දින
යෙහි පාෂාණය තෙමේම පෙරළී වැටුනේය, භි
ක්ෂූන් ගල් ලෙණින්නික්මී අපේ මේ පාපකර්ම්ය
අන්කාවරෙක් දනීද අප භාග්‍යවතුන්වහන්සේ

විචාර දැනගනුම්හයි නික්මුණෝය෴මේ භි
ක්ෂුත් තුන්පක්ෂයම අතරමගදී එකතුව භාග්‍ය
වතුන්වහන්සේ කරා ගොස් වැඳ එකත්පස්ව
හිඳ තමතමන් දුටුකාරණා පිළිවෙළින් විචාළාහ
භාග්‍යවතුන්වහන්සේද ඒ ඒ කර්මයන් පිළිවෙළින්
වදාරණ සේක්෴ඉකුත් කාලයෙහි බරණැස්
ඊසාහා එක් කෘෂිකයෙක් තමන්ගේ ගොණෙක්
හියට අකීකරුව මදක්තැන් ගොස් නිතරම වැ
දහෝහා බැවින් ඌ කෙරෙහි කෘෂිකතෙම උර
ණව මෙවක් පටන් සුවසේවැද නිදවයි කියා පිදු
රු සුඹුළුවක් මෙන් තලා පොඩිකොට පිදුරුවෙ
ළා ගිනිලා මැරූයේය, ගේ තෙම ඒ විපාක
යෙන් බොහෝකල් අපායෙහි දුක්විඳ කර්මාව
ශෙෂයෙන් සත් වරක් කවුඩු යොනියෙහි ඉපිද
මෙලෙසින්ම ගෙවලවැද ගත් ගින්නෙන්ම අහ
සදී දූ මලේයයි කවුඩාගේ පවත්වදාළසේක෴
මුහුදු බත්වූ ස්ත්‍රීතොමෝද තමා කළ කර්ම
යෙහි විපාක වින්දිය, ඈ තොමෝ ඉකුත් කාල
යෙහි බරණැස එක් කෙළඹියෙකුට භාර්‍යා වී
පැන් ගෙනීම් වී කෙටීම් බත්පිසීම් ආදී සියළු කටයු
තු තුමූම කරන්නී; එහි වසන එක් සුණඛයෙක් ඈ
විසින් කරණ සියළු කටයුතුම බලමින් හිඳිනේය
කෙතට බත්ගෙණ යන්නීද දර පැන් පිණිස ව
නයට යන්නීද සුණඛතෙම ඈ සමගම යන්නේය
ඒ දුටු මනුෂ්‍යයෝ එඹා බළුවැද්දිය දඩයන්පිණි
ස නික්මීද අද දඩමස් හා බත් කනු කැමති වීදැයි
උප පීඩණය කරන්නෝය ඈ ඔවුන්ගේ කථාවෙන්
ලැජ්ජාව් දඬු පත් ආදීන් තලා සුණඛයා අඹවත්
නිය සුණඛතෙම්ද මදක් රඳා සිට නැවතත්
ඒ ස්ත්‍රීය කරාම එන්නේය මිට කාරණා කවරේද
යත්, සුණඛතෙම මිට තුන්වෙනි අත්බැවෙහි ඈට
ස්වාමිව ඉපිද ඈ කෙරෙහිගත් සෙනහය මුදන්ට
නොහැකිව එම් ගෙයි සුණඛව ඉපිද මෙසේ ඈ
පසුපස්සෙනි යන්නේය, ඈ තොමෝ එක් දිනක්
සුණඛයා කෙරෙහි කොපව් සතුටුආකාරයෙන්

සුණඛයාහට හඬගාපිය සුණඛයාද හැතැක් දින
කිත් මිහිරි බසක් ඇසූයෙමිසි වෙනිය සලසලා
ලඟට ගියේය, ඈ තොමෝ බල්ලා බොටුව තර
යේ අල්වා එක් ලනුකොණකින් වැලිකළයක්
බැඳ එක් කොණකින් බල්ලා බොටුව බැඳ වැලි
කළය ගඟට පෙරළීය බල්ලාද ඒ සමගම දිය
යට ගොස් මියගියේය, ඈ තොමෝ ඒ අකුශල
බලයෙන් බොහෝ කල් අපායෙහි පැසී කර්මාව
ශේෂයෙන් සියක් අත්බැවෙක්හිම වැලිකළ බඳි
නාලඳුව මෙසේම මරණයට පැමුණුනිය ~~~ මහ
ණෙනි තොපිද තමන් විසින් කළ කර්මයෙහි වි
පාක විත්දේය, හේකෙසේද, ඉකුත් කාලයෙහි
බරණැසවැසි ගොපළුදරුවන් සත්දෙනෙක් එක්
වනයෙක ගවයන් තණකවමින් ඇවිදින්නාහු
එක් දිනක් මහ ගොයකු දැක එලුබඳවා ගත්හ
ගොයාද දිවගොසින් තුඹසකට වත්හ ඒ තුඹ
සෙන් සිදුරු සතක්ඇත ගොපළු දරුවෝද අපි
දැන් අල්වාගත නොහෙම්හ සෙට අවුත් අල්වා
ගනුම්හයි වෙනවෙනම කොලකැටි සතක්ගෙණ
තුඹස සිදුරු සතෙහිම කොලම්බා පලායියෝය,
මිට සත්වෙනිදින ගවයන් තණකවාගෙණ එම
මගින් එන්නෝ තුඹසදැක දැඟිවී ගොයාට කුමක්
වියද්දහොයි බලනු පිණිස නං ගමත් ගැසූ කො
ලකැටි හලෝය ගොයාද විඩාලුවෙත් වෙව්ලමින්
තුඹසෙන් මෑත්විය ගොපළු දරුවෝද ගොයා
දැක ඌකෙරෙහි කරුණා ඉපදී නොමරම්හයි
සිතා පිට පිරිමැද සුවසේ පලායවයිකියා මුදහ
ළේය, ගොයා නොමැරූ බැවින් අපායෙහි නො
සිපද තුදුස් ජාතියකම සත් සත් දින නිරාහාර
වූහ, මහණෙනි එකල්හි ගොපළු දරුවෝව උප
න්නෙත් තොපි සත්දෙනායසි තුන්පක්ෂයෙහි අයම
කළ පව් ප්‍රකාශකොට මෙම දේසනාවගේ කෙ
ළවර ඒතුන්පක්ෂයෙහිම භික්ෂූන් සොවත්ආදී අ
ධිගම ලැබ්මෙන් නිවන්පුර පුවිෂ්ස්කා ~~~ තාම

Hosted by Google

තමන් කරණ ලද පාපකර්‍මයෙන් නොමිදෙන බව මෙසේත් වදාළ සේක —

28

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරංපවිස්ස
නවිජ්ජතීසො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුඤ්චෙය්‍යපාපකම්මාති.

යම් කිසිවෙක් කළ පාපකර්‍මයට අසුනොවී මිදෙම්සි සිතා ආකාශ ගතවූවිද සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇති සමුද්‍ර මධ්‍යයට පැමිණුනේද පර්‍වත ගුහාවට ප්‍රවිෂ්ටවූවිද පෙරදිග ආදී යම් පෘථිවි ප්‍රදෙශයෙක්හි සිටියේද පාපකර්‍මයෙන් මිදියහැකි ස්ථානයක්ද නැතැයිවදාළසේක — මෙබව දන්නා සත්පුරුෂයන් විසින් දිවි හිමියෙන්ම ප්‍රාණවධ කිරිමෙන් වැලකී යහපත් කාය කර්‍මයෙහි යෙදීවාසය කටයුතු — නේ කෙසේද

24

පාණං නහානෙ නචඝාතයෙය්‍ය
නචානුජඤ්ඤා හනතං පරෙසං
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙථාවරායෙව තසාන්තිලොකෙ.

තමන් ප්‍රාණවධ නොකිරීමද අනුන්ලවා නොකරවීමද අනුන්ට ඒ පිණිස අනු නොදැන්මද ලෝකයෙහි වසන තෘෂ්ණා සහිත ථාවරාදී සියළු සත්වයන් කෙරෙහි හිංසා කිරීමපිණිස ගන්නා ලද දඬුමුගුරු ආදීන් රැවත්ව වාසය කටයුතු.

---

## 10 අදත්තාදානය.

අදින්නස්ස ආදානං අදින්නාදානං පරස්සහරණං ථෙය්‍යචාරි කනන්තිවුත්තතං හොති —

කායින්හෝ වචනයෙන්හෝ නුදුන් දෙය ගැණී ම අදත්තා දානයයි අන්සතු දැ ගැණීමය සො රකම් කිරීමයයි කියනලදී ____ මිට ථෙය්‍යාව හාරාදී අවහාර පසක් හා සාහත්ථි කාදී පඤ්ච විධ ප්‍රයොග කොණක්ද විය යුතු ____ හේකෙ සේද ____

25

ථෙය්‍යාපසය්හා පරිකප්පා පටිච්ඡන්න කුසාදිකා අවහාරා ඉමෙපඤ්ච විඤ්ඤාතබ්බාවිභාවිනා.

26

සහත්ථාණත්තිකොචෙවනිස්සග්ගොඅත්ථසාධකො ධුරනික්ඛෙපණංචාති ඉදංසාහත්ථ පඤ්චකං.

තත්ථයො සන්ධිච්ඡෙදාදීනිකත්වා අදිස්සමානො හරති, තුලාකූටමානකූට කූටකහාපණාදීහිවා වඤ්චෙත්වා ගණ්හාති තස්සෙවං ගණ්හතො අවහාරො ථෙය්‍යාවහාරොති වෙදිතබ්බො, යනාදින් එහි · ගෙවල් බිඳුම් ආදියකොට නොපෙනී වස්තු ගෙණ යන්නේද වෙළඳාම් ආදී ගණුදෙනු කාරණ කාලයෙහි තුලාකූට මාණකූට කූට් කහාපණාදීන්හෝ වංචාකොට යමක් ගන්නේද මෙසේ ගන්නා ඔහුගේ අවහාරය හෙවත් ගැණීම ථෙය්‍යාව හාරයයි නොහොත් සොරකමින් ගැණීමයයි දතයුතු, යමෙක් වනාහි බලාත්කාරයෙන් අනුන් මැඩපවත්වා ගම් පහරණ සොරුන් මෙන් අන්සතු දෙය පැහැර ගන්නේද තමහට ගන්ට නියම පඩුරුවලට වඩා රාජ භටාදීන් මෙන් වැඩියෙන් ගන්නේද මෙසේ ගන්නහුගේ ගැණීම පසය්හාව හාරයයි නොහොත් බලාත් කාරයෙන් ගැණීමයයි දතයුතු, පිරිකපා ගැණීම පරිකප්පාව හාර නම්වෙ හෙහණ්ඩො කාශ පරිකල්පනා වශයෙන් දෙවැදෑරුම්වේ, එහි භාණ්ඩපරි කල්පනායි නොහොත් ගන්නා බඩු නියමකොට සිතා ගැණීමයි, පිළිඹිනෑ පුරුෂයෙක් ඇතුළු ගෙට වැද ඉදින් වස්ත්‍ර වීනම් ගණිමි ඉදින්

Hosted by Google

මූල්විනම් නොගණිම්හි කල්පනාකොට අන්ධකා
රයෙහි පසුම්බියක් ගත්තේද එහි ඉදින් වස්ත්‍ර
විනම් ගත් කොණෙහිම අදත්තාදානය වේ, ඉ
දින් එහි මූල් විනම් රැකේ, ගෙසින්පටන ගෙණ
යුත් බලා මූල්බවදැන නැවත ගෙණගොස් තමාද
අදත්තාදානයෙන් රැකෙන්නේමය, අදත්තාදානය
සිද්ධනොවේ යනු අභිප්‍රායි, මූල්බවදැන යමක් ලබණ
ලදද ඒ ගතයුතුයයි සිතා එය ගෙණයේද පදවා
රයෙන් කටයුතු-නොහොත් දෙවෙනි පියවර හ
ගා තිබ්බහා සමග අදත්තා දානය සිද්ධවේ, තිම
තිබී ඉනතක් කල්පනාවෙන් ඔසවා ගණිනම් බි
මින්ඉදිරිම සමගම කර්ම්මයෙන්බැඳේ, හෙවත් අද
ත්තාදානයවේ, ස්වාමින් දැක සොරය සොරයයි
කියමින් එහු බදිද එකල්හි බඩුදමා සොරදිවු
යේනම් අදත්තා දානයනොවේ, ස්වාමිහු දැක
ඒ බඩුගත්තේනම් තමන් රැකෙන්නේමය, අන්
කිසිවෙක් ඒ බඩුගණීද භාණ්ඩ දෙය්‍යවේ—
බඩු ස්වාමිහු එළවා අවුත් නැවතුනු කල්හිසොර
තමන් ඒබවදැක පළමුකොටම මාවිසින් මේබ
ඩුගත්තා ලද්දේය එහෙයින් මේ බඩුදැන් මා
සන්තකයයි සිතා දෙවනු ගණීද; භාණ්ඩදෙ
ය්‍යමවේ හෙවත් බඩු ස්වාමින්ට ඒ ගත්බඩුහෝ
ඒ සමාන වටිනා දෙයක්හෝ දියයුතු එසේ නුදුන්
නොත් අදත්තා දානපාපයෙන් ඔහුබැඳේ, මේ
භාණ්ඩපරි කල්පනා නම්වේ— ඕකාශ පරි
කල්පනාව මෙසේ දතයුතු, සමහර කෙණෙක්
අනුන්ගේ ගෙවල් පිහිවෙණ් ආදී යම්තැනකට
පැමිණ ලෙහ කටයුතු කිසි බඩුවක් දැක එය
ගෙණ ගෙදෙරකඩය ඉදිරිපිට පමුඛය ප්‍රාසාද
දෙරය, ප්‍රාසාද පමුඛය රැක් මූලය, යනාදී
වශයෙන් ඒ ඒ ස්ථානයන් සිතින් පිරිසිඳ ඉදින්
මේ අතර යමෙක් දුටුනම් බලන්ට කැමැත්තෙන්
ගෙණ හැසුරැනෙම් ඒ ගත්දෙය දෙන්නෙම් මේ
අතර නුදුටුයේ විනම් ගෙණයෙම් සිතා ඔහු කල්

Hosted by Google

පනා කරණලද ස්ථානවලින් ඉකුත්ව බඩු ගෙණ ගිය ඇසිල්ලෙහි අදත්තාදානයවේ; මේ කියන ලද ප්‍රකාරයෙන් ස්ථාන නියම්කරගෙණ කරණ සොරකම ඔකාශපරි කල්පනා නම්වේ— මෙසේ මේ පරිකල්පනා දෙදෙනාගේ වශයෙන් කල්පනාකොට අත්සතුදෙය ගත්තහුගේ අවහාරය පරිකප්පාවහාර නම්වේ නොහොත් බඩුවශයෙන් හෝ අවකාශ වශයෙන් හෝ කල්පනාකොට කරණ සොරකම්යයි දතයුතු— සඟවා ගැණීම පටිච්ඡනනාවහාර නම්වේ, ඒ මෙසේ දතයුතු, යමෙක් තෙම උයම් ආදී යම් කිසි තැනෙක්හි ගලවා තබනලද ඇඟිලි මුදු ආදී යම් බඩුවක් දැක පසුව ගණිම්-සි, සිතා පස් පරඩලා පත් ආදීන් වසන්නේහෝ වේද ඔහට මෙපමණකින් උඩාරය නොවේ; හෙවත් අදත්තාදානය එපමණකින් නොවේ; යම් වේලෙක වනාහි බඩුව ඇති හිමියෝ සොයන්නාහු බඩුව නොදෙක සෙටවත්බලා ගණුම්හයි ආලය සහිතව ගියෝවේද ඉක්බිති ඒ බඩුව සඟවා තිබා දෙවනු ගත්තේ අදත්තාදාන කම්මයෙන්බැඳේ, මේ අති සංක්ෂෙපයෙන්දක්වනලද්දේ පටිච්ඡනනාවහාරය නම්වේ. නොහොත් බඩු සඟවා තබා දෙවනු සොරකම් කිරීමයයි දතයුතු— කුසසංකාමණයකොට ගැණීම කුසාවහාර නම්වේ, ඒ මෙසේ දතයුතු; යම් පුද්ගලයෙක් හුනපතුරැම්යහෝ තල්පත්මය හෝ වෙනත් කරණලද යම් සලකුණක් ඇති යමක් හෝ-තබා වස්ත්‍ර ආදී යමක් බෙදනකල තමාගේ කොටස සමීපයෙහි තිබූ තමාගේ කොටසට වඩා මහත් අගයඇති කොටසක්හෝ සම අගයඇති කොටසක් හෝ ගණු කැමතිව තමාගේ කොටසෙහි තුබූ කුසපත අනුන්ගේ කොටසෙහි තබාද කම්ම බන්ධනයවේ; අනුන්ගේ කොටසින් කුසපත ගත්කෙණෙහිම අදත්තාදාන කම්මයෙන්බැඳේ— මේකුසාවහාර නම්වේ, නො

Hosted by Google

හොත් බඩු බෙදනකල කුසපත් හෙලීම් වංශයෙන් අන්සතුදෙය නොරකම් කිරීමයයි දතයුතු — මේ පඤ්ච අවහාරයන්ගේ වශයෙන් පැවති සාහත්ථිකාදී ප්‍රයොගයෙහි සාහත්ථික ප්‍රයොගය නම්, තමාගේ ස්වහස්තයෙන් අන්සතු දෙය සොර සිතින් ගැණීමයි, ආණත්තික ප්‍රයොගය නම්, අසවලාගේ බඩු සොරා ගණුවයි අන්හට ඇණවීමයි; නිස්සග්ගිය ප්‍රයොගය නම්, සුංකාදී අය කාරණාදැන් ආද්‍යයෙහි ඇතුළෙහි සිට සොරසිතින් බඩු පිටතට දැමීමයි, අත්‍ථසාධක ප්‍රයොගය නාලු අසවලාගේ බඩුව යම්කාලෙක ගන්ට හැකිනම් ගණුවයි අන්හට ඇණවීමය, ඉදින් ඒ ඇණවුම් ලත් පුරුෂ තෙම අනන්තරවක් නොව ඒ බඩුව ගණීද ඇණවූවාහට ඇණවූ කෙණෙහිම අදත්තාදානයවේ, ගත්තාහට සාහත්ථික වශයෙන් ගත් කෙණෙහි අදත්තාදානය වේ — ධූරනික්ෂෙප ප්‍රයොගය නම්, අන්සතු සවිඤ්ඤාණක අවිඤ්ඤාණක දැසි දස් ගව මහිෂ වතු කුඹුරු ආදී යමක් ගන්නා පිණිස නඩුකියා තමන් අයිතිකර ගත් කල්හිද ප්‍රවෙසම් පිණිස යමෙකුට තබන්ට දුන් බඩු ඉල්ලූවිට නොගත්තෙම්කියා නොදෙනකල්හිද යමක් නැවත ගෙණවුත්දෙමියි ඉල්වාගෙණ ගොස් දෙවතු ගෙණවුත් නොදෙනකල්හිද ඒ ඒ බඩු ඇති ස්වාමීන් විසින් මට දැන් ඒ දෙය ගණ්ට බැරියයි සිතා ඒයයි හැරීමෙන්ද ඒ ඒ බඩු ගත් තැනැත්තේද ස්වාමියන්ට නොදෙමියි කියාදීමෙහි ඒයයි හැරීමෙන්ද නොහොත් දෙපක්ෂ යෙහිම ධූරනික්ෂෙපයෙන් ගත්තාහට අදත්තාදානය සිද්ධවේ — මේ අදත්තාදානයෙහි ප්‍රයොගහා ප්‍රභෙදයි — මෙසේ දක්වනලද අදත්තාදානය වනාහි දුස්සීලයා සන්තක වස්තුවෙහි අල්ප සාවද්‍යය සරණගතාදී ඒ ඒ ගුණඇත්තන්ගේ පරිද්දෙන් මහා සාවද්‍යය — ඵල විපාක වශයෙන් වනාහි ඌන තුප්පත් තන්හි ධන ධාන්‍ය අඩුබවද අල්ප

භෝගී බවද නූපන් භොග නූපදනා බවද උපන් භොග ස්ථිර නොවන බවද පතනලද පස්කම් ගුණයෝ වහා නොලැබෙණ බවද රජුන් සොරුන් සතුරන් දියෙන් ගින්නෙන් විනාශ වන භොග ඇතිබවද සාධාරණ ධනය නොලැබෙණ බවද සියළු ලොකයාහට නිච බවද ඇතැයි යන වචනයකුදු නොඅසන බවද දුකසේවසන බවද මේ ආදී අදත්තාදානයාගේ අනිෂ්ට ඵල විභාග දැනගතයුතු.

27

ගොසාවකො භවතිහිනාන කපාල හත්ථො
මුණ්ඩොධි ගක්ඛරසතෙ හිවතජ්ජයන්තා
භික්ඛං සදූරිභවතෙ සකුවෙලවාසො
දෙහෙපරත්ථ පරචිත්තන හරෙහරෙහි.

මෙහි අභිප්‍රාය නම්, පෙර ආත්මයෙහි අන්සතු දෙය පැහැරගත් මනුෂ්‍යතෙම නරකාදී සිව් අපායෙහි අපමණ දුක්විඳ ඉදින් මිනිස් පියක් ලද්දේනම් එහිදී ඉල්වන්නෙක්ව දුගියෙක්ව බිදීගිය කබල් ගත් අත් ඇතිව හිස මුඩුව බොහෝ ජනයා විසින් කියන නින්දා වචනයෙන් තර්ජනය ලැබීමෙන් කඩමළුගොතාකළ අඳනා පිළි ඇතිව උකුණන් පිරුණු හිස ඇතිව දැළි පිරුණු සිරුරු ඇතිව ලය පිරුණු සොක ඇතිව ඇස් පිරුණු කඳුළු ඇතිව මුව පිරුණු විලාප ඇතිව කෑද බත් නොලැබ හිඳිනා ගෙයක් දෙරක්ද නොලැබ හැමකල්හි සතුරන්ගේ ගෙයි සිඟමින් මනුෂ්‍ය ප්‍රෙතව වෙවුලමින් ඇවිදිති.

28

එවං අදිනානං ධනමාදියනෙතා
අට්ඨෙවධමෙම නරකාදිකොපි
පප්පොතිදුක්ඛං ව්‍යසනංවනෙකං
නරෙපරත්ථෙසු රතොයතොති:

යම් හෙයකින් මෙසේ අන්සතු දෙයෙහි ඇලී අදත්තාදානය කළාවූ සත්වතෙම රජුන් විසින්

Hosted by Google

අල්ලවාගෙණ කසයෙන් තැලවීම්වශයෙන් ඉහාත්
මභාවයෙහි අනේකවිධ කම්කටොලු ලබයි නර
කාදිසිව් අපායෙහි ඉපිද නොයෙක් දගස් විඳි
ගෙණන්පැසීමෙන් අනෙකවිධ ව්‍යසනයටද දුක
වද පැමිණේ.~~~ අදත්තාදනයෙන් ඉහාත්මයෙ
හිම දුක්ලැබෙණ බවත් මෙසේ දතයුතු.~~~ ශේ
කෙසේද~~~ පෙර මෙම්ලක්දිව මහා තලාක න
ම්විහාරය අසල වතලැගැබක කරණලද පන්ස
ලකපිටකත්‍රධාරි ආරණ්‍යක අභය මහා සථවි
රයන්වහන්සේයයි ප්‍රසිඬව එක්තරා සථවිර කෙ
ණෙක්වාසය කරන්නේය; එක් උපාසකයෙක්
උන්වහන්සේට ආරාධනාකොට දොළොස් අවුරුද්
දක් මුළුල්ලෙහි සිව්පසයෙන් උපසථාන කරන්
නේ-සිවුරු පිණිස ඒ ඒ කාලයෙහි පිළිද දෙයි
ඒ උපාසකයාගේ ගෙට සමීප ගෙයක වසන
හරනතික නම් එක් සොරෙක් රාත්‍රි පන්සලට
ගොස් දුන් දුන් වස්ත්‍ර සොරාගෙණ පලායන්නේය.
තෙරුන්වහන්සේද දිරා ගිය දුවිල සිවුරුම හ
දින්නේය; ඉක්බිති එක් දවසක් උපාසකයා පන්
සලට පැමිණ තෙරුන්වහන්සේගේ සිවුරු දුවී
ලබැව් දැක නැවතත් සිවුරු පිණිස වස්ත්‍ර පිළි
ගන්වා සිතනුයේ මා විසින් බොහෝ පිළි ප්‍රදාන
ලද්දෙය එසින් සිවුරුකොට ඇඳිමෙක්ද නුදුටු
යෙමි ප්‍රවිසම්කොට තැබීමක්වත් අන්නෙකකට
දීමක්වත් නුදුටුයෙමි මෙසේ වන්ට කාරණ කි
මෙක්දැයි එය සෙවියයුතුයයි සිතා එදවස් රාත්‍රි
යෙහි කඩුවක් අතින්ගෙණ විහාරය සමීපයෙහි
මගින් ඉවත්වව සැඟවී සිටගත එකල ඒ සොරද
තෙරුන්වහන්සේට පිළි පිදූබව දැන පළමුසේම
හැර ගණිම්සි සිතා රාත්‍රි විහාරයට ගොස් පිළි
සොරකම්කොට ගෙණ නැවතත් නිසැකව එම
මගින්ම එමින්සිටියේය; එකල උපාසකයා ඔහු සම
ග සොරාදැක දිවගොස් හිසකේපත අල්වා ගෙණ
එබලකොල මෙතෙක්කල් මාගේ තෙරුන්වහන්

ඉස්ට දුන් පිළි ගෙණ ගියේ නොපිමදැයි විචාර
එගෙස්යයි කී කල්හි මතු මෙසේවූ සොර කමක්
කොරේද නොකරේදැයි කියකියා අතින් පයින්
තලා දුර්වලකොට අමුසොහොණකට ඇදගෙණ
ගොස් එදවස්දැමූ මිනිකුණක් මුහුණින් බිමහෙ
වා ඔහුපිට සොර උඩුකුරුකොට වැදහොවා දැත
දෙපය පිට වෙන්වෙන්ව තදකොට බැඳහොවා
තුමූ ඉසසොඩා නහා පළමුකොට ගමට අවුත්
ගම්මැද සිට එබා මේ ගම් හැම දෙනාම මම කියන්
නක් අසව් දැන් රාත්‍රියෙහි මේ ගමට එක් අම
නුෂ්‍යයෙක් එයි ඒ යක්‍ෂයා දිටිනම් නොප හැම
නා මරයි මනත් විනාසයට පමුණුවයි එබැවින්
කල්තිබා ගෙවලට වැද දොරවල් වසාගෙණ බැ
ණනොනැගී හිඳුවයි ඒ යක්‍ෂයා දැන් දැන් අවුත්
මම අසවලාය අසවළුන් මාගේ නෑයෝය අසවලා
මාගේ මිත්‍රයායයි කතාකළේ විනමුත් ගොළුවන්
කින්නරත්සේ බැණනොනැගී හිඳුවයි හඬගාකියා
තමාගේ ගෙට ගියේය——එබස් ඇසූ ගම්වැසි
මනුෂ්‍යයෝ භයින් තැතිගෙණ ගෙවල දොරවල්
අගුළුලාගෙණ ඒ ඒ තැන්හි සැඟවී ගියෝය, එ
කල්හි සොරද තමා පිට බැඳි මළ මිනිය උණාග
නහොයි එ මළමිනියත් සමග තමා වසන ගෙ
දොරට අවුත් භාර්‍යාවට කියනුයේ සොඳුර දොර
හැරපියවයි කීහ දොර නොහරිණ බැවින් සල
කුණු කියන්නේ එබල මම හරනාරිකයාය මගේ
හඬින් දැනගත නොහැකිද දොර හැරපියවයි
කීහ එසේ කීවද ඔහුගේ භාර්‍යාතොමෝ භයින්
තැතිගෙණ පිට මළමිනි කුණක් බැඳගෙණ ආ
හෙයින් සැබවින්ම යක්‍ෂයෙකැයි සිතා බැණනො
නැගී සැඟළුනේය——සොර නොයෙක් කාර
ණ කියාත් දොරහරවා ගතනොයි තමාගේ
දෙමව් පියන්ගේද සෙසු නෑයන්ගේද යහළු මිත්‍රා
දීන්ගේද ගෙවලට වෙන වෙන ගොස් එකතැන
කත් දොර හරවාගත නුහුනුයේමය, ඔහු ගියගිය

තත්හිම මනුෂ්‍යයෝ සැබවින් යක්ෂයෙක් ආයේ යයි සිතා භයින් දොර හැරියේමය; මෙසේ ඒ සොර ගම මුළුල්ලෙහිම ඇවිද එක තැනකත් පිට්වහලක් නොලැබ තෙරුන්වහන්සේ සමීප යටම යෙම්සි සිතා විහාරයට ගොස් ස්වාමීනි ගැත්තාවූ මට පිට්වහල්වූව මැනව මේ පිට බැදි මළමිනිය උණු හැර මා සුවපත් කළ මැනවැයි කීහ— තෙරුන්වහන්සේ ඔහු දැක කම්පාවී ලය පිරුණු සොක ඇතිව ඔහු සමීපයට එළඹ පිට බැදි මිළමිනිය උණු ඈත දමා හරනතිකයා උණු පැනින් නහවා සකල ශරීරයෙහි තෙල් ගල්වා තවමින් උන්කල්හි ඕහට බැටදුන් උපාසකයා උදෑසන්හිම සොර කොසියියෝදැයි හොයි සොයා ඇවිද විහාරයට ගොස් සොරපිට තෙල් ගා තවමින් උන් තෙරුන්වහන්සේ දැක උපාසකතෙම මෙසේ කියන්නේය—

29

එසොමයනං සහායොති උපකාරං කරෙතියො
නතං සොසරතිමොරෙ නත්ථිමොරෙ සහායතා.

ස්වාමිනි යම් කිසි සත්පුරුෂයෙක් මේ තෙම මාගේ මිත්‍රය යයි කවරතරම් උපකාරයක් කළ නමුත් ඒ උපකාරය මදකුත් ඔහු සිහිනොකරන්නේය එබැවින් සොර කෙරෙහි විශ්වාස බවක් නැත්තේමය—

30

ඛාදනෙතාපි පිවනොතාපි සයනෙතාපිච එකතො
නජ්ඣාතනතනොධම්මං නත්ථිමොරෙ සහායතා.

වවා ඇත්තා අසත්පුරුෂයා එකතුව කමින් බොමින් සයනය කරම්න්ද තමාගේ වෛර ස්වභාවය නොහරින්නේමය එබැවින් වවා ඔත් ඇති සොරකෙරෙහි විශ්වාසබවක් නම් නැත්තේය.

31

මුඛෙනෙකං ලපෙමොරෙ කායෙනෙකං කරෙ තිසො
ලොබාකාසොහරනොතාව නත්ථිමොරෙ සහායතා.

Hosted by Google

එවා දන්නා සොරසිත් ඇති ඒ අසත්පුරුෂ තෙම කවින් එකක් කියන්නේය කයින් එකක් කෙරේ ඉදින් අවකාශයක් ලද්දහු නම් උපකාර කළවුන්ගේ වස්තු සියල්ලම හැර ගෙණ පලා යන්නේමය එබැවින් සොරකෙරෙහි විශ්වාසබ වක්නම්නැත්තේමය ......

82

මාතාපිතාව බන්ධුව දිස්වාචොරං සහායකා
දූරතොපරි වජ්ජන්ති කංඛන්තිසංගමෙසදා.

සෙස්සන් තබා මව් පියන්හා බන්ධු ජනයෝද මිත්‍රවූ යහළුවෝද සොර සිත් ඇති අසත්පුරුෂයා දුර එන්නා දැක ඔහුගේ සංගමයෙහි අනර්ථයක් අවඩක් වේදෝහොයි ශංකාවෙන් හැමකල්හි දුරින්ම දුරුවන්නේමය ...... මෙසේ සොරුන්ගේ අගුණ ප්‍රකාශකොට කියා ස්වාමිනි මෙබදු මිත්‍රද්‍රෝහියා ලඟ රඳවා ගෙණ කවා පොවා නාවා තෙල් ගල්වා කුමක් පිණිස දුක්ගන්නා සේක්ද ඇසිල්ලකුත් මෙතන නොරඳවා එහුබඳවාපුව මැනවයි කීහ ...... එසේකී උපාසකයා හට අවවාද වදාරණ තෙරුන්වහන්සේ ......

83

යොසායස්සඩසෙපාදං තස්සපාදංනසොඩසෙ
එවමෙවහිදුට්ඨස්ස අද්‍යෙසෙනවසංහිතො.

එඹා උපාසකය වඩඑරුෂවූ යම් සුණඛයෙක් සත්පුරුෂ ගුණවත් යමෙකුගේ පාදය හැපූයේ නම් ඔහු සුණඛයාගේ පාදය නොම හපාද, එප රිද්දෙන්ම අපරාධකළාවූ දුෂ්ටවූ අසත්පුරුෂයා හට නොකිපී මෛත්‍රීකිරීමෙන්ම ඔවුන්ගේ දුෂ්ට කම සංහිඳෙන ලද්දේමය ......

84

අනතාන්සදැස්සපොසස්ස මෙත්තිංයොනකරිස්සති
නාස්සමෙත්තිංහිසොකසිරනමා භුවරියම්බුධාඉති.

යම් කිසි ශ්‍රුතවත්ත උත්තම කෙණෙක් කෙළෙහි උපකාර නොදත් අසත්පුරුෂයෙකුට මෛත්‍රී නොකෙරේ නම් ඔහු කවරෙක්හට මෛත්‍රී කෙරේද අසත්පුරුෂයන්ට මෛත්‍රීකිරීම බුඬාදී උතුමන්ගේ හැසිරීමකැයි ප්‍රඥා සම්පන්න පණ්ඩිතයෝ කීහු — එසේහෙයින් පින්වත් උපාසකය ද්‍රෝහියායැයි නොසිතා මොහුට මෛත්‍රීකරව මුත්මින්කළ සොරකමෙහි විපාක මෙම ජාතියෙහිම ලද්දේවේදැයි වදරා උපාසකයාට අවවාද කොට නික්මවූසේය — එයින් කීපදිනක් ගිය කල හරනත්තිකයාහට ශරීර බල ලැබී තෙරුන්වහන්සේ කරා පැමිණ ස්වාමිනි මම මේ ආත්මයෙහිම අනිකෙක් මෙන්වූයෙමි එසේහෙයින් ගිහිගෙයි විසිය නොහෙමි මාකළ අකුශල් ගෙවීයන පරිද්දෙන් මාකෙරෙහි අනුකම්පාවෙන් මම මහණ කළමැනැවැයි යාඥාකළේය ඒ අසා මහ තෙරුන්වහන්සේ ඔහු මහණකොට උපසම්පදා කරවූසේක — එතැන්පටන් අප්‍රමාදව භාවනා කිරීමෙන් නොබෝ කලකින් කම්මක්ඛය කිරීමෙන් රහත්ව හරනත්තික මහ තෙරුන්වහන්සේයයි ප්‍රසිඬවූසේක — මේ අභයසළුවීර වස්තුවෙන් අදත්තාදාන පාපය කළාවූන්ට මෙලොවදීම දඬු මුගුරු ආදීන් ලැබෙන්නාවූ හිංසාපීඩාදියද කල්‍යාණ මිත්‍ර ණ්ඩිත සෙවනයෙන් එබඳු අසත්පුරුෂයන්ට පවා ලැබෙන්නාවූ අඣාත්චිත වැඩද අසත්පුරුෂ අකෘතඥයන්ටම කරුණා මෛත්‍රී වැඩියයුතු බවද ප්‍රකාශිතයි —

85

තතොඅදින්නං පරිවජ්ජයෙය්‍ය
කිංචිකචිසාවකො බුජ්ඣමානො
නහාරයෙහරතං නානුජඤ්ඤා
සබ්බංඅදින්නංපරිවජ්ජයෙය්‍ය.

එහෙයින් අදත්තාදානයයි ආදීනවදන්නා බුඩශ්‍රාවකතෙම භූමිඅදි යම්තැනක තුබූ අන්

Hosted by Google

සතු කිසි වස්තුවක් තමාද නොගත්තේය අනුන්
ලවාද නොගත්වත්තේය අන්හට ගත්බූ අවසරද
නොදෙත්තේය එසේහෙයින් සියළු අන්සතු
දෙය ගැණීම දුරුකොට සුක්තේමිය—

---

## 11 කාමමිථ්‍යාචාරය.

කාමෙසු මිච්ඡාචාරෙ කාමමිච්ඡාචාරෙ, එත්ථ
පනකාමෙසූති මෙථූනසමාචාරෙ මිච්ඡාචාරොති
එකාන්ත නින්දිතො ලාමකා චාරො— කාම
යෙහි මිථ්‍යාව හැසිරීම කාමමිථ්‍යාචාරයයි මෙහි
කාමෙසු යනු මෛථුන සමාචාරයයි මිථ්‍යාචාරය
යනු එකාන්තයෙන් නින්දිතවූ ලාමක හැසිරී
මයි— මෙහි මාතු රක්ඛිතාදීන් අතුරෙන් යම්
ස්ත්‍රියක් සෙවනය කරණ චේතනාතොමෝ නො
යායුතු අගම්‍යණීය වස්තූනම්වේ, ඒ ත් කවරේද,
මෑනියන්විසින් රක්ෂාකරණ ලද්දිය, පියාවිසින්
රක්ෂාකරණ ලද්දිය, මවුපිය දෙදෙනා විසින්
රක්ෂාකරණ ලද්දිය, බෑයාවිසින් රක්ෂාකරණ
ලද්දිය, නැගණියන් විසින් රක්ෂාකරණ ලද්දිය,
නෑයන් විසින් රක්ෂාකරණ ලද්දිය, සමාන ගො
ත්‍රඇත්තන් විසින් රක්ෂාකරණ ලද්දිය, සහධා
ර්මිකයන් විසින් රක්ෂාකරණ ලද්දිය. මෑතො
මෝ මට භාර්‍ය්‍යාවන්නීයයි බාලකාලයෙහිම නියම
කරගණ සවත් පිරිසෙත් මල්මාලාදමා ආරක්ෂා
සහිතව සිටින්නියක්ද, මේනම් ස්ත්‍රිය කරාගිය
කළ මෙතෙක් දඩයයි දඩසහිත තැනැත්ති
යක්ද, මිලදීගෙන තැනැත්තියක්ද, තමන් කැ
මැත්තෙන් ස්වාමියෙක් සමග වසන්නියක්ද,
භොගපිණිස වසන්නියක්ද, වස්ත්‍රපිණිස වස
න්නියක්ද, පැන් තලියෙහි අතඹා මේ පැන්මෙ
න් නොවෙනස්ව වසව්සිකියා වසන්නියක්ද, චුම්බ
ටෝ රොපණයකොට නොහොත් දරදිය අදින්නි
එසිත් වලක්වා භාර්‍ය්‍යාකොට වසන්නියක්ද, දාසි

යක්ම භාර්‍යාකොට වසන්නියක්ද, වැඩකාරීයක්ම භාර්‍යාකොට වසන්නියක්ද, සතුරු සෙනග ජයගෙණ භාර්‍යාවටගත් තැනැත්තියක්ද, කාණෙණ්හි කර්‍ෂාපණාදියදීමෙන් සංවාසයට ගත් වෛශ්‍යා තැනැත්තියක්ද, යනමේ විසිදෙනා අතුරෙන්, පළමුකී මාතුරක්ඛිතාදී ස්ත්‍රීන් අට දෙනා සමග ඔවුන් රක්ෂිත්නන්ගෙන් අවසර නැතිව ව්‍යතික්‍රමණයකළ පුරුෂයානට මිථ්‍යාචාර පාපයසිඩුවේ, ඒ ස්ත්‍රීන් අටදෙනාගේ ස්පර්ශයනිය මවූ ස්වාමින් නැතිබැවින් ඒ ස්ත්‍රීන් අටදෙනාට අනාචාරය සිඩුනොවේ රක්ෂිත් නන්ගේ අවසර ඇතිව පැමිණි කල්හි ඒ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම අනාචාරය සිඩුනොවේ ආරක්ෂා සහිත තැනැත්තියආදී අවශෙෂ ස්ත්‍රී දොලොස්දෙනාම ස්වාමින්ගේ ඇරිමක් නැතිඅතර ව්‍යතික්‍රමණය කළකල්හි ස්වාමියා සතුසම්පය සොරාදුන් බැවින් ස්ත්‍රීටද සොරාගත්බැවින් පරපුරුෂයාහටද මිථ්‍යාචාරපාපය සිඩුවේ, යම් ස්ත්‍රියක් ස්වාමියාවිසින් අනාලයෙන් හැරියකල්හි යමෙක් සෙවනය කළෙනම් ඒ දෙදෙනාටම මිථ්‍යාචාර පාපය සිඩුනොවේ. හේ වනාහි දුශ්ශීල තැනැත්තිය සම්ග අනාචාර යෙහියෙදීම අල්පසාවද්‍යය සරණශීලාදී ඒ ඒ ගුණයන්ගේ වශයෙන් මහාසාවද්‍යය, මෙම කාමමිථ්‍යාචාරයාගේ විපාකය උපනුපන් ජාතියෙහි බොහෝ සතුරන් ඇතිවනබවය සියළු ජනයානට අප්‍රිය බවය ආහාර පාන සෙනසුන් ආදිය නොලැබෙණ බවය, නපුරු ස්වප්න දැකීමෙන් දුකසේ සයනය කරණබවය එසේම දූකයේ පුබුදීනබවය අපාය භයින් නොමිදෙන බවය ස්ත්‍රීව නපුංසකව පණ්ඩකව උපදිනබවය ක්‍රොධ බහුලබවය අපිරිසිදු කටයුතු ඇතිබවය යම්දුරු බැල්ම ඇතිබවය අධොමුඛබවය ස්ත්‍රීපුරුෂ දෙපක්ෂයෙහි ඔවුනොවුන්ට අප්‍රියබවය අසම්පූර්ණ ඉන්ද්‍රිය ඇතිබවය අපරිපූර්ණ ලක්ෂණ ඇතිබවය නිතරම සැකඇතිබවය ආහාර පිණිස උත්සාහ

Hosted by Google

බහුලබවය දුකින් වසනබවය හැමලෙසින්ම භය ඇතිබවය ප්‍රිය මනාප අයගෙන් වෙන්වන බවයයි මේආදී අනිෂ්ටඵලවිභාග දැනගතයුතු.—— නවද පරදාරකළ සත්වයෝ මෙම ජන්ම යෙහිමත් වධ දණ්ඩාදී නොයෙක් අනයව්‍යසනයට පැමිණ මෙයින් චුතව නරකයෙහි ඉපිද නොයෙක් වර්ෂ කොටි සහශ්‍රයෙහි දුකින් පැසී එයින් මිදී මිනිස් පියක් ලදුනම් සියක් අත්බැවක ස්ත්‍රී බවටද පැමිණෙත්.——

86

සපතන බහුලාහොති සදුවාපත්ති තිත්ථිකො
ඉත්ථිවාපණ්ඩකොවාපි පරදාරරතොනරො.

පරදාරවන්කොරෙහි ඇලී සෙවනයකළ පුරුෂතෙම හැමකල්හි වෛරීන් බහුල වන්නේය, නොපතන ස්ත්‍රීන් ඇත්තෙක්ද වන්නේය, ස්ත්‍රීව හෝ පණ්ඩකවහෝ උපදින්නේය.——

87

ඉත්ථීනමුවතිසදා පුනඉත්ථිභාවා
නාරිසදාභවතිසො පුරිසොපරත්ත
යොවාචරෙය්‍ය පරදාර මලංඝනීයං
ඝොරංවච්ඡතිසදා ව්‍යසනංවනෙකං.

යම්සත්වයෙක් පරලොව් නොඉක්මියහැක්කාවූ පරස්ත්‍රීන් සෙවනය කෙළෙද ඒ සත්වතෙම පළමු ස්ත්‍රීනම් නැවතත් ස්ත්‍රීබව හැමකල්හි නොහැරින්නේය, නෙවත් ගැහැණුඅත්බැවින් නොමිදෙයිපුරුෂයෙක්වීනම් හැමකල්හි ස්ත්‍රීදවේ, ඉතා කර්කශවූ නොයෙක් ව්‍යසනද හැමකල්හි විඳින්නේය.——එක්සමයෙක්හි අප භාග්‍යවතුන්වහන්සේ කොසොල් මහරජහට වදාරණසේක් මහරජ පෙර දඹදිව් වැස්සන්ට විසිදහසක් අවුරුද්දට ආයුසඇති සමයෙහි බරණැස සතළිස් කෙළක් ධන ඇති සිටුපුත්‍රයෝ සතරදෙනෙක් මිත්‍රව වසන්නාහුය උන්සතරදෙන එක්දිනක් එකතුව කථාකරන්නෝ අප අපගේ ධනයෝ වස්තුඇත ඒ සෑමක්සාර මෝදැයි කිවූහ, ඉන් එකෙක්වත් නාශ්‍ය පබුදුන් මෛත්‍රීවරට වැඩිමෙව්පසු අන්දෙමිහ ප්‍රීන්

කරම්හයි නොකියා එකෙක් කියන්නේ මේ වස්තු විසඳම්කොට සුරපානය කරම්හ, අඩකුඩමස් හැරගෙණ යහපත්ව කම්හ, වෙනත් රුව්ඇති දෙයක් ගෙණ කා බී සුවසේ ඇවිදුම්හ, එසේ කළ අපේ වස්තුවෙන් සැප වින්දෙවයි කීවුය; අනික් සිටුපුත්‍රකෙණෙක් කියන්නේ තුන්අවුරුදු සුවඳහැල්ගෙණ රසමසවුලෙන් යුක්තව හැල්සාලේ බත් කමින් සුරපානයකොට සැප විඳිම්හයි කීවුය, තුන්වැනි සිටුපුත්‍රයා කියන්නේ මෙතෙක් වස්තු ඇත්තවුන්ට බත් අරුමද පැනිතෙල්ආදී අගේවත්දෑ මිළදී හැරගෙණ නොයෙක්වගීයෙහි පූපාදිය ඉදිකරවා කම්හයි කීවුය, සතරවැනි සිටුපුත්‍රයා කියන්නේ සබඳිනි තොපි කුමක් කියවිද වස්තුදෙම්හයි කීකල කැමතිනොවන කෙණෙක්නැත වස්තුදීපියා පරදාරකර්මයෙහි හැසිරෙම්හයි කීවුය.—— ඒ හැමදෙනම උත්ගේකඵාව ගිවිස්සෝය ඔවුන් එවක්පටන් විශිෂ්ට රූඇති ස්ත්‍රීන්ට වස්තුදෙමින් විසිදහසක් අවුරුදුමුළුල්ලෙහි පරදාර කර්මයෙහි හැසිර එයින් මියගොස් අවීචිමහ නරකයෙහි ඉපිද එක් බුද්ධාන්තරයක් එහිපැසී එයින්චූතව තවත් අකුසල් නොගෙවුනුබැවින් සැළමුවවිට පටන් සැළපත්ලට දෙසිය සතළිස් ගව්වක් උසඇති ලෝදියෙන් පිරුණු ලොහොකුම්බු නරකයෙහි ඉපිද තිස්දහසක් අවුරුදු මුළුල්ලෙහි ලොහොදියෙන් පැසෙමින් සැළපත්ලට බැස නැවත තිස්දහසක් අවුරුද්දෙන් සැළමුවවිටට නගිමින් අද දක්වාත් ඔවුන් සතරදෙන අපාදුක් විඳිනාබව වදාළසේක. මෙසේ අපමණදුකට මුල්වූ මේ කාමමිථ්‍යාචාර පාපයෙන් වැළකියයුතු, හේතෙක්සේද——

88

අබ්‍රහ්මචරියං පරිවජ්ජෙය්‍ය
අඞ්ගාරකාසුං ජලිතංව විඤ්ඤූ,
අසම්භුණන්තො පන බ්‍රහ්මචරියං
පරස්ස දාරං නාතික්කමෙය්‍ය.

Hosted by Google

නැණවත් පණ්ඩිතතෙම අබ්‍රහ්මචරියාසංඛ්‍යාත පඤ්චකාම සෙවනය දිළිහෙන අඟුරුවලක්මෙන් සිතා දුරුකරන්නේය බ්‍රහ්මචරියානම්වූ මෛථුනවිරතියට නොපැමිණෙන්නේද පරදාර සෙවනය නොකරන්නේමය — මෙතෙකින් කායදුශ්චරිතය නිමි —

## 12 මුසාවාදය.

"මුසාවාදෙති එත්ථමුසාති අභූතං අතච්ඡං තස්ස භූතතො තච්ඡතො විඤ්ඤාපනං ලක්ඛණතො පනඅවත්ථුංවත්ථුතො පරංවිඤ්ඤාපෙතු කාමස්ස තථාවිඤ්ඤත්තිසමුට්ඨාපිකා චෙතනා මුසාවාදො"යි මුසාවාදය යන මෙහි මුසානම් අවිද්‍යමාන නැති වස්තුවක්කීමයි, ඒ වස්තුවගේ සැබෑ වශයෙන් විද්‍යමානවශයෙන් හැඟවීමයි, ලක්ෂණ වශයෙන් වනාහි අවිද්‍යමානදෙය විද්‍යමානහෙසින් අනිකෙකුට අඟවනු කැමැත්තහුගේ එපරිද්දෙන් දැන්වීමට ඉපදෙව් චෙතනාතොමෝ මුසාවාදනම්වේ — මේ මුසාවාදය වනාහි ගිහින්විසින් තමන් සතුදෙය නොදෙනු කැමතිව නැතැයි කියා පවත්වන මුසාවාදය අල්පසාවද්‍යය, සාක්ෂියක් ඇසූතැන්හි අර්ථ නැසීම්වශයෙන් බොරුසාක්ෂිකීම මහාසාවද්‍ය වන්නේය, එසේම යම්කෙණෙකුන්ගේ අර්ථ නසාද ඔහු අල්පගුණබැවින් අල්පසාවද්‍යය මහාගුණබැවින් මහා සාවද්‍යය, වඤ්චනාතියප්පිණිස කියනලද මුසාවාදය හිමියන්ගේ ගුණවශයෙන් කුඩාමහත් වරදවන්නේයයි දතයුතු — මෙසේ මුසාවාදී පුද්ගලතෙම නරකයෙහි ඉපිද නොයෙක් වර්ෂකොටි සහශ්‍රයෙහි දුකින්පැසී එයින් චුතව මිනිසත්බවට පැමිණ නොයෙක් සියගණන් ජාතියෙහි තමින් නොකල නොකීදෙය තමහට පැමිණ එයින් පෙළෙයි, දුගීවේ ජඩවේ නුවණනැතිවේ සියල්ලට අප්‍රියවේ මනුත්වමෙන් දිවනැතිවේ සජීයත්වමෙන් දිව්දෙකක් වේ කපිල මත්ස්‍යයාමෙන් දුගීන්ධ මුඛ ඇතිවේ

Hosted by Google

දරුවෝ නූපදිත් උපදිත් නම් ගැහැණු දරුවෝ උප
දිත් ඉපදිද ඔහට නිසිවැඩක් නොකරති—
තවද එලහෙයින් වනාහි පැහැදුනු ඉඳුරන් නැ
තිබවය නොපැකිළ කියන මිහිරි බස් නැතිබවය
විශමවූ අපිරිසිදු දත්ඇතිබවය, ඉතා ස්ථූලබව
හෝ ඉතා කෘශබවහෝ ඉතාමිටිබවහෝ ඉතාදික්
බවහෝ වේ, දුක් ශුණී ඇතිබවය දුගීඳි මුඛඇ
තිබවය නොකීකරු පිරිවර ඇතිබවය, ඇදහිය
යුතු වචන නැති බවය, නෙළුම්පෙති බඳුවූ මෘදු
රත් පැහැ නෙත්දිව් නැති බවය උඩඟු බවය
සටන් පැවතුම් නැති බවය මේ ආදී අනිෂ්ට ඵල
විපාක වන්නේයයි දතයුතු—

39

වචනාදුක්ඛ කිණ්ණාව අභූතක්ඛාණ කාලිකො
අසද්ධෙයො සුදුග්ගන්ධො මුඛොහොති මුසාරතො.

මුසා වාදයෙහි ඇළුනු පුද්ගල තෙම දුක්දෙ
න වචනයෙන් ආකීර්ණ වේ, අභූත වචන කීමෙන්
දූෂකවද පැමිණේ නොඇදහිය යුතු වචනඇත්තේවේ
අතිශයෙන් දුගීඳිවූ මුඛයද ඇත්තේවේ—

40

ඒකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො
විතිණ්ණපරලොකස්ස නත්ථිපාපං අකාරියං.

ඒකම වාක් සත්‍යය ඉක් මෙව්වාවූ හරණ ලද
පරලෝ ඇති බොරු කියන්නාවූ පුද්ගලයා හට
නොකළ හැකි පවක් නම් නැත්තේය—තවද
යම් ගිහි ජනයෙකුට බොරු කීමෙහි භයක්
නැත්නම් ඔහුගේ සිත් සතන්හි ගුණාලයක් පි
හිටිය නොහැකිවේ, යම් පැවිදි කෙණෙක්හට
බොරු කීමෙහි ලැජ්ජා නැත්නම් ඔහට ශ්‍රමණ
බවකුදු පිහිට වීම දුෂ්කරවේ—තවද පෙර
චේතියනම් එක් රජෙක් විය ඔහුමුවෙන් මහ
හෙල්මල් සුවඳ වැහේ කසීන් සඳුන් සුවඳ වැහේ

Hosted by Google

අහස්හි ඛඩ්ගපාණිකයෙන් නිදි කඩුගත් අත්ඇති විද්‍යාධරයෝ සතර දෙනෙක් සතරදිග අරක් ගෙණ සිටිති ඒ රජ බොරුකී තැන් පටන් විද්‍යාධරයෝ කඩු දමා ගියෝය මුවෙන් වැහෙන මහනෙල් සුවඳද කයින් වැහෙන සඳුන් සුවඳද අතුරුදන්විය අහස සිටගත නොහී භූමියෙහි වැටී පොළෝ විවරව මහා නිරයටප්‍රවිෂ්ටවිය— මෙම චේතිය රජ විසින් මූසා වාදය පළමුවෙන් ලොව ඉපදෙව බව දත යුතු—

41

දීනොවිගන්ධ වදතොව ජිව්හා අපසෙක්කඩ්ඩු
මුඛොසදා භවති අප්පිය දස්සනොව
පප්පොතිදුක්ඛ මිතුලංච මනුස්ස භූතො
වාචංමුසා භාසතියොහි අපඤ්ඤ සත්තො.

යම් අඥාන සත්වයෙක් තෙමේ මූසාවාද කියන්නේද ඒ බොරු කියන සත්වතෙම බැගෑ වන්නේය දුර්ගන්ධ මුඛ ඇතිවන්නේය ජඩවන්නේය ශ්‍රවණ නැති වන්නේය හැම කල්හි ගොළු වන්නේය අප්‍රිය දර්ශනඇති, වන්නේය කුශල කර්ම්මයකින් මනුෂ්‍යවූයේද අස දෘශවූ දුකටද පැමිණේ—

42

සභාගතොවා පරිසග්ගතොවා
එකස්ස වෙකොන මුසා භණෙය්‍ය
නභාසයෙභණතං නානුජඤ්ඤා
සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය.

යුක්ති විනිශ්චය කාරණ සභාව කට පැමිණෙහෝ එක් පුරුෂයෙකුට එකෙක් මුසාවාද නොකියන්නේය නොකියවන්නේය, මුසාවාද කීමට අන්හට අනු නොදන්නේය මෙසේ සියළුම ආකාරයෙන් අසත්‍යවූ මුසාවාදය දුරුකොට හරින්නේයයි මුසා වාදයෙන් වැළකීම වදාළසේක—

Hosted by Google

## 18 පෛශූන්‍යය.

“ සායවාචාය යස්සහදයෙ අත්තනොපියභාවං පරස්සච සුඤ්ඤභාවං කරොත්තිසාපිසුනාවාචා,, යම් වචනයක් කාරණ කොට ගෙණ යම්කුගේ ලයෙහි තමහට ඇතිවූ ප්‍රිය භාවයද අන්හට ඇතිවූ ප්‍රිය භාවයද ශූන්‍ය කොට හැනි කරන් නේද්‍යුසි, එය පෛශූන්‍ය වචනය නම්වේ— තවද මිත්‍රයෙකු ගෙන් යමක් අසා ඔවුන්ගේ භෙදය පිණිස අනික් මිත්‍රයාහට එය කියාද ඒ මිත්‍රයා ගෙන් ඇසූදෙය අනික් මිත්‍රයාහට කියාද මෙසේ ඔවු නොවුන්ගේ ප්‍රියභාවය ශූන්‍ය කිරිමට හෙතුවූ වචනයන් පහළ කිරිම කේලාම් කීම නම්වේ—

43

පරෙසංනානස්ස පියභාවම්පි භෙදාධිප්පායකාස්සච
භෙදුත්තලොම්කාවාචා පෙසුඤ්ඤනාමිදකාසිතා.

අනුන්ට ප්‍රිය බව පතන්නහුගේ බිඳ වීමෙහි අදහස් ඇත්තහුගේ මිත්‍රභෙදයට ඇතුලත් වාක්‍යතොමෝ පෛශූන්‍යයයි ප්‍රකාශ කරණ ලදී— එක් සමයෙක්හි ෂඩ්වර්ගිකා භික්ෂූහු ඔවුනොවුන් බිඳ වීම පිණිස කේලාම් බස් කියන බව අසා වදාළ මහණෙනි කේලාම් කීම හේතු කොට නූපන් ඩබර උපදින්නේය උපන් ඩබර බොහෝ වන්නේය එහෙයින් මහණෙනි කේලාම් කීම නම් කාඩු තෙපනා සමානය දැඩි විශ්වාසයද වහා භෙද වන්නේය සිංහ වෘෂභ යන්ගේ දිවි නැසීම්ද මෙනැයි වදාරණසේක්,— අතීත කාලයෙහි එක් වෘෂභ ධෙනුවක් තොමෝ සිංහ ධෙනුවක් සමග හිත විශ්වාසව වාසය කරන්නේය. එකියන සිංහ දෙන් තොමෝ සිංහ පැටවකු වැදූහ වෘෂභ දෙන් තොමෝ වෘෂභ පැටවකු වැදූහ ඔවුන් දෙදෙනාත් තමන්ගේ මවුන් දෙදෙනා හිත මිත්‍ර හෙයින් තමුහුත් හිත මිත්‍රව එකතුව කමින් බොමින් බුදීයෙමින්

වාසය කරන්නේය, වනායෙහි ඇවිදින වැද්දෙක් එබව දැක මේ අපූර්වූ කාරණය රජහට කිය යුතුයයි සිතා බරණැසට අවුත් රජහට කියන්නේ දේවයන්වහන්ස මා දුටු ආශ්චර්යයක් ඇත සිංහ සෙනුනා වෘෂභයෙක් හිත විස්වාසව වාසය කරණ බව දුටුයෙමියි කීහ—එවිට රජ තෙම කියන්නේ තුන්වැනි මිත්‍රයෙක් එක්වූකල විනාශයට පැමිණෙයි තුන්වෙනි මිත්‍රයෙක් එක්වූ කළ කියවයි වැදිනට කීහ, වැද්දද යහපතැයි කියා හිමාලයටම ගියේය, එසමයෙහි කැණහිලෙක් සිංහයාහා වෘෂභයා උන් තැනට අවුත් මමත් තොපට යහළුව වෙසෙමියි කියා උන් කීදෙය කරමින් එක්ව වසන්නේය එබව දුටු වැදි තෙමේද එපවත් රජ හට කියමි සිතා නුවරට ආයේය, එක් දවසක් කැණ හිලා සිතන්නේ බොහෝ සිවුපාවුන්ගේ මස් මාවිසින් කාණ ලද්දේය සිංහමස් නොකාණ ලද්දේය එසේ හෙයින් මූන් දෙන්නා උනුනුන් භේද කර මරවා පියා මස් කන්ට උව මැනවැයි සිතා සිංහයා නොකී දෙය වෘෂභයාටද වෘෂභයා නොකී දෙය සිංහයාටද කියා දෙදෙනා සටන් කරවා දෙදෙනාම මැරවිය, වැදිපුත්‍රතෙමේද තුන්වෙනි මිත්‍රයෙක් ඇතිවූ බව රජනට කීකල්හි කොයේ කෙනෙක් දැයි විචාර කැණහිලෙක් බව අසා ඒ නිවසා එකවූ පසු අනාථ යක්ම වන්නේයයි කියා වැද්දා ලවා මග අසවමින් රථයකට නැගී රජ තෙමේද සිංහයාහා වෘෂභයා උන් තැනට ගියාහ—එවෙලෙහි කැණහිල් තෙමේද මාසිතූ දෙය සිද්ධවියයි සතුටුව සිංහයා පිටට පැන උගෙන් මාංස කැටියක්ද වෘෂභයා පිටට පැන උගෙන් මාංස කැටියක්ද කඩා කාමින් පැන පැන සිටියේය, රජ තෙම එපවත් දැන රථා වාහනීට කියන්නාහු—

44

නෙවඉත්ථීසු සාමඤ්ඤං නාපිභක්ඛේසු සාරථි
අථස්සසන්ධිභෙදස්ස පස්සයාවසුචින්තිතං.

Hosted by Google

පින්වත් රථාචාය්‍ර්‍යය මේ සිංහයා අන්‍ය ස්ත්‍රියක් සෙවනය කොරෙයි, මේ වෘෂභයා අන්‍යස්ත්‍රියක් සෙවනය කොරෙයි සිංහයාට ගොචර වෙනය වෘෂභයාට ගොචර වෙනය මෙසේ සර්වප්‍රකාර යෙන් කළහකිරීමට කාරණයක් නැත්තාවූ මේ දෙදෙනාගේ මිත්‍රධර්ම්ය බිඳ පියමැයි සිතූ අධර්ම හිවලාගේ සිතීම බලවසි කිය

45

අසීති කබ්බචම්ංසංහි පෙසුඤ්ඤං පරිවතතති
යතුසභංච සිහංච භක්ඛයනිමිගාධමා.

යම් විටක මොවුන්ගේ ප්‍රිය භාවය භිඳුවූයේද එකල්හි වෘෂභයාගේද සිංහයාගේද මාංසය වනාහි අධම්වූ හිවල්ලු භක්ෂණය කොරෙත් එසේ හෙයින් තීක්ෂණ කඩුපතක්වැනි ප්‍රෛශූන්‍ය වචනය මිත්‍රභාවය බිඳීම පිණිස තියුණුව පවති.

46

ඉමංසොසයනංසෙති යමිමංපස්ස සිසාරථි
යොවාචංසන්ධිභෙදස්ස පිසුනස්සනිබොධති.

රථාචාය්‍ර්‍ය යම් මේ දෙදෙනාගේ මෘත සයන යක් දකිද එපරිද්දෙන් මිත්‍රසන්ධිය භෙදකරන් නාවූ කේලාම් කියන්නාහුගේ වචනය යමෙක් අනිද හෙවත් ඒ කේලාම් වචන පිළිගණිද හේ තෙමේ මෙබඳුවූ මෘතසයනය භෝනේයි(විනාශයට පැමිණේ)

47

නෙජනාසුඛමෙධනති නරසගා යතාරිව
යෙවාචංසන්ධිභෙදස්ස නාවබොධනතිසාරථි.

රථාචාය්‍ර්‍ය මිත්‍රභෙදය කරන්නාහුගේ කේලාම් වචනය ත්‍රවණැනියෙමෙක්හු සත්‍යවශයෙන් නොග ණිද්ද ඒ පණ්ඩිතජනයෝ දෙව්ලොවටවත් මද්‍ය ස්ථයාමෙන් කායික චෛතසිකවූ සැප විඳිනය

කොරත්෴ බරණැස් රජතෙම මෙසේ කියා සිංහයාගේ සම් නිය ආදියගෙණ නුවරටම ආයේ යයි මේ බව බුදුව වැඩහිඳ වදාරමින් භික්ෂූන්ට පෛසුඤ්ඤ ශික්ෂාපදයද වදාළ සේක෴ මෙසේ හෙයින් ගිහිපැවිදි දෙපක්ෂය විසින්ම මිත්‍රභෙදය පිණිස කේලාම්ද නොකියයුතු, සිංහ වෘෂභ දෙදෙනාටමත් අත්‍ය ව්‍යසනපත් වනබැවින් කියනලද පෛශූන්‍යසංඛ්‍යාත කේලාම් වචන සත්‍ය වශයෙන්ද පණ්ඩිත ජනයන් විසින් නොපිළිගත යුත්තේමය෴

## 14 ඵරුෂ වචනය.

,,ඝායපන අත්තානම්පි පරම්පිඵරුසං කරෝති තිසාඵරුසාවාචා නෙවකණ්ණසුඛා නහදයඞ්ගමා,,යි යම් වචනයක් කාරණකොටගෙණ තමන්ගේද අනුන්ගේද ලය රළුකරන්නේනුයි, ඒ ඵරුෂවාක් තොමෝ කණට සැප නොවේ හෘදයට සැප නොවේ෴ මෙසේ අප්‍රියවූ මුසාවාද සංඛ්‍යාත ඵරුෂ වචනයනම්; සැඩොලාය කුළුපොත්තාය යනාදීන් ජාතිසටා බිණීමද, අවකණ්ණකයාය යනාදීන් ඒ ඒ ජනපදවල්හි අවමන්වූ පරිභවවූ හීනනාමයකින් සටාබිණීමද කොසිය ගොත්‍රය යනාදීන් ඒ ඒ ජනපදවල්හි අවමන්වූ පරිභවවූ හීනගොත්‍රයකින් සටාබිණීමද, පරමල්දැම්ම් ආදී ඒ ඒ ජනපදවල්හි අවමන්වූ පරිභවවූ කර්මාන්තයකින් සටාබිණීමද, කුඩල්දිජ්ආදී ඒ ඒ ජනපදවල්හි අවමන්වූ පරිභවවූ ශිල්පයකින් සටාබිණීමද, ආබාධයෙන්පීඩිතයස් යනාදීන් රෝගයෙන් සටාබිණීමද, ඉතා දික්ය, ඉතාමිටිය, යනාදීන් ශරීරාවයවයෙන් සටා බිණීමද, රාගාදි කෙලෙස් හරිතයයි යනාදීන් කෙලෙශයන්සටා බිණීමද, සාවද්‍යදෙශාදියට පැමිණියේයයි ඇවතින් සටා බිණීමද, ඔටුවාය, එළුවාය, ගොණාය, නොමළුඩුාය, තිරිසනාය, නෙරයිකයාය, [අපායට යන්

Hosted by Google

නාය, බැනැදීත් දශ අක්‍රොශයකින්සටා බිණීමය, මෙසේ හීනවශයෙන්ද, හීනයින්ට උත්කෘෂ්ටවශයෙන්ද, මේ දසවිධාකාරයෙන් හෝ වෙනත් ලොව පැවති නින්දාබස් බිණීමයෝ ඵරුෂවචන නම්වේ—න් වනාහී—

48

පරංබොහෙතුකාමස්ස දුට්ඨචිත්තස්ස ජන්තුනො අනිට්ඨසාවණංවුත්තං ඵරුසන්ති විජානතං.

අන්හට අපහාස කරණු කැමතිවූ ද්වෙෂයෙන් දූෂිත සිත්ඇති සත්වයාගේ පරහට අප්‍රිය තෙපුල් බිණීම සියල්ලදත් සර්වඥයන්වහන්සේ විසින් ඵරුෂවචනයයි කියනලදී— තවද එක්සමයෙක්හි ෂට්වර්ගිකා භික්ෂූහු ඔබරකාරන්නාහු ප්‍රිය ශීලි භික්ෂූන්ට භූංසනය කෙරේ, ගහන්නාකෙරේ, වචනයෙන් පහරදේ, දශ අක්‍රොශ වස්තූවෙන් ආක්‍රොශකෙරේ, එබවදැන වදාළ භාග්‍යවතුන්වහන්සේ වදාරණසේක්, මහණෙනි ඵරුෂ තෙපුල් බිණීමනම් තිරිසනුන්ටද අමනාප වන්නේය. කෙසේද, අතීත කාලයෙහි ගන්ධාර රට තක්සලා නුවර එක්තරා බ්‍රාහ්මණයෙකුගේ නන්දිවිසාලනම් වෘෂභයෙක් වීය, ඉක්බිති එක්තරා දවසක් ඒ බ්‍රාහ්මණතෙම කිසිසේත් නන්දිවිසාලයා ලවා ගැල් සීයයක් ඇද්දවීම පිණිස ඒ නුවර සිටානන් සමග මසුරන් දහසක් ඔට්ටු තබා නන්දිවිසාලයා නාඩා ග්‍රීවයෙහි ඉල් පල දවා පළමුවෙනි ගැල් ධුරයෙහි හුන්දකලාවම යොදා තෙමේද ගැල්හිසහිඳ කැවිට ඔසවා අලුත් වත්කුළ උසුලව කුළැයි කීයේය, නන්දිවිසාලයාද සිතන්නේ මේ තෙම අකුළුවූ මට කුළුවාදයෙන් කථාකළෙයයි ඵරුෂ වචනයට අසතුටුව පාසතර ගල්ටැම් මෙන් නිශ්චලව තබා සිටගත්තේය, එකල්හි බ්‍රාහ්මණතෙම සිටානන්ට දහසක්වස්තුද් තමන් සී ඵරුෂ වචනය නිසා දහසින් පැරද ගියේය— නැවතද එක්තරා දවසක් ඒ බ්‍රාහ්මණතෙම සිටානන් සමග මසුරන් දෙදහසක් ඔට්ට

බුතිබා නන්දිවිසාලයා පළමු පරිද්දෙන් සරහා ගැල් දුරසෙනිගොඩ බ්‍රාහ්මණ තෙමේද ගැල්හිස හිඳ නන්දිවිසාලයාගේ පිට පිරිමැද අදුත්වත් වෘෂභය උසුලව වෘෂභයනි කීකල්හි ගැල් සියල්ලම ඇදපිය, එවිට සිටාහො දෙදහසක් පැරදී බ්‍රාහ්මණයාහට මසුරන් දෙදහසක් දුන්නේය.——මෙසේ ඒ බ්‍රාහ්මණතෙමේ ඵරුෂබස් බිණීමෙන් දහසින්පැරදීබවත් මිහිරිබස් බිණීමෙන් මසුරන් දෙදහසක්ලැබූ බවද ප්‍රකාශකරමින් ස්කෘත්ට ඔමසවාද ශික්ෂාපදයද පණවා නැවතත් වදරණසේක්.——

49

මනුඤ්ඤමේවභාසෙය්‍ය නාමනුඤ්ඤංකුදාචන
මනුඤ්ඤංභාසමානස්ස ගරුංභාරංඋදබ්බයි
ධනංචනංඅලබ්භෙසි තේනචත්තමනෝඅහු.

යමෙක් සමග කථාකරන්නේ මුසාආදී සතර දෝෂයෙන් වෙන්වූ මිහිරිවූ මනාපවූ සිලුටුවූ මොලොක්වූ ප්‍රිය වචනම බිණියයුතුය කිසිසේත් ඵරුෂවූ අමනොඥ වචන නොබිණිය යුතුය කුමක් හෙයින්ද තිරිසනා පවා අමනාප ඵරුෂ බස් කියන්නාහුගේ බසඅසානොඇද මනාපවූ ප්‍රියවචන කියන්නාහුගේබසසා ගරුභාරයඇද්දේය, මසුරන් දෙදහසක්ද ඔහුලැබූයේය එයකාරණකොටගෙණ සතුටුවූයේයයි, මෙසේ සර්වඥයන්වහන්සේවිසින් මනොඥවචනම බිණිමෙහි ගුණවදාළසේක.——එසේහෙයින් ඵරුෂවචන බිණීමෙහි ආදීනව මෙසින්අසා බලා සියල්ලන්විසින්ම ඵරුෂ වචනයෙන් වැලකියයුතු.——

## 15 සම්ඵප්‍රලාපය.

“යෙනසම්ඵප්පලාපෙනි තිරච්ඡානං සොසම්ඵප්‍රලාපො,,සී-යම්හින් ස්ම්භස්විවනපෙරලාද ඒ සම්ඵප්‍රලාපය තෙම අර්ථයෙන් විලෝම්බැවින් නිරර්ථකනම්වේ.——

50

නිරත්ථකකථායාහි රාගදොසාහි වඩ්ඪිනී
තං තතස්සඅකාලෙන භාසනං සම්ඵසඤ්ඤිතං.

රාග ද්වෙෂ දෙක වැඩෙන්නාවූ යම් නිරර්ථක කථාවක් ඇද්ද ඒ කථාවෙහි ඇළුනාහුගේ නොකාලයෙහි කීම සම්ඵප්‍රලාපයයි කියනලදී, මෙහි නොකාලයනම් අනුන්ගේ යම් කිසි ආකාරයක් හඟවම්යන සිතින්හෝ, කාව්‍යවිභ්‍රාන්‍යක්‍රම හඟවම් යන සිතින්හෝ, මෙවැනි ආත්‍මභාඇත්තෝප්පවා අනිත්‍යබවට ගියාහ, එබව හඟවම්යන සිතින්හෝ යමක් නොකියා අසම්න් උත්තවූන් අපායෙහි උපදවන්ට නිසිවූ අසබ්බියයි කියනලද කාව්‍යනාටකාදියමක් පරමාර්ථකොටහෝ ප්‍රතිපත්තිකොට හෝ ආඝාත නියොජන කථාකීම නොකාලය නම්වේ.———ශේ මෙසේ දනයුතු———එක් ගම් වැසි මහල්ලෙක් නුවරට ආකල්හි ඔහු විචාකරණු කැමතිවූ බොහෝ සුරාධූර්තයෝ එක්ව ඒ මහළුතෙම පිතෘස්ථානයෙහිතබා ඔහු සමග සුරාපානය කරමින් ඔහුගේ ඇඳුම් පැළඳුම්ද හසන ගත සියළු බඩුද ගණිමුයයි සිතා සුරාධූර්තයන් විසින් කතිකාවක් කළාහුය; අර්ථයට විරුද්ධ එකී එකී කථාවක් අපි කියමු යමෙක් එය අභූතයයි කීයේද කීදෙය නොවිඅදහාද ඔහු දාසයෙක් කොට ගණිමු පියානෙනි විට තුබත් කැමතිදැයි මහල්ලාඅතින් විචාළාහුය ඔහුද එසේය දරුවෙනි කැමතියයි කීහ———ඉක්බිති සුරාධූර්තයෙක් මෙසේ කියන්නේ මම කුසහොත් කල්හි මගේ මෑනියන්ට පූල්එලයක දෙළනවිය ඇ නොවෙද් පූල් ගෙනවියයුතු අනිකෙක් නොලැබ මාම හැවීන මම ගොස් වෘක්ෂයට නගින්ට නොහැකිව මා විසින්ම මගේ පාදය මුගුරක්මෙන් ගෙණ වෘක්ෂය උඩට දැම්මේය ඉක්බිති අතුඅග හැසිර ඵල කඩාගෙණ බසින්ට නොහැකිවූ මම නැවත ගෙට ගොස් හිණිමගක් ගෙණවුත් ගසා ගසින්බැස ම

නියත් සමීපයටගොස් ගෙණගිය එල මැනියත්ට දුනිම් ඒ එල මහත්වෙත් සැළවල් පමණ මහත්ය මගේ මැනියෝ ශුභාස්නෙහි හිඳ එසිත් සමසැටක් එලකෑය මා විසින් එක ඔබොක්කු වෙත් ගෙණඅා එල සියක්කුල ගෙවලින්පුත්ගමෙ හි කුඹා මහළු සියල්ලන්ටම පමණ වූවාහුය, සො ලොස්රියත් පමණවූ අපගේ ගෙයි තුබූ සියළුබ ඩුද ඉවත්කොට ජුල්එලවලින්ම වහලදක්වා පිරි සිටියේය එයින්ද ඉතිරිඑල ගෙණ ගේ දොර සමීපයෙහි ගොඩක් ගැසූවාහුය, එය අසූරියත්ප මණ උස්වූ පර්වතයක්මෙන් විය, සෙසුබුනියත්ද කාරණ විරහිත මෙබඳු කථා කීකල්හි මහළු පුරුෂතෙම කියන්නේ, තොපගේ කුලයෝ පම ණක් මහත් නොවේ මගේ කුලයද මහත්ය මා සනාතක අවශෙෂ කෙත්වලට වඩා කපු කෙත මහත්ය හොයෙක් සියදහස් ගණන් කාරීසප්‍රමා ණවූ කපු කෙත මධ්‍යයෙහි අසූරියත්පමණ උස්වූ එක් කපු වෘක්ෂයක් වූයේය ඒ වෘක්ෂයට ශාඛා පසක්වේ එයින් අවශෙෂඑල ශාඛාවලඑල නොග ත්තාහුය පශ්චිමදිග ශාඛාවෙහි මහත් සැලියක් පමණ එකාමවූ එලයක්ද විය එහි බික්සයෙක ඒ බික්සයේ කපු පිඩු පිපුනාහුය එකල්හි මම දැළි රැවුල් හරවා නහා විලවුන් ගල්වා කපු කෙත කරා ගොස් පිපියාවූ කපු පිඩු දැක සිටීමෙන්ම අත දිගුකොට කපුගෙඩිය කඩා ගත්තෙමි පිපි යාවූ ඒ කපු බික්වල ශරීර ශක්තිමත් දුසයො සදෙනෙක් වූවෝය එයින් එකෙක් හැර ඉතිරි අය දිවගියෝය මෙපණ කාලයක් මුළුල්ලෙහි සැහවීගිය ඔවුන් තුදුටුයෙමි ඒ තොපි පස්දෙන අද දුටුයෙමි, තොපි නන්දය තොපි පුණ්ණය තොපි වඩ් ඪමානය තොපි මංගලය තොප ඩිටුයයි ඔවුන්ට මහළුතෙම නම් කියා නැගිටගත් නාමවූ ඔවුන් ගේ කොණ්වැටි අල්වාගත්තේය ඔවුන්ද පලදුකථා නියමය කඩනොකොටනැති බැවින් අපි දුසයො

නොවෙසි කියන්ටද නොහැකිවිය ඉක්බිති මහ ඵතෙම ඔවුන් විනිශ්චය සභාවට ගෙණගොස් දූසකයන්ගේ ලකුණුකියා ජීවිතාන්තය දක්වාම ඔවුන් දූසයන්කොට පරිභොග කළාහුය෴මෙ බඳු යහපත්දෑ පෙරළන සුළු සම්ඵප්‍රලාපවූ ආසභාතකථා හෙවත් නොකාරණයෙහි යෙදෙනලද කථා නොකිය යුතුමය෴

මෙතෙකින් වාක්දුශ්චරිතය නිමි෴

---

## 16 අභිධ්‍යාව.

අභිජ්ඣායතීතිඅභිජ්ඣා පරභණ්ඩාභිමුඛීහුත්වා
තන්නින්නතාය පවත්තතීති අත්‍ථො.

ලොභකරන්නේහුයි අභිධ්‍යානම් අනුන්ගේ භාණ්ඩයෙහි අභිමුඛව ඊට නැමී පවත්නා සිතඇති බවය යන අර්‍ථයි෴

51

අඤ්ඤ,යපත්තිතායාහි පරොපකරණාදිසු
ලොභාධිමත්තතොසාහි අභිජ්ඣාතිපකාසිතා.

අනුන්ගේ උපකරණාදී පරවස්තුවෙහි යම් අන්‍යාය ප්‍රාප්තිතාවක් ඇද්ද ඒ පැතීම් නොමෙ තමන් ඔඹුයෙහි උපදවන ලොභයටවඩා බලවත් බැවින් අභිධ්‍යායයි වදාරණලදී෴මෙම ලොභී පුද්ගලයෝ තිරිසන්වදඋපදනාහ, හේ කෙසේද; අපහග්‍යවත් සර්‍වඥයන්වහන්සේ දෙවුරම්වෙහෙර වැඩවසන කල්හි තුදිතනම්ගමට අධිපති බැවින් තොදෙය්‍යනම් බමුණෙක් කොසොල්රජනට අග්‍රප්‍රොහිත විය ඒ බමුණුතෙමේ සතාසූ කෙළක් ධන ඇත්තේය එනකුදුළුවත් ඉතාමසුරුය෴

52

අඤ්ජනානං ඛයංදිස්වා උපචිකානංචආචයං
මධූනංච සමාහාරං පණ්ඩිතොඝරමාවසෙ.

අඳුන් ක්‍ෂයවන බවද වේයන්ගේ තුඹස් බැඳීමද හුවණ මෙහෙයාබලා හෙවත් එකතුකිරීමද මධූ

Hosted by Google

න්ගේ රැස්කිරීමද එමෙන් පණ්ඩිත තෙමේ වස්තුවසැපයීමෙන් ගිහිගෙයි වසන්නේය——යනමේ ගාථාව තමන් පුතුට උගන්වා කිසිවක් හවත් කිසිවක් නොදෙනපරිද්දෙන් හික්මවන්නේය සමීප වෙහෙර වැඩවසන භාග්‍යවතුන්වහන්සේටවත් යටත්පිරිසෙන් කැඳක් බතක්වත් නොදී වාඝකොට ධන ලොභයෙන්මිය-එම ගෙයි බළුව උපන්නේය, ඔහුපුත් සුභනම් මානවක තෙමේද ඒ බල්ලාට බලවත්ස්නේහ ඇතිව තමා අනුභවකරණ ලෙසින්ම රසමසවුලෙන් යුක්තවූ ආහාරදෙන්නේය-සුවද පැනින් නාවා උතුම් යානාවකද හොවන්නේය. එසමයෙහි බුදුරජානන්වහන්සේ අළුයම්වේලෙහි ලොවබලා වදාරණසේක් තෝදෙය්‍යනම් බමුණු වස්තුලොභයෙන් මිය, තමාගේගෙයි බළුවඋපන්නේය අද මා එතනට ගියකල්හි මා දැක බළුතෙම බුරයි ඔහට මම එකබසක් කියමි එකල්හි ඒ සුණඛතෙම ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ මා හැඳිනිසේක්වනැයි සිතා ලැජ්ජාව ලිපමුළුවැදහෝනේය, ඒ කාරණයෙන් සුභනම් මාණවකයාහට මා සමග කථාසල්ලාපයක් වන්නේය, ඔහු මාගෙන් බණ අසා සරණශීලයෙහි පිහිටයි බළු මියගොස් නරකයෙහි උපදනේයයි නුවණැසින් දැක සරණශීලයෙහි පිහිටන මාණවකයාකෙරෙහි අනුකම්පාවෙන් එදවස් උදැසන හුදකලාව ඔහුගේ ගෙදොරට වැඩමවා වදාළසේක——එකල්හි සුණඛතෙම බුරබුරා උන්වහන්සේ අභිමුඛයට අවගෙණ ආයේය භාග්‍යවතුන්වහන්සේ ඕහට වදාරණසේක් තෝදෙය්‍යය තෝ පූර්වජන්මයෙහි ලොභිව බළුව උපන දැන් මට බුරා අවීචියෙහි උපදනේ වේදැයි වදාළසේක——සුණඛතෙම එබස් අසා මුනිවහන්සේ මා හැඳිනිසේක්වනැයි කලකිරීමට පැමිණ කර තමා ගෙණගොස් ලිපමුළ අළුපිට වැදහොත්තේය පිරිවර ජනයෝද ඔහු නැගුට්ටුවා යනනේ හොවන්ට අසමත්වූහ, සුභනම් මාණවකයාද ගෙට අවුත්

මේ බල්ලා යහනින් බිම ඇළුවේ කවුරුදැයි විචාළේය මනුෂ්‍යයෝ ඔහට තාමත්හැම යහනින්බිම බල්ලා හොදැමූනියාව කියා සර්‍වඥයන්වහන්සේ ඔහට වදාළබස් කීහ — මාණවකයා එබස් අසා මපියානන්වහන්සේ බ්‍රහ්ම ලොකයෙහි උපන තොදෙය්‍යනම් බල්ලෙක් ඇත්තේ නොවෙයි ශ්‍රමණභවත් ගෞතමයන්වහන්සේ මුඛාරූඪදෙයක්ම කියනසේකැයි කියා උන්වහන්සේට මුසාවාදයෙන් නිග්‍රහකරණු කැමතිව මාණවකයා විහාරයටගොස් එපවත් විචාළෙය, උන්වහන්සේද සුණඛයාහට වදාළලෙසම ඔහටත් වදාන එය සැබෑ බව දක්වනු සඳහා තාගේ පියා තට නොකීවස්තුඇද්දැයි විචාළසේක එසේය ස්වාමිනි මට නොකී වස්තු ඇතැයිකියා ගේ කවරක්දැයි විචාළකල්හි ලක්‍ෂයක් වටනා රන්මාලාවක ලක්‍ෂයක් වටනා රන්මිරිවැඩි සඟලෙක ලක්‍ෂයක්වටනා රන් පලසක මසුරන් ලක්‍ෂයක, යනමේ සියල්ලම පියානන් විසින් මට නොකීවස්තුයයි කීහ. එකල්හි සර්‍වඥයන්වහන්සේ වදුරණසේක් තොපි ගෙටගොස් ඒ සුණඛයා කිරිබත් කවා යහනේ හොවා නිදිගත්වා නැගිටිකල්හි නොකී වස්තු විචාරව එකල්හි එය තොපට කියයි එසඳ ඔහු තා පියබව දැනගණුවයි වදාළසේක; එවිට සුභනම් මාණවකතෙම සිතන්නේ ඉදින් මූන්වහන්සෙගේ බස සැබෑවීනම් වස්තුව ලැබෙයි බොරුවීනම් මුසාවාදයෙන් නිග්‍රහ කෙරෙම්යි මේ දෙකාරණයෙන්ම සතුටුව ගෙට ගොස් බල්ලා බඩපුරා කිරිබත් අනුභවකරවා යානේ වැදහොවා නිදිගත්වා නැගිටි කල්හි තාමහට පෙර නොකී වස්තු විචාළේය, එකල සුණඛතෙම තමා හැඳිනි බව දැන හුංහුංයන අනුකරණ පවත්වමින් දිවගොස් වස්තු තුබුතැන් පාදයෙන්කැන සලකුණු කාළේය — ඒ සලකුණෙන් මාණවකතෙම භූමියසාරවා සියළුම වස්තුගෙණ භවයෙන් වැසීතිබෙන්නාවූ අතිසූක්‍ෂම කාරණ පවා ශ්‍රමණභවත්

ගෞතමයන්වහන්සේට දැනෙනසේක; එසේහෙ
යින් එකානනයෙන් මූන්වහන්සේ සර්‍වඥසේකැයි
බුදුන්කෙරෙහි පැහැද දෙවෙනි වාරයේ යනග
මෙන් ප්‍රශ්න තුදුසක් සිතින් සනිටුහන්කොට
ගෙණ උන්වහන්සේකරා එළඹ එකත්පස්ව හිඳ
ප්‍රශ්න විචාළකල්හි “ කම්මවිභංග” සූත්‍රය වදාළ
සේක— තොදෙය්‍යනම් සුණඛතෙම එයින්මිදී
අවීචියෙහි උපන්නේය— අභිධ්‍යාසංඛ්‍යාත ලො
භයෙහි ආදී නව ශමයින් දැන හැඳින ලොභි
භාවයෙන් වැලකා ත්‍යාගසම්ප්‍රදාවෙහි පිහිටා දාන
මානාදී කුශල් කටයුත්තේමය—

---

## 17 ව්‍යාපාදය.

“ හිතසුඛං ව්‍යාපාදයතීති ව්‍යාපාදො සොපරවි
නාසායමනොපදොස ලක්ඛණො, හිතසැපවූ පෙ
රයනපත් ප්‍රකෘතිය පෙරළන්නේනුයි ව්‍යාපාදනම්
එය අනුන් නැසීමපිණිස හිතෙහි දූෂිත ලක්‍ෂණ
යයි හෙවත් ක්‍රොධ චෙතනාවයි—

53

යාසම්පදුම්ඨවිනාසස්ස අනත්ථාහිත කාමතා
බ්‍යාපාදෙතිසම්බාතොඅබ්‍යාපන්නොහිසබ්බථා.

දැඩිවකිපියාවූ සිත්ඇත්තාහුගේ යම් අනර්ථය
කට කැමති බවෙක් හෙවත් අහිත කැමතිබ
වෙක් ඇද්ද හැම පරිද්දෙන් නොපෙරළියාවූ
සිත්ඇත්තවුන් විසින් බ්‍යාපාදයයි වදුරණලදී,
මෙහි අනර්ථනම් නොවැඩය, අහිතනම් නොවැ
ඩට කාරණයි— ව්‍යාපාද සංඛ්‍යාත මෙමදොෂ
යෙන් දූෂිත සිත්ඇත්තෝ බොහෝසෙයින් තිරි
සන්ව උපදින්නාහුයි, හේකෙසේද; එක්සමයෙක
තෙර දෙනමක් එක් කරුණක්ගැණ ඔවුනො
වුන්වෙත දූෂිතවූ ක්‍රොධසිතින් වසන්නේ ඉන්
එක් තෙරකෙණෙක් ක්‍ෂමාකොට ගතනොහී කා
ලක්‍රියාකොට අඹදිව එක් විලෙක නාගරාජව

උපන්නේය. අනික් තෙරුන්වහන්සේ ඇතුළුව දෙලොස්දෙනෙකුන්වහන්සේ ශ්‍රීමහා බොධිය වඳනාකැමතිව මධ්‍ය මණ්ඩලයට වඩනේ ඒ විල් තෙරට පැමිණ රාත්‍රියෙහි විල්තෙර රුකක්මූල පැත්පෙරා වලදමින් වැඩහිඳිනා කල්හි ඒ විලවසන නාගරජයා තමන්වසන භවනයෙන් නික්මූනේ ඒ සංඝයා දෙලොස්නම දැක හැඳින මාණවක වේසයක්මවාගෙණ සමීපයට අවුත් සිට පූර්වජන්මයෙහි තමාගේ නම් ලකුණුකියා, ඒතෙර තමන්කෙරෙහි ක්‍ෂමාකරවන්ට සංඝයාලවා යාඥා කරවා ඔහු ක්‍ෂමානොවෙන්නේ නැවතත් නොයෙක්ලෙස යාඥාකොටත් ඒතෙර ක්‍ෂමානොවී නැගිටයන්ට වන්කල්හි මාණවක වේසය හැර සර්පවේසය මවාගෙණ තෙරුන්වහන්සේගේ පිටිපත්ලට පෙණයෙන්ගසා ඇයේය, එවිගස ඒතෙර මිය දූෂිත සිතවූබැවින් ඔපපාතික නාගරජයෙක්වඉපද ක්‍රොධයෙන් දිළිහෙමින් උතුතූන්කාමැරිමේ ක්‍රොධයෙන් නැවත නැවතත් තිරිසන්යොනියෙහි උපන්නේය—මහා සාවද්‍යවූ මේක්‍රොධය ක්‍ෂමාවෙන් මිදිය හැකිබැවින ඛිප්පවිරාගිනම් වේ, එහෙයින් ක්‍රොධයෙහි ආදී නවමේආදීන් දත් නැණවතුන් විසින් කිසිසේක් ක්‍රොධනොකොට ප්‍රිය අප්‍රිය සැමදෙනා කෙරෙහිම කරුණා මෛත්‍රී ඉපදවිය යුත්තේමය—

---

## 18 මිථ්‍යාදෘෂ්ටිය.

මිච්ඡා පාපිකාවිඤ්ඤූ ගරහිතා එතෙසංදිට්ඨීති මිච්ඡාදිට්ඨී, මිථ්‍යාවූ ලාමකවූ පණ්ඩිතයන් විසින් නින්දා කරණ ලද්දාවූ දෘෂ්ටි තොමෝ මොවුන්ට ඇත්තේනුයි මිථ්‍යා දෘෂ්ටි නම්—

54

අනත්ථාභිනිවෙසොයො නත්ථිදින්නන්ති ආදිනා
මිච්ඡාදිට්ඨීති අක්ඛාතො සම්මාදිට්ඨි විපක්ඛකො,

දුන් දෙය ඵලනැත යනාමේ ආදීන් යම් අතත්වයෙහි අභිනි වෙශයෙක් ඇද්ද හෙවත් වර

දවා ගැණ්මෙක් ඇද්ද සම්‍යක් දෘෂ්ටියට විරුඬවූ ඒ දෘෂ්ටි තොමෝ මිථ්‍යා දෘෂ්ටි යයි කියන ලදී. නත්ථිදින්නංනත්ථි ආදිනා යන මෙහි ආදි ශබ්දයෙන්, නත්ථි යිට්ඨං නත්ථිහුතං නත්ථිසුකට දුක්කටානං කම්මානං ඵලං විපාකො නත්ථිඅයං ලොකො නත්ථි පරො ලොකො නත්ථිමාතා නත්ථිපිතා නත්ථිසත්තා ඕපපාතිකා නත්ථිලොකෙසමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යන දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි ගන්නේය — මෙකී මිථ්‍යාදෘෂ්ටි තොමෝ අතිශයින් මහත් වරදවේ, භේමෙස්සී, "නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි එවං මහාසාවජ්ජං යථායිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි මිච්ඡාදිට්ඨි භික්ඛවෙ පරමානිවජ්ජානි" යි — මහණෙනියම්මේ මිථ්‍යාදෘෂ්ටියක් ඇද්ද ඒ හා සමාන මහත් වරදවූ අනිකුදු එකම ධර්මකෙණෙක් මම නොදක්නෙම්, කුමක් හෙයින්ද; මවුන් මැරීමය, පියන් මැරීමය, රහතන් මැරීමය, බුදුන් ඇඟින් ලේ සෙල්වීමය, සංඝභෙදය, යනමේ පඤ්චානන්තරියකර්මය අතිශයින් මහත්වූ වරදය ඒ ආනන්තරිය කර්මයන්ටත්වඩා මිථ්‍යාදෘෂ්ටි කර්මයම අතිශයින් මහත් වරදය යන අදහසයි — ආනන්තරීය කර්මයන්ගේ පිරිසිඳිමෙක් ඇත. මිදීමේ කෙළවරක්ද පෙනෙයි නියත මිථ්‍යාදෘෂ්ටියෙහි පිරිසිඳිමෙක් නොපෙනේ ඒ වනාහි සංසාරයෙහි පැවැත්මට මුල්වන්නේය ඒ මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්විතයාහට භවයෙන් මිදීමෙක්නැත ස්වර්ගයද නිවන් මාර්ගයද ඔහට නොම ඇත්තේය, කල්ප විනාශ කාලයෙහි බොහෝ ජනයෝ බඹලොව උපදින කල්හිදු නියත මිථ්‍යාදෘෂ්ටිකතෙම එහි නොයිපද පිටිසක්වළ උපදී එය කල්පවිනාශක ගින්නෙන් දනකල්හිද ඒ මිසදිටුතෙම අහස එක් අවකාශයෙක්හි පැසෙන්නේමය — මෙවැනි දුෂ්ටවූ නපුරු මිසදිටු කල්පනාව කුමක්හෙයින් උපදීද.

Hosted by Google

,, අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව මිච්ඡාදිට්ඨි උප්පජ්ජති උප්පන්නා චෙව මිච්ඡාදිට්ඨිපවඩ්ඪතීති,, — මහණෙනි අයොසො මනස්කාරයෙන් හෙවත් රාගාදී කෙලෙස් සන්සිඳීමට හෙතුවූ කුශල මාර්ගයෙන් වෙන්වූ නොමග සිහිකරන්නාහට නූපන් මිථ්‍යාදෘෂ්ටි තොමෝ උපදී උපන්නාදවූ මිථ්‍යාදෘෂ්ටි තොමෝ වැඩෙ, මෙසේ නොමග සිහිකිරීමෙන් හටගන්නා මිසදිටු කල්පනාව මාතෘඝාතකාදී ආනන්තර්ය කර්ම්යටත්වඩා අතිශයින්ම බැරෑරුම් කර්මයක්බව නොයෙක් තැනදී වදාරණලදී — මිනිසත්බව ලැබූකල්හි ඇතිවන ආදීනව —

55

නිහීනාසුචි භොගෙසු රතො මනෙ, ජලොපිව
දුට්ඨරොගී කුදිට්ඨීව මිච්ඡාදිට්ඨිසයානරෙ.

මිසදිටු මනුෂ්‍යතෙම උපනුපන්තන්හි අධමවූ නොසකස්වූ භොගයෙහි ඇළුනේද නුවණම්දවූයේද එහෙයින්ම ජඩවූයේද දුෂ්ටවූ අසාධ්‍ය රෝගඇත්තේද නිහීනදෘෂ්ටි ඇත්තෙක්දවේ — එසේහෙයින් නියත මිථ්‍යාදෘෂ්ටිසංඛ්‍යාත දෙසැට දෘෂ්ටියෙන්වැලකා කම්මස්සක දෘෂ්ටියආදී සම්‍යක් දෘෂ්ටියෙහිපිහිටා සගමොක් සිරිසැප අත්පත් කටයුතු — මෙතෙකින් මනොදුශ්චරිතයනිමි.

---

## 19 නොකටයුතු කර්මක්ලෙශයෝ.

දෙලොව් සැපලැබීම කැමතිවූ ගිහිජනයන් විසින් නොකටයුතු කර්මක්ලෙශයෝ සතරදෙනෙක්වෙත් — ඒ කවරේද —

56

පාණාතිපාතො අදින්නාදානං මුසාවාදො ච වුච්චති
පරදාරගමනං චෙව නප්පසංසන්ති පණ්ඩිතා.

ප්‍රාණඝාතයයි කියනලද ගොඩදියවසන යම්කිසි සතෙක් දැනදැන තමන්විසින් මැරීම සහ

Hosted by Google

අනුන්ලවා මැරවීමද, අදත්තාදානයයි කියනලද වස්තුස්වාමියාවිසින් ප්‍රදුන් කුබාමගත්වූ මොනයම් දෙයක්වත් වංචාවෙන්වත් බලාත්කාරයෙන්වත් තමාවිසින් දැනදැන ගැණීම සහ අනුන්ලවා ගැණ්වීමද, පරදාරසේවනයයි කියනලද මව්පිය නෑසහෝදර ස්වාමිපුරුෂාදීන් විසින් ආරක්ෂාකරන්නාවූහෝ අවාහපිණිස නියමව සිටින්නාවූහෝ අන්සතු ස්ත්‍රීන්බව දැනදැනම ඔවුන් සමග අනාචාරයෙහි යෙදීමද, මුසාවාදයයි කියනලද තමන්නිසාවත් ඥාතිමිත්‍රාදී අනිකෙක් නිසාවත් යම්කිසි වස්තුවක් නිසාවත් දැනදැන බොරුකීමද අනුන්ලවාහෝ බොරුකියවීමද, යනමේ කාරණ සතරෙන් එකක්වත් පවත්වනඅය දෙලොවින්ම කිලිටුවෙන හෙවත් කෙලෙසෙන බැවින්ද උත්තම පණ්ඩිතයන්විසින් නින්දාකරණලද ක්‍රියාවල් බැවින්ද දෙලොවින්ම පිරිසිදුකම කැමති අයවිසින් මේ කාරණ සතරම නොකටයුතුය.

---

## 20 නොපැමිණියයුතු අගතිකාරණ.

57

ඡන්දදොසා භයාමොහා යොධම්මං අතිවත්තතිති
නිහියතිතස්ස යසොකාල පක්ඛෙව චන්දිමාඉති.

58

ඡන්ද,දොසා භයාමොහා යොධම්මං නාතිවත්තති
අපූරතිතස්සයසො සුක්කපක්ඛෙව චන්දිමාඉති.

ඡන්දයයි කියනලද ප්‍රේමය හෙවත් ආලයනිසාද, ද්වෙෂයයි කියනලද සිතෙහි නොසතුටුවූ තරහ නිසාද, භයයයි කියනලද තමන්ට අනතුරක් කරනයන භයනිසාද, මොහයයි කියනලද වරද නිවරද නොදන්නා කුසල් අකුසල් යනභේද නොදත් මෝඩකම්නිසාද, මේ කාරණ සත

Hosted by Google

රෙන් එකක්නිසාවත් සතරම නිසාවත් යම්කිසි
ශුක්ති විචාරීමකදීවත් සාක්ෂිකීමකදීවත් යමක්
බෙදාදීමකදීවත් අධර්මයක් කළොත් කීවොත්
අගතියට පැමිණ පව්කළාහමිශව්, මෙකියන අග
තිගාමීන්ගේ යසඉසුරු ප්‍රශංසාදිය කලුවර පක්ෂ
යෙහි සඳමඬලමෙන් මෙලොවදීම දිනෙන්දින
අඩුවෙනබවද පරලොවදීත් සතරඅපායටපැමිණ
මහත්දුක් විඳිනබවද දැනගතයුතු.……තවද
ඡන්දාගතාද්‍යාදි සතර අගතියට නොපැමිණියා
වූ එසින් අධර්මයක් අයුක්තයක් නොකරන්නාවූ
අයගේ යසඉසුරු සම්පත් ආදිය වැඩෙන පක්ෂ
යෙහි සඳමඬලමෙන් මෙලොවම වැඩෙනබවද
පරලොවදීත් දෙව්මිනිස් සැපලබන්ට පුළුවන්
බවද මෙසින් තේරුම්ගෙණ සියළු කටයුත්
තෙහිම සතර අගතියෙන්වෙන්ව ගතියෙහි
පිහිටීමෙන් දෙලොවින්ම සැපලබන්ට උත්සහ
කටයුතු.……

---

## 21. වස්තුවිනාශයටනිසිකාරණ.

“කතමානිච භොගානං අපායමුඛානි නසෙවති
සුරාමෙරය මජ්ජපමාදට්ඨානානුයොගොබොගහ
පතිපුත්තා භොගානං අපායමුඛං……පෙ……
ආලස්සානුයොගොබො භොගානං අපායමුඛං,,සී-
සුරාපානය කිරීම භොගයන්ගේ විනාශයට නිසි
කාරණයක, නොකාලයෙහි වීථිමාර්ගාදියෙහි ඇ
විදීම භොගයන්ගේ විනාශයට නිසිකාරණයක,
නැටීම් ගීකීම් ආදිය බලන්ටයෑමද භොගයන්ගේ
විනාශයට නිසි කාරණයක, දූක්‍රීඩාවෙහි යෙ
දීමද භොගයන්ගේ විනාශයට නිසිකාරණයක,
පාපමිත්‍ර සෙවනයද භොගයන්ගේ විනාශයට නිසි
කාරණයක, අලසකමෙහි යෙදීමද භොගයන්
ගේ විනාශයට නිසිකාරණයක……තවද මේ
කාරණයෙන් එක එක කාරණයෙහි දෝෂ හය
හයබැගින් මෙලොවම පැමිණෙන තිස්හයක්දෝෂ

නොහොත් වැරදිදක්වා තිබෙයි, එයින් සුරාපාන
යකිරීමෙන් පැමිණෙනවැරදිභාගයහම්…… "සන්දි
ට්ඨිකාධනංජානි කලහප්පවඞ්ඪිනී රොගානංආය
තනං අකිත්තිසංජනනී කොපිනං නිදංසනී
පඤ්ඤායදුබ්බලකරණී තෙවඡට්ඨං පදංභවති,,සී.
තමන්ගේ ගවධනරත්නාදී බොහෝවසතුව නිරර්
ථකයේ වියදම්වීමද, තමතමන්ගේ කුලගොත්‍ර
යද වයසද ජාතියද කාරණා දැනගත්තමුද කල්
පනාකර ගතනොහී නොයෙක් අයසමග හිස
කෙස් අත්ඇල්වීමෙන් ඔබර කරගැණීමද, ඇස්
ලෙඩ ආදීනොයෙක් රෝගයන්ගේ ඉපදීමට අය
තනයක් නොහොත් කාරණයක්බවද, දෙමව්පිය
ගුරුවර වැඩිසිටි සිල්වත් ගුණවත්අයට අක්‍රො
ශාදී නපුරුවචනකියා අසවලා මෙසේයයි දැන
ගත් බොහෝ දෙනාගෙන් නින්දාලැබීමද, මේ
මාගේ දෙමව්පියෝය අඹුදරුවෝය මේ සිල්වත්
ගුණවත් වැඩිසිටිඅයය මේ පණ්ඩිත සභාවයයි
යනමේ සියළුතැන්හි පවත්වන්ට සුදුසු ලැජ්ජා
භය දුරුවීමද, අනිත්‍යදුඃඛ අනාත්මවශයෙන්
පැවැත්වියයුතු ලෞකික ප්‍රඥාවඅඩුවීමද, යනමේ
සුරාපානය කිරීමෙහි මෙලොවම ඇතිවැරදි භය
හම්වේ…… නොකල්හි වීථිවල ඇවිදීමෙහි දෙ
භයනම්…… "අත්තාපිස්ස අගුත්තො අරක්ඛි
තොහොති පුත්තදාරොපිස්ස අගුත්තොඅරක්ඛි
තොහොති සාපතෙය්‍යංපිස්ස අගුත්තංඅරක්ඛිතං
හොති සංකියොචහොති පාපකෙසුඨානෙසු අභූ
තවචනංච තස්මිංරූහති බහූනංචදුක්ඛධම්මා
නංපුරක්ඛතොහොති,,සී…… නොකල්හි වීථිව
ලඇවිදින තැනැත්තානන් ආත්මය ආරක්ෂානොවී
මද, තමන්ගේ ප්‍රෙමණීය අඹුදරුවන් ආරක්ෂා
නොවීමද, තමන්ගේ ගවධන රත්නාදී වසතුව
ආරක්ෂානොවීමද, අනුන්විසින් කලසොරකම්
ආදියද දෙවෙනිදින අසවලා අසවලා කලායයි
දැනගතානොහී තමන්කෙරෙහි බොහෝදෙනා
සැකකිරීමද, අසත්‍යවචන තමන්කෙරෙහි ඇ

තිබීමද නොහොත් අනුන්කල වැරදි තමන් පිට නැගී දණ්ඩනිග්‍රහාදියට පැමිණීමද, අතිකුදු හිතකාය දෙකට පැමිණෙන බොහෝවූ දුකට මුල්වූ කාරණවීමද, යනමේ කාරණාසය නොකල්හි විථිසංචාරණයෙහි දෝෂයි—මෙහි කියනලද. නොකල්හි විථිසංචාරණයනම් කාරණයක් එලියක් නැතිව බොහෝ රෑ උනාසිත්පසු හුදකලාව ඇවිදීමයි—සෙල්ලම් බලන්ටයෑමෙහි සහ එය පැවැත්වීමෙහි දෝෂභයනම්—“කුවං නච්චං කුවං ගීතං කුවං වාදිතං කුවං අක්ඛානං කුවං පාණිස්සරං කුවං කුම්භථූනනති,,—යි සෙල්ලම්බලන අදහස්ඇති අය තමන්ගේ වැඩගත් කටයුතුතිබියදී නැටුම්බලන්ටයයි සොයායෑමද එසේම සින්දු කවි ගී ආදිය අසන්ට සොයායෑමද බෙරවීණ ආදිය පවත්වනතැන් සොයයෑමද සෙල්ලම්කරමින් දූ ක්‍රීඩාම කරණතැන් සොයායෑමද අත්පොළසන්දෙමින් සූරකාවඩිකෙළිතැන් සොයායෑමද කළ පිඹිමයයි කියනලද නාතිය බලන්ට සොයායෑමද යනමේ දෝෂභයයි, මෙසේ සෙල්ලම් බලන්ටයෑමෙන් තමන් අතනිබූදෙය ඒ ගැණ ඇඳුම් පැළඳුම් කෑම් බීම් පිණිස වියදම්වීමද කටයුතුවූ ගොවිකම් වෙළඳාම් ආදිය අතපසුවීමද බුදිමරා වෙහෙසුනුබැවින් තව දවසක් දෙකක් බුදියගැණීමෙන් තමන්ගේ කර්මාන්තපිරිහීමද රාගවෙෂාදි නොයෙක් පව්හිත් පහළවීමද වන්නේමය—

දුදු කාඩදූසිකෙළි ආදී සූදුක්‍රීඩාවෙහි දෝෂ භයනම්—“ජයංවෙරං පසවති ජිතො විත්තමනුසොචති සන්දිට්ඨිකාධනංජානි සභාගතස්සවචනං නරූහති මිත්තාමච්චානං පරිභූතොහොති ආවාහ විවාහකානං අපත්ථිතොහොති අක්ඛධුත්තො පුරිසපුග්ගලො නාලංදාර භරණායාති,,—යි— සූදුවෙන් පැරදුනුඅය තමන්කෙරෙහිම වෛරබැඳීමෙන් තමන්ම අනතුරු කරගන්නාබවද, සූදු

වෙන් පැරදුනුකල්හි සිතින් ශොකකාරණ බවද ගොසිකම් වෙලඳාම් ආදිය කරන්ට අවකාශනොලැබීමෙන් සහ සැපෙව් වස්තුව සූදුවගැණ වියදම්වීමෙනුත් ඉහාත්මයෙහිම දුප්පත්වීමද, සභාවකදී සාක්ෂිවශයෙන් කියනලද වචනය සැබෑනොවනොගණීමද, මිත්‍රයන්ගේ සහ අමාත්‍යයන්ගේද හෙවත් මූලැදෑනි වරුන්ගේද සිත ඔහු කෙරෙහි විශ්වාස වශයෙන් නොපිහිටීමද, සූදුවකාරන්නාහට සූදුකාරයයි කියා වැදගත් කුලයකින් සරණසත්‍රියක්පාවාදෙන්ට කැමතිනැතිබවද, සහ මේ දූකෙලියේ දොෂභයයි—පාපමිත්‍ර සෙවනහි දොෂභයනම්—“යෙධුත්තා යෙසොණ්ඩායෙපිපාසා යෙනෙකතිකා යෙවචනිකා යෙසාහසිකා තස්සමිත්තාහොන්තිතෙසහායා,,යි—

පාපමිත්‍රසෙවනායෙන් යුක්තවූ පුරුෂතෙම සූදුක්‍රීඩාවෙහි නියුක්තඅය සමග මිත්‍රවීමද, වෛශ්‍යාක්‍රියාවෙහි යෙදෙන අය සමග මිත්‍රවීමද, සුරාපානය කරන්නවුන් සමග මිත්‍රවීමද, අභිමුඛයෙහි මෙනව් දෙයක්දෙමි කරමිකියා අනභිමුඛයෙහි වචාකරණ නෛකතිකයන් සමග මිත්‍රවීමද, තඹ ලෝආදිය රන් රිදීකොට අඟවන අභිමුඛ වචනිකයන් සමග මිත්‍රවීමද, මිනි මැරීම් මන්පැහැරීම්ආදී සාහසිකක්‍රියා කරන්නවුන් සමග මිත්‍රවීමද, යනමේ සදෙනා සමග මිත්‍රවීම දෙලොවින්ම මහත්වූ විනාශයට කාරණ බැවින් මෙකී ෂට්කාරණ අසත්පුරුෂයන් සමග මිත්‍ර නොවියයුතු—කුහිතවූ කම්මැලිකමෙහි දොෂභයනම්—“අතිසීතන්තිකම්මංනකරොති අතිඋණ්හන්ති කම්මංනකරොති අතිසායන්ති කම්මංනකරොති අතිපාතොති කම්මංනකරොති අතිජාතොස්මීති කම්මංනකරොති අතිධාතොස්මීති කම්මංනකරොති තස්සඑවංකිච්චාපදෙස බහුලස්ස විහරතො අනුප්පන්නා චෙවභොගානුප්පජ්ජන්තිඋප්පන්නාවභොගාපරික්ඛයංගච්ඡන්ති,,—යි.

කුෂීත කම්මැලි නැනැත්තා දැන් ඉතා ශීතයයි කියාත් කර්මාන්ත නොකරේ, දැන් ඉතා උෂ්ණවූ අව්වයයි කියාත් කර්මාන්ත නොකරේ, දැන් ඉතා සවස්වූයේයයි කියාත් කර්මාන්ත නොකරේ, දැන්ඉතා උදෑසනයයිකියාත් කර්මාන්ත නොකරේ, දැන්ඉතා බඩගිනියයිකියාත් කර්මාන්ත නොකරේ, දැන් ඉතා බඩපිරුනේයයිකියාත් කර්මාන්ත නොකරේ, යනමේ කුෂීත කමෙහිදෝෂ හයයි. මෙවැනි කුෂීතපුද්ගලතෙම තමන් විසින් කටයුතුවූ ගොවිකම් වෙළඳාම් රජකාරි ආදිවූ දේවල් අතපසු කිරීමෙන් වසත්තා හට නූපන් භොගයෝ නොමඋපදිත්ද උපන් භොගයෝ විශදම්වීමටයත්ද, මෙසේවූ පුද්ගලතෙම නොබෝකලකින් මෙලොවදීම වස්තුවෙන් හීනභාවයට පැමිණ ජීවත්වීමපිණිස නොයෙක් නොකටයුතුදෑ කිරීමෙන් හැසිරි මෙලොවත් මහත් නින්දාවට පැමිණ කිසි කුශලයක් සිඩකරගත්ටත් බැරිව් පරලොවදීත් මහත් දුකට පැමිණේත් නේමය—තවද වස්තු විනාශය පිණිස හෙතුවූ ෂඩ්විධකාරණයන් අතුරෙහි එකඑක කාරණයෙහි දෝෂහය හය බැගින් සතියක් ප්‍රභෙදවූ මෙම කාරණහය දෙලසක් වගයෙන් ගාථාවලින්ද දක්වා වදාරණසේක්—

59

උස්සූරසෙය්‍යා පරදාරසෙවනා
වෙරප්පසංගොච අනත්ථතාච
පාපාචමිත්තා සුකදරියතාච
එතෙපඨානා පුරිසං ධංසයන්ති.

ඉර උදාවනතෙක් සයනකිරීමද, පරස්ත්‍රීසෙවනයද, අනුන් සමග වෛර කිරීමද, අනුන්ට අනර්ථ කිරීමද, අසත්පුරුෂයන් සමග මිත්‍රවීමද යමක් දෙන්ට සිත නැතිතාද මසුරුබවද, යනමේ සවදෑරුම් කාරණයෝ සත්වයා දෙලොවෙහිදීම විනාශයට පමුණුවන කාරණයෝයි—

Hosted by Google

60

අක්ඛිත්ථියොවාරුණී නච්චගීතං
දිවාසොප්පංපාරි චරියාඅකාලං
පාපාංචමිත්තාසු කදරියතාච
එතෙඡට්ඨානාපුරිසං ධංසයන්ති.

ද්‍යූතකෙළියද, පරස්ත්‍රී සෙවනයද, සුරාපානයකිරිමද, නැටීම් ගී කීම්ආදී සෙල්ලම් කිරීම සහ එය බලන්ට යෑමද, දහවල් බොහෝසෙයින් නිදීමද, රාත්‍රිගතව නොකාලයෙහි පාරවල ඇවිදීමද, අසත්පුරුෂයන්සමග මිත්‍රවීමද, යමක් දෙන්ට සිතනැති තද මසුරුකමද, යනමේ සවදෑරුම් කාරණයෝද සත්වයා දෙලොවෙහිදීම විනාශයට පමුණුවන කාරණයෝයි.

---

22 සෙවනයනොකටයුතු අමිත්‍රයෝ.

61

අඤ්ඤදත්ථුහරොමිත්තො යොචමිත්තොවචීපරො
අනුප්පියංචයොආහ අපායෙසුචයොසඛා,

තමන් මිතුරෙක්වෙත පැමිණ එකාන්තයෙන් කිසිවක් ගෙණයන්නාම්වූ අදහස් ඇති අඤ්ඤදත්ථුහර නම් මිත්‍රයාද, මෙනම් දෙයක් දෙමි කරමි-යි, වචනයෙන් සංග්‍රහකොට ඒ දෙය නොකරණ වචීපරම නම් මිත්‍රයාද, කුශල්කරමු කී කල්හි ඊටත්, අකුශල් කරමු කී කල්හි ඊටත් මැනවැයි කියා එකඟවන්නාවූද, මිතුරාගේ අභිමුඛයෙහි ගුණ කියන්නාවූද, අනභිමුඛයෙහි අගුණ කියන්නාවූද, මේ සතරකාරයෙන් යුක්තව වචන කියන්නාවූ-අනුප්පිය භාණී මිත්‍රයාද, සුරාධූර්ත ස්ත්‍රීධූර්ත ආදී වස්තු විනාශයට හෙතුවූ ක්‍රියාවලට එකඟකාරගන්නාවූඅපාය සහාය මිත්‍රයාද

62

එතෙඅමිත්තෙචත්තාරො ඉතිවිඤ්ඤායපණ්ඩිතො
ආරකාපරිවජ්ජෙය්‍ය මග්ගංපටිභයංයථා-ඉති,

Hosted by Google

මේ අමිත්‍රයින් සතරදෙනාම දෙලොව විනාශයක්ම කැමතිඅය බව නුවනින් දැනගත් පණ්ඩිතතෙම දිවි වලස් ආදීන්ගෙන්යුක්තවූ විෂම මාගීයක් මෙන් කල්පනාකොට ඔවුන්ගේ ආශ්‍රයෙන් දුරින් දුරුවන්නේය.

---

## 23 සෙවනයකටයුතු මිත්‍රයෝ.

68

උපකාරොචයොමිත්තො යොචමිත්තොසුඛෙදුඛෙ
අත්ථක්ඛායීච යොමිත්තො යොචමිත්තානුකම්ප
කො.

යමකින් සිහිමුළාවී ඒ ඒ තැන වැටී හිඳිනා තමන් මිත්‍රයා ආරක්ෂාකරගැණීමද, රෝගාතුර කමකින්හෝ තොරටයැම්ආදී යමකින්හෝ පමාවූ මිතුරාගේ දූ දරුවන් සහිත ගව ධනරත්නාදී වස්තුව ආරක්ෂා කිරීමද, භයක් පැමිණිවිට මා වැනි මිත්‍රයෙකු සිටියදී භය නොගණුවයි කියා සිත සනහමින් පිහිටවීමද, කටයුත්තක් පැමිණිකල්හිද යමක් ඉල්ලූවිටද ඊට විගුණයක්දීමද, යන මේ සතර කාරණයෙන් තමහට උපකාර ඇති උපකාරි නම් සුහෘද මිත්‍රයාද, තමාගේ රහස මිතුරාට නොසඟවා කීමද, ඔහුකී රහස් කිසිවක්හටත් නොකීමද, වස්තු විනාශාදි අපද වක් පැමිණිවිටක මිත්‍රයා අත්නොහැරීමද, යම් කාදී තමාගේ ජීවිතය පවා මිත්‍රයා උදෙසා දෙන්ට කැමතිවීමද, යන්‍රාමේ සතර කාරණයෙන් සැප දුක් දෙක්හි සමව පවත්නා සුහෘද මිත්‍රයාද, තමන්ගේ මිත්‍රයා ප්‍රාණඝාතාදී පාපයෙන් වලක්වන්නේද, දානශීලාදී කුශලයෙහි යොදවන්නේද, පෙර නොඇසූ යහපත් කාරණයෙන් යුත් ධර්මය අස්වන්නේද, මිත්‍රය මේ කුශල්කොට ස්වර්ගීයටයා යුතුයයි දෙව්ලොව්ගාමිමාර්ගීය කියන්නේද, යන මේ සතර කාරණයෙන් යහපත් වැඩක්ම කියාදෙන අත්ථක්ඛායීනම් සුහෘද මිත්‍රයාද, තමන්

මිත්‍රයාට අලාභයක් දුකක් පැමිණුනායයි දුටු ඇසූ පමණකින් කණගාටුවීමද, ලාභයක් සැපක් පැමිණුනායයි දුටු ඇසූ පමණකින් සතුටුවීමද, මිතුරාගේ අගුණයක් කියනවා ඇසූ විටක මගේමිතුරා ඔබඳුනොවෙයි මෙසේ නොකියවයි කියාඅගුණ කීම වැලැක්වීමද, ගුණයක් කියනවා ඇසූවිටක ඒ ගුණ එසේමයයි තමනුත් ඊටඑකඟව ප්‍රශංසා කිරීමද, යන මේ සතර කාරණයෙන් අනුකම්පා කරණ අනුකම්පකනම් සුහෘද මිත්‍රයාද ~~~

64

එතෙපිමිත්තෙචත්තාරෙ ඉතිවිඤ්ඤාය පණ්ඩිතො
සක්කච්චංපයිරුපාසෙය්‍ය මාතාපුත්තංවඔරසං.

මේ හොඳ හිත්ඇති මිත්‍රයන් සතරදෙනායයි පණ්ඩිතතෙම නුවණින් දැන හැඳින මව්පියන්වෙතට පැමිණෙනලද ප්‍රියපුත්‍රයෙකු මෙන් ආදර ගෞරවයෙන් මෙබඳු මිත්‍රයන් සේවනය කරන්නේය.

---

## 24 ආරක්‍ෂාකටයුතු සදිශාවෝ.

65

මාතාපිතාදිසාපුබ්බා ආචාරියාදක්ඛිණාදිසා
පුත්තදාරාදිසාපච්ඡා මිත්තාමච්චාචඋත්තරා.

66

දාසකම්මකරාහෙට්ඨා උද්ධංසමණබ්‍රාහ්මණා
එතාදිසානමස්සෙය්‍ය අලමත්තොකුලෙගිහී.

මව්පිය දෙදෙන පූර්වොපකාරී බැවින් පූර්වදිශා භාගය හෝහොත් නැගෙණහිර දිශා භාගය වැන්න, ගුරුන්වහන්සේලා පූජාසත්කාරාදියට සුදුසුහෙයින් දකුණුදිශාභාගය වැන්න, අඹුදරුවෝ පසුව සිටිනා බැවින් බස්නාහිර දිශාභාගය වැන්න, මිත්‍රයන්හා අමාත්‍යයෝ ඒ ඒ දුකින් එතරකරණහෙයින් උතුරුදිශාභාගය වැන්න, දාසිදාස් කම්කරුඅය යටත්ව සිටිනාබැවින් යටදිශා

Hosted by Google

භාගය වැන්න, ශ්‍රමණ බ්‍රාහ්මණයන්වහන්සේලා ගුණයෙන් උස්ව සිටිනාහෙයින් උඩ දිශාභාගය වැන්න, මෙසී සදිශාවෙන් දෙලොවම අනතුරු නොවෙනලෙස යථොක්තප්‍රකාරයෙන් පැවතීම් වශයෙන් නමස්කාර කරන්නේවීනම් අඹුදරුවන් පෝෂ්‍යයකොට ගිහිගෙයි වාසයකරන්ට සමත්වූව න්නේය——නැගෙණහිර දිශාභාගයවැනි මව් පියන්ට දරුවන්විසින් කටයුතු පචොපකාර නම්.

"භතො නෙ භරිස්සාමි කිච්චංනෙසං කරිස්සාමි කුලවංසං ඨපෙස්සාමි දායජ්ජංපටිපජ්ජාමි අථව පනපෙතානං කාලකතානං දක්ඛිණං අනුප්පද ස්සාමි,,—යි——මම වනාහි මගේ මව්පියන් විසින් කිරිපොවා අත්පනඩා මුඛයෙන් කෙල කුණු පහ කොට නානවා සරසා වඩනලද්දෙම් මම දැන් වැඩිමහළුව එහෙයින් මව්පියන් අත් පා මැඩීම් හැහැවීම් කැඳ බත්දීම් ආදීන් පෝෂ්‍යය කරන් නෙම් සිනා මව් පියන් පෝෂ්‍යය කරන්නේද, මාගේ කටයුතුහැර මව්පියන්ට රජකුලාදියෙහි පැමිණි කටයුතු කරම්සි, සිනා මව්පියන් පිළිබඳ කටයුතු කරන්නේද, මව් පියන් පිළිබඳ කෙත් වත් රන් රුවන් ආදිය නොනසා රක්නෙම් සිනා දූකෙළිම් ආදියෙන් එය නොනසා රකින්නේද, මව් පියන්ගේ යහපත් අවවාදයෙහි පවත්නා රුවෝ කුල සන්තක වස්තුවට හිමිකරන් නාහ මම වනාහි ඔවුන්ගේ අවවාද පිළිගැ ණීමෙන් දායාදයට හිමිවෙම් සිනා එලෙස පිළි පදින්නේද, නැවතද වනාහි කාලක්‍රියාකරණ ලද දෙමව්පියන් උදෙසා දන් පිළිගන්ට නිසි ගු ණවතුන් කෙරෙහි දන්දී පින් දෙන්නෙමි-යි,සිනා කාලක්‍රියාකළ මව්පියන්ට එසේ පින් දෙන්නේද, යනමේ පස්ආකාරයෙන් දරුවන් විසින් පූර්වදිශා භාගය වැනි දෙමව්පියන්ට සත්කාර කටයුතු.

---

මව්පියන් විසින් දරුවන්ට කටයුතු
පචොපකාර නම්,

"පාපානිවාරෙනති කලඍාණෙනි වෙසෙනානි

Hosted by Google

සිප්පංසික්ඛාපෙනති පතිරූපෙනදාරෙනසංයො ජෙනති සමයෙදායජ්ජංනිය්‍යාදෙනති,,සී—

ප්‍රාණඝාතාදි පාපයෙන් මෙලොව් පරලොව් වන් නාවූ ආදීනවකියා දරුවෙනි මෙසේ නොකර වයි පාපයෙන් වලක්වන්නාහුය, ගඟඩාද කරන් නාහුය, අතෙන් පිඩුමහ සිටහුමෙන් අත්ලස් දීමෙන්වත් ශීලාදි කුශල්කිරීමෙහි යොදවන්නා හුය, තමන්ගේ අවවාදයෙහි පිහිටිබව දැන කුල පරම්පරාගත මුද්‍රාගණනාදි ශිල්පයෙහි හික් මවන්නාහුය, කුල ශීල රූප යෞවනාදීන් සමා නාවූ කුමාරිකාවක් ගෙණවුත් සරණකොට පාවා දෙන්නාහ, සමයෙහි දායාද දීම නම් සත්‍රයෙහි වස්තුදීමයි, හෙදනිත්‍යසමය කාලසමයයි දෙවදෑ රුම්වේ, ඒ ඒ ප්‍රස්තාවට මේ මේ දෙය ගණුව මේ තොපට වියදම්ටය මෙයින් කුශල් කරන්ටයයි කියා දෙන්නේ නිත්‍යසමය නම්වේ ශිල්ප උගත් නා සමයෙහිද අවාහ විවාහ කාලයෙහිද මේදෙ යගෙණ කුශල් කරවයි කියා මරණසන්න කාල යෙහිද යම්කදීම කාලසමය නම්වේ මේ ක්‍රම යෙන් මව්පියන් විසින් දරුවන්ට දායාද දියයුත්තා හුය ඍහමේ පස්ආකාරයෙන් දෙමව්පියන් විසින් දරුවන්ට උපකාර කටයුතු—

---

දකුණු දිශාභාගය වැනි ගුරුවරයින්ට ශිෂ්‍යයින් විසින් කටයුතු පරොපකාර නම්.

„උට්ඨානෙනඋපට්ඨානෙන සුස්සූසායපාරිචරියාය සක්කච්චංසිප්ප පටිග්ගහණෙන,,සී—

අතවැස්සාවිසින් ආචාරීන් එන්නා දුරදීම දැක හුනස්නෙන් නැගිට පෙරගමන්කොට අත තුබූ පිරිකර ගෙණනබා පය සොධා අසුන් පනවා වඩා හිඳුවා පවන්සලා සුවදුක් විචාරමින් වත්කිරීමද අකුරු කියවාගන්නා වේලාවල් හැර දවස තුන් වටක් ගුරුන්කරා එළඹ උපස්ථාන කිරීමද ගු රුන් විසින් කියනලද ඔවාදනොපුල් ඇදහිලිවන් නව ආදර ගෞරවයෙන් ඇසීමද අත වැස්සා

Hosted by Google

විසින් උදෑසනම නැගිට ආචාරීන්ට මුවදෝනා පැන්ද දැහැටිදඬු ආදී අනුභවකරණකල්හිද පැන්දීම්ආදිය කටයුතු මෙසේ පාරිචරණයකිරීමද එකවරක් කියවාගත් දෙය බොහෝවාරගණන් කීමෙන් යහපත්කොටපාඩම්දී ශිල්පපිළිගැණීමද නොහොත් ඉගණගැණීමද යන මේ පස්ආකාරයෙන් ගෝලයින් විසින් ගුරුවරයින්ට උපස්ථාන කටයුතු.

---

## ගුරුවරයින් විසින් ගෝලයින්ට කටයුතු ප්‍රත්‍යුපකාර නම්.

“සුවිනීතංවිනෙන්තිසුග්ගහිතංගාහාපෙන්තිසබ්බං
සිප්පංසුතසමක්ඛායිනොචභවන්ති මිත්තාමච්චෙසු
පටියාදෙන්තිදිසාසුපරිත්තාණංකරොන්ති,,—සී.

තොප විසින් මෙසේ ඉඳීම් සිටීම් කටයුතුය මෙසේ කෑම්බීම් කටයුතුය සුරාපානාදියකාරණ පාපමිත්‍රයන් සෙවනය නොකටයුතුයයි යනාදීන් අවවාද දීමෙන් ගෝලයා යහපත්ව හික්මවීමද ගෝලයා යම් ලෙසකින් මනාව ශිල්ප ඉගණගණීද එපරිද්දෙන් යහපත්වම කාරණ කියාදී උත්සහයෙන ඉගැන්වීමද පෙර තමන් ආචාරීන්ගෙන් අසා දැනගත් සියළු ශිල්පම කියාදී නොසඟවා ඉගැන්වීමද මේ මාගේ අතවැසියතෙම ව්‍යක්තය බහුශ්‍රැතය ප්‍රාඥය සමානයයිකියා මිත්‍රාමාත්‍යයන් අතරේ ප්‍රසිද්ධකිරීමද තමන් අතවැසියතෙම වාසයකරණ දිශා වැසියන් විසින් ආචාරීන්වෙත ප්‍රශ්නයක් ගෙණ ආවිට ඒ දිශාවෙහි වසන අසවලා මාගේ අතවැසිය මේ ශිල්පයෙහි අප දෙදෙනාගේ දැනීමෙහි වෙනසක්නැත එහි ගොස් විචාරා දතුවයි කියා ඒ ඒ දිග ආරක්‍ෂා කිරීමද, යන මේ පස්ආකාරයෙන් ගෝලයින්ට ගුරුවරයින් විසින් උපකාර කටයුතු.

ස්වාමි පුරුෂයාවිසින් බස්නාහිර දිශාභාගයවැනි ස්ත්‍රීන්ට කටයුතු පච්චොපකාර නම්

“සම්මානනාය අවමානනාය අනතිචරියාය ඉස්සරිය වොස්සග්ගෙන අලංකාරානුප්පදානෙනාති,,යි

තමන්ගේ භාර්‍ය්‍යාවට දෙවමැනියෙනි, තිස්සමැනියෙනි භද්‍රාවෙනි යනාදී ප්‍රිය වචනයෙන් කථා කිරීමද දාසි දාස් කම්කරුවන්ට මෙන් පරිභව වචන බිණීමෙන් තාඩන පීඩන වධ බන්ධනාදිය නොකිරීමද තමන්ගේ භාර්‍ය්‍යාව ඉක්මවා අන් භාර්‍ය්‍යාවක් සේවනය නොකොට අනතිචාරිවීමද ස්ත්‍රීහුනම් මේළපලඳනාව සමාන ආභරණ ලැබුවත් හැන්දගෙණ බත් විචාරීම නොලබන්නීනම් ඈ නොමෝ නොසතුටු වන්නීය එහෙයින් මාගේ ගෙයි සියළු ඉසුරුම තොප කැමති පරිද්දෙන් අනුභවකොට ආරක්ෂාකරවයි කියා භත්තපරිවිසනාදී තමන්ගේ ඉසුරු සම්පත් ස්ත්‍රීට භාරදීමද තමන්ගේ සම්පත් පරිද්දෙන් නොනොත් පොහොසත්තරමට ස්ත්‍රීට සුදුසුවූ හස්තාභරණ ග්‍රීවාභරණාදී ඇඳුම් පැලඳුම් සපයාදීමද යනාදීමේ පස් ආකාරයෙන් ස්වාමියාවිසින් තමන්ගේ ස්ත්‍රීට උපකාර කටයුතු—

---

ස්ත්‍රී විසින් ස්වාමියාහට කටයුතු පච්චොපකාරනම්,

“සුසංවිහිතකම්මන්තාචහොති සුසංගහිතපරිජනාච අනතිචාරිණීච සම්භතංඅනුරක්ඛති දක්ඛාචහොතිඅනලසාසබ්බකිච්චෙසූති,,යි—

කෑඳබත් පිසනකාලාදිය නොඉක්මවා ඒ ඒ ආහාරපාන සූප ව්‍යංජනාදිය රසවත්කොට ආදර ගෞරවයෙන් සාදා දීමද ස්වාමියාගේද තමන්ගේද නෑයන්ට සහ මිත්‍රයන්ටද පිරිවර වැඩකාර

දුසි දසාදීන්ටද ආදරයෙන් යහපත්ව සංග්‍රහ කිරීමද තමාගේ ස්වාමියාහැර අන් පුරුෂයෙක් සිතින් වත් නොපැතීමද ගොවිකම් වෙළදාම් ආදී යමකින් ස්වාමියා විසින් ගෙට රැස්කරණලද ධනධාන්‍යාදි වස්තු සුරාපානාදිය පිණිස නිරර්ථකව වියදම්නොකර ප්‍රවෙසම්කොට තැබීමද කැඳ බත් සූප ව්‍යංජනාදිය සම්පාදනය කිරිමෙන් හා තුල් කැපීම් විසීම් මැසීම් ආදී සියළුසත්‍ය කටයුත් තෙහි ඉතා සමර්ථව තමන් විසින් කටයුතු දෙයෙහිද අනුන්ලවා කරවිය යුතුදෙයෙහිද නොකම්මැලිව නැගී සිටිනා වීර්‍ය්‍ය ඇතිවීමද යන මේ පස්ආකාරයෙන් සත්‍රිවිසින් ස්වාමියාහට උපකාර කටයුතු—

---

උතුරු දිශාභාගයවැනි මිත්‍රයන්සහ අමාත්‍යයන්ටත් කටයුතු පචොපකාර නම්:

“දානෙනපෙය්‍යාවජ්ජෙනඅත්ථචරියාය සමානත්ත තායඅවිසංවාදනතායාති,,-සී—

තමන්ගේ ගෙදොරට මිත්‍රයන් සහ ඇමතියන්ද පැමිණිකල්හි ආහාරපාන වස්ත්‍රාදිය දීමෙන් ආදර ගෞරව ඇතිව සංග්‍රහ කිරීමද ගෞරවයෙන් ඉඳුම් හිටුම්දී වනාවත් කිරිමෙන් ප්‍රිය වචන කථා කිරීමද ඔවුන්ට ලාභයක් ලැබීමට නිසි යමක් පැමිණිවිටක ඒට පසුනොබැස ජීවිතගල්ව වීර්‍ය්‍ය කිරීමද සුවදුක් වශයෙන් තමන් සමකොට සිතීමද ඔවුන් විසින් යමක් කරව යමක් දෙවයි කී කල්හි එය බැරිය නැත්තැයිකියා වංචා නොකිරීමද යනමේ පස්ආකාරයෙන් මිත්‍රයන්ට සහ මූලාදෑනි වරුන්ටත් සෙසුඅය විසින් උපකාර කටයුතු:

---

මිත්‍රයන් සහ මූලාදෑනීන් විසින්ද සෙසුඅයට කට යුතු ප්‍රත්‍යුපකාර නම්:

“පමත්තංරක්ඛන්තිපමත්තස්සසාපතෙය්‍යංරක්ඛන්ති භීතස්සසරණංහොන්ති ආපදාසුනවිජහන්ති අපරපජංචස්සපටිපූජෙන්ති,,-සී—

Hosted by Google

යම් අපදුවක් පැමිණ දුකින් සිහිමඳව වැටිඋන් අය සම්පයේහිද ආරක්ෂා කිරීමද තොරටක යෑම් රෝගාතුර වීම් ආදී යමකින් පමාවූ අයගේ අඹුදරුවන් සහ ගවධන රත්නාදී වස්තුව ප්‍රවෙසම් කිරීම්ද රාජ චොර ශත්‍රු ආදීන්ගෙන් යම් කිසි භයක් පැමිණිකල්හි තොපි භයනොගණු වසිකියා ඊට පිහිටවීම්ද භවභොගාදී වස්තු හානියකින් අපදුවක් පැමිණිකල්හි අත්නොහැර උපකාරවීමද ඔවුන්ගේ දූදරුබුණුපුරු ආදී අපර පුජාවට ආවාහ විවාහාදි මංගල්‍යයක් පැමිණිවිට ඔවුන්ට සුදුසු ත්‍යාගදීම්වශයෙන් සංග්‍රහ කිරීමද යනාමේ පස්ආකාරයෙන් මිත්‍රයන් සහ මුළාදෑනින් විසින්ද සෙසු අයට උපකාර කටයුතු.

---

### යටි දිශාභාගය වැනි දාස කම් කරු පුරුෂාදීන්ට ස්වාමියා විසින් කටයුතු පංචොප කාරනම්

"යථාබලංකම්මන්තසංවිධානෙන භත්තවෙතනානුප්පදානෙන ගිලානුපට්ඨානෙනඅච්ඡරියරසානං සංවිභාගෙන සමයෙවොස්සග්ගෙනනාති,,සී.

තරුණයන්විසින් කටයුතුද මහල්ලන් ලවාද මහල්ලන්විසින් කටයුතුද තරුණයන් ලවාද ස්ත්‍රීන් විසින් කටයුතුද පුරුෂයන්ලවාද පුරුෂයන්විසින් කටයුතුද ස්ත්‍රීන් ලවාද නොකරවා ඔවුන්ගේ කායබලද සුදුසුඅන්දම්ද ස්වාමියාවිසින් කල්පනා කොට දාසි දාසාදීන්ට කර්මාන්ත නියම කිරීමද ඔවුනොවුන්ගේ හිංසිය සහ එකලාව ඇඳිදින් ගෙනක් බවද දූදරුවන් බොහෝ බවද කල්පනා කර ඊට සුදුසු පඩිඅදෙන් වැටුප් දීමද රෝගාතුරයන් හා වයසාවෘද්ධයන් ලවාත් කර්මාන්ත නොකරවා ඔවුන්ටසුදුසු කෑඳබත් බෙහෙත්ආදිය සපයා දීමද තමන්ට අනුභව කිරීමට යහපත් රසවත් දෙයක් ලැබුනුවිට ඊට මසුරුනොවීමද මඳවත් ඔවුන්ටත් බෙදාදී අනුභව කිරීමද

Hosted by Google

විචාරා දැනගතුම්හයි නික්මුණෝය— මේ භි
ක්ෂූන් තුන්පක්ෂයම අතරමගදී එකතුව භාග්‍ය
වතුන්වහන්සේ කරා ගොස් වැද එකත්පස්ව
හිඳ තමතමන් දුටුකාරණ පිළිවෙළින් විචාළාහු
භාග්‍යවතුන්වහන්සේද ඒ ඒ කර්ම්යන් පිළිවෙළින්
වදාරණ සේක්— ඉකුත් කාලයෙහි බරණැස්
ඝීසාහා එක් කෘෂිකයෙක් තමන්ගේ ගොණෙක්
හීයට අකීකරුව මදක්තැන් ගොස් නිතරම වැ
දහෝහා බැවින් ඌ කෙරෙහි කෘෂිකතෙම උර
ණව මෙවක් පටන් සුවසේවැද නිදවයි කියා පිදු
රු සුඹුළුවක් මෙන් තළා පොඩිකොට පිදුරුවෙ
ළා ගිනිලා මැරුයේය, හේ තෙම ඒ විපාක
යෙන් බොහෝකල් අපායෙහි දුක්විඳ කර්මාව
ශේෂයෙන් සත් වරක් කවුඩු යොනියෙහි ඉපිද
මෙලෙසින්ම ගෙවලවැද ගත් ගින්නෙන්ම අහ
සදී දැ මලේයයි කවුඩාගේ පවත්වදාළසේක—
මූහුදු බත්වූ ස්ත්‍රීතොමෝද තමා කළ කර්ම
යෙහි විපාක වින්දීය, ඈ තොමෝ ඉකුත් කාල
යෙහි බරණැස එක් කෙළඹියෙකුට භාර්‍ය්‍යා වී
පැන් ගෙනීම් වී කොටීම් බත්පිසීම් ආදී සියළු කටයු
තු තුමූම කරන්නී; එහි වසන එක් සුනඛයෙක් ඈ
විසින් කරණ සියළු කටයුතුම බලමින් හිඳිනේය
කෙතට බත්ගෙණ යන්නීද දුර පැන් පිණිස ව
නයට යන්නීද සුනඛතෙම ඈ සමගම යන්නේය
ඒ දුටු මනුෂ්‍යයෝ එඹා බළුවැද්දීය දඩයන්පිණි
ස නික්මිද අද දඩමස් හා බත් කනු කැමති විදැයි
උපපීඩණය කරන්නෝය ඈ ඔවුන්ගේ කථාවෙන්
ලැජ්ජාව් දඬු පත් ආදීන් තළා සුනඛයා අඹවන්
නීය සුනඛතෙම්ද මදක් රඳා සිට නැවතත්
ඒ ස්ත්‍රීය කරාම එන්නේය මිට කාරණ කවරේද
යත්, සුනඛතෙම මිට තුන්වෙනි අත්බැවෙහි ඈට
ස්වාමිව ඉපිද ඈ කෙරෙහිගත් සෙනහය මුදන්ට
නොහැකිව එම් ගෙයි සුනඛව ඉපිද මෙසේ ඈ
පසුපස්සෙනි යන්නේය, ඈ තොමෝ එක් දිනක්
සුනඛයා කෙරෙහි කොපව් සතුටුආකාරයෙන්

Hosted by Google

යෙන් කරණලද මෛත්‍රී කායකර්ම්මයෙන් යුක්තබවද, පිණ්ඩපාතයෙහි වැඩිය භික්ෂූන්දැක සතස්ව කැඳබත් දෙවයි කීමද සාධුකාරදී සතුටුව බණඇසීමද ආදරයෙන් පිළිසඳර කථාකිරීම් යනාදී මෛත්‍රීවාක් කර්ම්මයෙන් යුක්තබවද, අපගේ කල්‍යාණමිත්‍රවූ කුළුපග ස්ථවිරයන් වහන්සේලා නිදුක් නිරෝගිව සුඛී සුවපත්වෙත්වයි යනාදී මෛත්‍රී මනොකර්ම්මයෙන් යුක්තබවද, සිල්වත් ගුණවත්අය තමන් ගෙදෙරට පැමිණි කල්හි ඇතිදෙයක් නැතැයිනොකියා මසුරුකම නැමති දොර නොවසා කැපකරුවීම් ආදී වශයෙන් දියයුතුදෙයදීමද, පෙරබත් කාලයෙහි වැළදීමපිණිස දියයුතු ආමිසයන් එළඹීමද, යනමේ පස්ආකාරයෙන් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ප්‍රත්‍යදයකයන් විසින් උපකාර කටයුතු.

## ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් ප්‍රත්‍යදයකවරුන්ට කටයුතු උපකාර සයනම්.

“පාපානිවාරෙන්ති කල්‍යාණෙනිවෙසෙන්ති කල්‍යාණෙනමනසා අනුකම්පන්ති අස්සුතංසාවෙන්ති සුතං පරියොදපෙන්ති සග්ගස්සමග්ගං ආචික්ඛන්ති,,යි.

ප්‍රාණඝාතාදි පස්පව් දශඅකුසල් කිරීමෙහි දෙලොවම ඇතිවැරදි ප්‍රකාශ කිරීමෙන් අවවාදනුශාසනාකොට උපකාරකරණ දයකවරු අකුසල් කිරීමෙන් වලක්වද්ද, එසේම අවවාදනුශාසනාකොට දානශීලාදි දශකුශල ධර්ම්මයෙහි යොදවද්ද, ප්‍රත්‍ය දයකාදීන් සුවපත් වෙත්වයිකියා යහපත්සිතින් අනුකම්පා කෙරෙද්ද, මින්ඉහත නොඅසනලද කුශලාකුශල විභාගවූ ගාම්භීර ධර්ම්මකථාවන්ශ්‍රවණයකරවද්ද, අසනලදධර්ම්මකථාවන් දෙවනු නොවනුත් කියාදීමෙන් කාංශා විනොදනයකොට පවිත්‍රකරවද්ද, නොවරදවාම ස්වර්ගයටයායුතු මාර්ගය මෙයයිකියා කටයුතු කුසල්කියද්ද

ගුහමේ සඞ්ගාකාරයෙන් ප්‍රත්‍ය දායක වරුන්ට ශ්‍රමණ බ්‍රාහ්මණයන්විසින් උපකාර කළයුතු:

67

,,පණ්ඩිතො සීලසම්පන්නො ජලං අග්ගීව භාසති
භොගෙ සංහරමානස්ස භමරස්සෙව ඊරියතො.

68

භොගා සන්නිචයං යන්ති වම්මිකොවූ පචීයති
එවං භොගෙ සමාහත්වා අලමත්තො කුලෙ ගිහී,,යි

දරුවන්විසින් දෙමව්පියන්ට කලමනා උපකාරපසඳ, දෙමව්පියන්විසින් දරුවන්කෙරෙහි පැවැත්වියයුතු අනුකම්පා පසඳ. ගෝලයන් විසින් ගුරුවරයන්ට කලමනා උපකාරපසඳ, ගුරුවරයන්විසින් ගෝලයන්කෙරෙහි පැවැත්වියයුතු අනුකම්පා පසඳ, ස්වාමිපුරුෂයාවිසින් ස්ත්‍රීන්ට කලමනා උපකාරපසඳ, ස්ත්‍රීන්විසින් ස්වාමිපුරුෂයා කෙරෙහි පැවැත්වියයුතු අනුකම්පාපසඳ, ලොකයාවිසින් මිත්‍රයන් සහ ඇමතියන්ට කලමනා උපකාරපසඳ, මිත්‍රයන් සහ ඇමතියන්විසින් ලොකයා කෙරෙහි පැවැත්වියයුතු අනුකම්පාපසඳ, වැඩකාරයින්විසින් ස්වාමියාහට කලමනා උපකාරපසඳ, ස්වාමියාවිසින් වැඩකාරයන්කෙරෙහි පැවැත්වියයුතු අනුකම්පාපසඳ, ප්‍රත්‍යදායකයන් විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට කලමනා උපකාර පසඳ ශ්‍රමණ බ්‍රාහ්මණයන්විසින් ප්‍රත්‍යදායකයන් කෙරෙහි පැවැත්වියයුතු අනුකම්පාසයද, මෙසේ එක්සැටක් කාරණයෙන් සමන්විතවූ ශීලයෙන් සම්පූර්ණ වූවහැකි ගිහිජනතෙම දිළිසෙන ගින්නක්මෙන් බබලාද යම්සේ මල්රෙන් ගන්නා බඹර පුෂ්පයෙහි වර්ණයහා සුගන්ධයද නොනසාම තුඩින්හා පියාපත්වලින්ද රෙන් ගෙණ ක්‍රමයෙන් මහත්වූ මධුපටලයක් කෙරේද එමෙන්ම තමාද අනුන්ද නොපෙළා ක්‍රමයෙන් දැහැමෙන් සෙමෙන් භවභොගාදී වස්තුවෙන් බහුල භාවයට පැමිණෙන්නේය —— තවද ධාර්මික යහපත් ක්‍රියාකාරණ මෙවැනි ගිහිජනයාගේ

වස්තුව ක්‍රමයෙන් වැඩිදිවුනු වෙති කුමක් මෙන්ද වේයන්විසින් බඳනාලද තුඹස සම්පේක්‍රමයෙන් මහත්වේද එපරිද්දෙන් වස්තුරැස්කොට ඔහු ගිහිගෙයි විසීමටද සමර්ථවන්නේය.

---

## 25 වස්තුවප්‍රයොජන ගන්නාවිධිය.

69

"චතුධාවිභජෙ භොගෙ සවෙමිත්තානිගන්ථති එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය ද්විහිකම්මංපයොජයෙ චතුත්ථංචනිධාපෙය්‍ය ආපදාසු භවිස්සති" ඉති.

ගිහිගෙයි වසන්නා විසින් තමාගේ භොගවස්තුව සතර කොටසක්වබෙදන්නේය එක්කොටසක් කෑම්බීම් ආදියපිණිස වියදම්කරන්නේය, දෙකොටසක් ගොවිකම් වෙලඳාම් ආදිකර්මාන්තයන්ගේ වැඩිදියුණුව පිණිස යොදන්නේය, සතරවෙනි කොටස රාජචොර ශස්ත්‍රාග්නි උදක යනාදී සමඟින් යම් අපදාවක්පැමිණිවිටක ගැණීමපිණිස නිධානවශයෙන් ප්‍රවේශම්කොට තබන්නේය, එකාන්තයෙන් මෙබඳුවූ ගිහිජනතොම මිත්‍රයන් රැස්කරන්නේය—මෙහිවනාහි කුසල්කිරිමට වෙනම කොටසක් නොවදාරණ ලද්දේය. එසේ වදාළකල්හි මෙපමණකින් කුසල්කටයුතුයයි පරිච්ඡේදකළානම්වෙයි, ලොභාදී අකුසල් ඇති තෙක්ම සත්වයන්විසින් දානශීල භාවනාදී කුසල් කිරීම මෙපමණක් සෑහෙයි නියමයක් නැතිබැවින් ශ්‍රද්ධානුරූපව සතරකොටසින්ම හෝ එක්කොටසකින්හෝ කුසල්කටයුතු බැවින් අපභාග්‍ය වතුන් වහන්සේවිසින් කුසල්කිරීමට කොටසක් වෙන්නියම නොකළබව දතයුතු—එබැවින් සසරභයදක්නා ප්‍රඥාවන්තයන්විසින් තමන්ගෙන් යමක්යමෙක්ඉල්වත්නම්ගණිත්නම්දානවශයෙන් දීමෙහි පසුනොබස්නා අදහස්ඇතිවිය යුතුබැවින් කුසල්කිරීමට ශ්‍රද්ධා ප්‍රඥාදෙක ප්‍රමාණවාමිස අනික් කිසිම වස්තුවක් ප්‍රමාණ නැතිබවද දතයුතු.

Hosted by Google

## 26 ස්ත්‍රීන්ගේ යහපත් පැවැත්ම.

‹‹යාඥතාපීසාමිකෙ අනුකම්පාය සගනාවිධානතො පඨම්ංපටිඨපිතවා,, —— යනාදීන් යම්ස්ත්‍රියක් ස්වාමියාකෙරෙහි අනුකම්පාවෙන් වැදගොත්තැනින් පළමුනැගිසිට පිරිවරජනයන් ඒ ඒ කම්මාන්තයෙහි යොදවා ගෙම්දුල් අමන්දවා කිරිදෙවිම්ආදිය කරන්නීද, සම්ආකාරයකින් ස්වාමියාගේ මනවඩන්නේද එපරිද්දෙන් පිළිපදින්නීද, සිත් අලවන වචනයකින් ස්වාමියාවිචාරා නහන පැන් ආදිය සපයන්නීද; දවසෙදෙවෙලේ ගෙදරබත්කාන සියල්ලන්ට බත්දෙවා බත්හොලත් කොණෙක්ඇද්ද ඔවුන්ට බත්සපයාතබා ගාල්කළ ගෙරින්ද ආනාවුන් විචාර අටුකොටු ආදියද රැකීමෙහි විධානකරවා යතුරුමුදුගෙන්වාතබා අප්‍රවෙශම් තැන්වලතුබුබඩු ප්‍රවේශම් ස්ථානවල තබ්බවා සෙටදින උදය මේ මේ දෙය කටයුතු යයි විධානකොට පසුවතමන් සයනය කරන්න්ද, ස්වාම්යාටද ඔහුගේ මව්පියන්ටද මහණබමුණන්ටද සත්කාර ගරුකාර කරන්නීද, ගෙටආවාවුන්ට අනුත්පනවාදී පාසේදවිම් ආදියකොට බත්දෙවන්නීද, ස්වාම්යාගේ හුල්කැපීම් ආදියෙහි දක්ෂවන්නීද, ගත්ගත්දෙය අලසනැතිව තොමේම කරන්නීද, පිරිවර ජනයන්ලවා කටයුතුදෙය කරවන්නීද, දුසිදුසාදීන් අතුරෙන් මොහුදවස මුළුල්ලෙහිම කර්මාන්ත කෙලේය මොහු පෙරවරු කාලයෙහිය මොහු සවස් කාලයෙහියයිදැන ඒ ඒ තරම් වැටුප් දෙන්නීද, ඔවුන්ගේ ගිලම්බවද බලාබලද දැන බෙහෙත්දීම් ආදියෙන් සංග්‍රහකරන්නීද, ස්වාමිහුවිසින් රැස්කාරණලද ධනධාන්‍යාදී වස්තුව සුරක්ෂිතකොට තබන්නීද, ධූර්තියක් සොරකම් කරන්නියක් සුරාපාන කරන්නියක් ලොල් තැනැත්තියක්නොවන්නීද, සරණ ශීලයෙහි පිහිටිනීද, මසුරු නොවදන්දෙන්නීද මෙතෙක්ගුණයෙන්සමන්විත

Hosted by Google

ස්ත්‍රීතොමෝ මනාප කායික දෙවියන් කෙරෙහි උපදින්නීය, මනාප කායික දෙවියෝනම් නිර්මාණරතී දෙව්ලොව කැමති කැමති වර්ණරස සැප මවාගෙණ සැපවිඳිනා දෙවියෝය—තවද එක්සමයෙක්හි මල්ලිකාදෙවි දෙවුරම් වෙහෙරට ගොස් බුදුන්වැඳ එකත්පසෙහිඳ ප්‍රශ්න සතරක් විචාරන්නී, ස්වාමිනි මේ ලොකයෙහි සමහර ස්ත්‍රීහු විරූපවෙති දිළිඳුවෙති අල්පෙශාක්‍යවෙති, සමහර ස්ත්‍රීහු සුරූපවෙති ධනවත්වෙති මහෙශාක්‍යවෙති, සමහර ස්ත්‍රීහු විශිෂ්ට රූඇතිවෙති භොගයෙන් ආඪ්‍යවෙති අල්පෙශාක්‍යවෙති, සමහර ස්ත්‍රීහු විශිෂ්ට රූඇතිවෙති භොගයෙන් ආඪ්‍යවෙති මහෙශාක්‍යවෙති, ඔවුන් එසේවීමට කාරණා කිම්දැයි විචාළීය, ඒ අසා භාග්‍යවතුන් වහන්සේ වදාරණසේක් මල්ලිකාවෙනි මේ ලොකයෙහි යම් ස්ත්‍රියක් තොමෝ ක්‍රොධබහුල වන්නීද මහණබමුණන්ට ආහාරපානාදිය නොදෙන්නීද අනුන්ලබණ ලාභසත්කාරාදීයට ඊර්ෂ්‍යාකරන්නීද ඕතොමෝ එසින් චුතව මිනිසත්බවලැබූකල්හි විරූපවන්නීය දිළිඳුවන්නීය අල්පෙශාක්‍යවන්නීයයම්ස්ත්‍රියක්තොමෝක්‍රොධබහුලවන්නීද මහණබමුණන්ට දන්දෙන්නීදඊර්ෂ්‍යාමාත්‍යනොකරන්නීද ඕතොමෝ උපනුපන් තැන්හි විරූපවන්නීය ධනවත්වන්නීය මහෙශාක්‍යවන්නීයයම්ස්ත්‍රියක්තොමෝක්‍රොධබහුලනොවන්නීදමහණබමුණන්ට දන්දෙන්නීද ඊර්ෂ්‍යාමාත්‍ය කරන්නීද ඕතොමෝඋපනුපන්තැන්හි රූපවත්වන්නීය ධනවත්වන්නීය අල්පෙශාක්‍යවන්නීය යම්ස්ත්‍රියක්තොමෝ ක්‍රොධ නොකරන්නීය මහණබමුණන්ට ආහාරපානාදියෙන් උපස්ථානකරන්නීද අනුන්ලබණ ලාභසත්කාරාදියට ඊර්ෂ්‍යාමාත්‍ය නොකරන්නීද ඕතොමෝ උපනුපන්තැන්හි විශිෂ්ට රූඇතිවන්නීය ධනවත්වන්නීය මහෙශාක්‍යවන්නීය වදාළසේක, ඒඅසා මල්ලිකාදෙවිතොමෝ ස්වාමින් වහන්ස මම අතීතජාතියෙහි ක්‍රොධබහුලවීම් එහෙයින් දැන්

Hosted by Google

යම්සේ නීලපීතාදී වශයෙන් අනෙකප්‍රකාර
භෙදවූ රූපායතනයහට තදන්‍ය ධර්‍මයන්ට අසා
ධාරණබැවින් සනිදර්‍ශනබව විශෙෂ ලක්‍ෂණවිද
අනිත්‍යතාවමෙන් රූප්පනයමෙන් සාමාන්‍ය ලක්‍ෂ
ණනම් නොවිද එසේම ශීලයද තදන්‍ය ධර්‍මය
න්ට අසාධාරණ බැවින් චෙතනාදි භෙදභින්න
ශීලයට විශෙෂ ලක්‍ෂණයයි සේයි〰

71

දුස්සීල්‍ය විධංසනතා අනවජ්ජ ගුණතථා
කිච්චසම්පත්තිඅත්‍ථෙන රසොනාම පවුච්චති.

කායික අසංවරාදී භෙදඇති දුශ්ශීලතාවයා
ගේ නැසීම්ද එසේම නිරවද්‍ය කෘත්‍යයෙද කෘත්‍ය
යන සම්පත්තිය අර්‍ථකොට ඇති රසයෙන් රස
නැමතියයි කියනුලැබේ〰

72

සොචෙය්‍යපච්චුපට්ඨානං තයිදංතස්ස විඤ්ඤූහි
ඔත්තප්පඤ්චහිරිචෙවපදට්ඨානනතිවණ්ණිතං

කායසොචෙය්‍ය වචීසොචෙය්‍ය මනොසොචෙය්‍ය
යයි කියනලද කායාදී ද්වාරත්‍රයාගේ 'පිරිසිදුබව
වැටහීම ප්‍රත්‍යුපස්ථානනම්. ඒ සිල්වත්හුගේ පවු
කිරීමෙහි භයලැජ්ජාදෙක පදස්ථානයයි නො
නොත් සිල්රැකීමට ආසන්න කාරණයයි පණ්ඩිත
යන්විසින් වර්‍ණනා කරණලදී〰 " හිරොත්ත
ප්පෙ සතිසීලං උප්පජ්ජතිචෙව තිට්ඨතිච අසති
නෙව උප්පජ්ජති නතිට්ඨතීති එවංසීලස්සලක්ඛ
ණ රසපච්චුපට්ඨාන පදට්ඨානානි වෙදිතබ්බා
නි,,සී〰 පව්කිරීමෙහි ලැජ්ජා භයඇති කල්
හි ශීලය ඉපිදසිටී ලැජ්ජා භය නැතිකල්හි නො
මඋපදී නොමසිටී මෙසේ ශීලයාගේ ලක්‍ෂණ රස
ප්‍රත්‍යුපස්ථාන පදස්ථානයෝ දැනගත යුත්තාහුය.
" කිමානි සංසනති අවිප්පටිසාරාදී අනෙකගුණ
පටිලාභානි සංසං,,-සී〰 ශීලයෙහි කවර ආනි
සංසයක්ද; මරණසන්නාදි කාලවල විපිළිසර
නොවීම් ආදී නොයෙක් ගුණයන්ගේ ලැබීම ශීල

යාගේ ආනිසංසයයි ඒ මෙසේ වදාරණලදී ශීලයෙන් සම්පූර්ණවූ සිල්වත්තෙම නොපමාව මහත් භවභොගාදී සැපතට පැමිණේ ශීලයෙන් සම්පූර්ණසිල්වතාගේ යහපත්ගුණ කීර්තිය පැතිර පවතී, ශීල සම්පූර්ණ සිල්වත්තෙම ඉදින් ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති ශ්‍රමණ සංඛ්‍යාත යම් පිරිසක් කරා එළඹේද විශාරදව නොමැලිව එළඹේ, ශීලයෙන් සම්පූර්ණ සිල්වත්තෙම සිහිමුළානොව කාලක්‍රියාකොට කරජකාය භෙදයෙන් මරණින් මතු සුගති සංඛ්‍යාත දිව්‍යලොකයෙහි උපදී ශීලවන්තයාගේ සීලසම්පදාවෙහි මේ පඤ්චවිධ ආනිසංසයොවෙති— තවද මොහුගේ සිල් සම්පූර්ණය යි කියා බ්‍රහ්මචාරිවරු ප්‍රිය මනාපදවෙති ගරුව යෙන් සිත් හිලා වැඩිය යුත්තෙක්දවේ මෙසේ බොහෝදෙනාහට ප්‍රියමනාප එළවිම්වශයෙන් කාමාදී ආශ්‍රවයන්ගේ ක්‍ෂය කිරීම අවසංකොට නොයෙක් සීලානිසංස වදාරණලදී මෙසේ විපිළිසර නොවීම්ආදී නොයෙක් ගුණයෝ සීලය ඇසුරුකරණ ලද්දාහුය ඒබව මෙසේත් දක්වන ලදී—

73

සාසනෙකුල පුත්තානං පතිට්ඨානත්ථිංචිනා
ආනිසංස පරිච්ඡෙදං තස්සසීලස්සකොවදෙ

ලොව් ලොව්තුරාගුණ එළවන මේ ශාසනාශාසනයෙහි ආචාරකුල පුත්‍රයන්ගේ යම් ශීලයක්වේද ඒ ශීලයෙන් වෙන්ව පිහිටක් නැද්ද මෙසේ ආනිසංසඇති ඒ ශීලයාගේ අනුසස්හී ප්‍රමාණය කවරෙක් කියන්ට සමත්වේද; නොවේමැයි—

74

නගඞ්ගායමුනාචාපි සරභූවා සරස්වතී
නින්නගාචාචිරවතී මහීචාපි මහානදී.

75

සක්කුණන්ති විසොධෙතුං තංමලං ඉධපාණිනං
විසොධයති සත්තානං යංවෙසීල ජලංව ලං.

ගඞ්ගා යමුනා සරභූ සරස්වතී අචිරවතී මහී යන මහානදී ගඞ්ගාවෝද අනිකුදු චන්ද්‍රභාගාදී ගඞ්ගා

Hosted by Google

වෙද යන මේ සියළු ගඟාවෝ පවා මේ ලෝකයෙ
හි සියළු සත්වයන්ගේ යම් රාගාදී මලයෙක්වේද
ඒකාන්තයෙන් සිල්නැමති ජලය ශුද්ධකෙරේද
ඒ රාගාදි මලය ශුද්ධකරන්ට නොපොසත්හු වෙ
ති.—

76

නතංසජලදවාතා නචාපිහරිචන්දනං
වහාරනමණයො නචන්දකිරණඞ්කුරා.

77

සමයන්තීධසත්තානං පරිළාහංසුරක්ඛිතං
යංසමෙතිඉදං අරියං සීලංඅච්චන්තසීතලං.

මහාකොට රක්ෂාකරණලද විශුද්ධවූ අත්‍යන්ත
යෙන් සිහිල්වූ මේ ශීලයතෙම මේ ලෝකයෙහි
සත්වයන්ගේ යම් පරිළාහයක් සංසිඳුවාද ඒ පරි
ළාහය ශීත මාරුතයෝද රක්ත චන්දනයෝද මු
ක්තාහාරයෝද වෛඩූර්‍ය්‍යමාණික්‍යයෝද සඳරැස්
හුද නොසංසිඳුවති.—

78

සීලගන්ධ සමොගන්ධො කුතොනාම භවිස්සති
යොසමංඅනුවාතෙච පටිවාතෙච වායති.

යම් මේ ශීලයෙන් සමන්විතයන්හුගේ කීර්ති ශ
බ්දය මනොහර බැවිහුදු ඒ ඒ දික්හි පැතිරෙණ
බැවිහුදු ශීලගන්ධයයි කියනලදී ඒ ගන්ධයතෙම
සමව යටි සුළඟද උඩු සුළඟද හමා ශීලගන්ධය
සමවූ ගන්ධයක් කොතැන්හිවේද නොවේමැයි.

79

සග්ගාරොහණසොපානං අඤ්ඤංසීලසමංකුතො
ද්වාරංවාපන නිබ්බාණ නගරස්සපවෙසනෙ.

ස්වර්ගයට නැගීමට ශීලයහා සමවූ අනික්හි
ණෙක් කොසින්ද නිර්වාණ පුරයට වදනා තන්හි
නොහොත් ප්‍රවේශමෙහි ශීලයහා සමාන අනික්
දොරක් කොසින්ද.—

80

සොභන්තෙවං නරාජානො මුත්තාමණිවිභූසිතා
යථාසොභන්තියතයො සීලභූසන භූසිතා.

Hosted by Google

සීලාලඞ්කාරයෙන් අලඞ්කෘතවූ භික්ෂූහු යම්සේ හොබිද්ද මුතුමැණික් ආදියෙන් සැරසුනාවූ රජදරුවෝ එසේ නොහොබිති—

81

අත්තානුවාදාදිභයං විධංසයති සබ්බසො
ජනෙති කිත්තිං හාසංච සීලං සීල විතංසදං.

ශීලයතෙම සිල්වතුන්ට හැමකල්හිම තමන්ගේ නින්දාගර්හා කිරීමෙහි උපදනා භයද දණ්ඩභය දුර්ගතිභයද සර්වප්‍රකාරයෙන්ම නසන්නේය කීර්තියද සන්තොෂයද උපදවන්නේය—

82

ගුණානං මූලභූතස්ස දොසානං බලඝාතිනො
ඉති සීලස්ස විඤ්ඤෙය්‍යං ආනිසංසකථාමුඛං-ඉති.

ගුණයන්ට මුල්වූ දෝෂයන්ගේ බලයසි කියනලද ව්‍යතික්‍රම නසන්නාවූ ශීලයාගේ ආනිසංසකථාචාරය මෙසේ දතයුතු—

මෙතෙකින් ශීලවිභාගය නිමි:

---

## 29 සත්වයින්ගේ පිරිසිදුවීම.

88

සද්ධායතරතිඔඝං අප්පමාදෙනඅණ්ණවං
විරියෙනදුක්ඛං අච්චෙති පඤ්ඤාය පරිසුජ්ඣති.

යතුහෙයින් ශ්‍රෙයසාර්ථදිපනී-යෙහි දක්වනලද ඉතිපිසො භගවා අරහං යනාදී නවඅරහාදී බුද්ධ ගුණයන් ඇත්තා වශයෙන් අදහනලද ශ්‍රද්ධාවය, කරණලද දානශීලාදී කුසලකර්මයෙහි විපාකඇතැයි කියා කර්මඵල අදහන ශ්‍රද්ධාවය, යනමේ දෙයාකාර ශ්‍රද්ධාව කරණකොටගෙණ කාමොඝාදී චතුර්විධ ඔඝය එතර කරන්නේය— බද්ධානං පච්පාපී— ප— යනාදීන් දක්වනලද සංසාරසාගරය් කුසල්කිරීමෙහි අප්‍රමාදව විසීම කරණ

Hosted by Google

කොටගෙණ එතර කරන්නේය—නූපන් අකුසල් නොම ඉපිදවීම පිණිසද උපන් අකුසල් නැතිකිරීම පිණිසද නූපන් කුසල් උපදවාගැණීම පිණිසද උපන්කුසල් වැඩිදියුණු කරගැණීම පිණිසද යන මේ සතරාකාරයෙන් පවත්වන ලද චතුර්විධ සම්‍යක්වීර්‍ය්‍ය කරණකොටගෙණ කායික චෛතසික දුක්ඛය අතික්‍රාන්ත කරන්නේය, ලොකොත්තර ප්‍රඥාවෙන් සත්‍වයාගේ පිරිසිදුවීම වන්නේය—එහි ලොකොත්තර ප්‍රඥාව නම්— "කතමා ච භික්ඛවෙ පඤ්ඤාසම්පදා-පෙ-අයං වුච්චති භික්ඛවෙ පඤ්ඤාසම්පදා" යී— මහණෙනි ප්‍රඥාසම්පත්තිය කවරක්වන්නීද, මහණෙනි දුක්ඛසත්‍යයාගේ යම්දැනීමෙක්ඇද්ද, සමුදය සත්‍යයාගේයම්දැනීමෙක් ඇද්ද නිරොධ සත්‍යයාගේ යම් දැනීමෙක් ඇද්ද, මාර්ගසත්‍යයාගේ යම් දැනීමෙක් ඇද්ද, මහණෙනි මේ ප්‍රඥා සම්පත්තිය නම්වන්නීය, එහිත් දුක්ඛසත්‍යය නම් කවරක්වන්නීද, ජාතියයි කියන ලද ඉපදීම දුකය, ජරාවයයි කියනලද තමාගේඅත පය තමාහටම වසඟ නැතිවීම් වශයෙන් ජරාවට පැමිණීම දුකය, ව්‍යාධියයි කියනලද ජ්වරාතිසාරාදී නොයෙක් රෝග පැමිණීම දුකය, මරණයයි කියනලද පඤ්චස්කන්ධ සංඛ්‍යාත ආත්මයාගේ බිඳීම දුකය, ශොකයයි කියනලද ඥාතිව්‍යසනාදී එක්තරා ව්‍යසනයකින් යුක්තවූවාහට සිත වෙහෙසීම් වශයෙන් පැමිණෙන ශොකය දුකය, පරිදෙවයයි කියනලද එබඳු ව්‍යසනයකින් යුක්තවූවාහුගේ හැඬීම දුකය, දුක්ඛ දුක්ඛයයි කියනලද ශොක පරිදෙවාදී දුක්පැමිණීමද දුකය, දෞර්මනසයයි කියනලද සිතවශයෙන් වෙහෙසීම දුකය, උපායාසයයි කියනලද සිතවශයෙන් බලවත්ආයාසයට පැමිණීම දුකය, අප්‍රිය සම්ප්‍රයොගයයි කියනලද අප්‍රියයන් සමග එකතැන විසීම දුකය, ප්‍රියවිප්‍රයොගයයි කියනලද ප්‍රිය මනාප අයගෙන් වෙන්වීම දුකය, ඉච්ඡා විඝාතයයි කියනලද තමාගේ කැමැත්තාලෙස යමක් නොලැබීම දුකය, පංචු

පාදානස්කන්ධයයි කියනලද රූපස්කන්ධාදී පඤ්චස්කන්ධ සංඛ්‍යාත ආත්මය හාත්පසින් දුක්වන්නේ යයි, මෙසේ දුක්ඛසත්‍යය දෙසොළොස් කොට්ඨාසයකට බෙදා දක්වනලදී — එයිනුදු පළමුවෙනි ජාති දුකම පස් ආකාරයකින්ද දුක්බව දක්වනු ලැබේ, කෙසේද; දැඩිවූ අන්ධකාර ඇති ඉවසිය නොහැකි බලවත් දුර්ගන්ධ ඇති මව්කුසෙහි මෑනියන්ගේ ආමාසයෙන් යට පක්වාසයෙන් මතු උදරපටලයටත් පිටකටුවටත් අතර අශුචිවලක හටගන්නා පණුවෙකු පරිද්දෙන් උපදගන්නේය, මේ මව්කුසට එළඹීම නිසා හටගන්නා දුක් නම්වේ — ගර්භය පරිහරණය කාරණ මෑනියෝ ඉක්මනින් යාම් ඒම් ආදී ඉරියව් පවත්වනවිට කුසහොත් ළදරුවා හට සුරාධූර්තයෙක් අතටපත් දික් ලොම්ඇති එළුවෙකුට මෙන්ද අහිගුණ්ඨිකයෙක් අතටපත් සර්පයෙකුට මෙන්ද උණුසුම් කැඳබත් ආදියක් අනුභවකළ කල්හි කිහිරගුරු රැසක්මැද තැවෙන්නෙක්මෙන්ද කටුක ලුනු ඇඹුල් ආදියක් අනුභවකළකල්හි ඛාරාපතච්ඡික නම් වධයටපත් පුරුෂයෙකුට මෙන්ද ඉතා ශීතල කැඳබත් ආදියක් අනුභවකළ කල්හි ශීත නරකයෙහි උපන් තිරිසනෙකුට මෙන්ද දුක් පැමිණෙන්නේය, මේ ගර්භයතුල විසීමෙන් ඇතිවන දුකය — ඒගැබයොනි මාර්ගය සරස්ව වැටුනුකළ මෑනියන්වත් ජීවත්කරගන්නා කැමති ඤාතීහු අදර්ශනීයවූ ස්ථානය කැපීම් කෙටීම් වශයෙන් දුක් උපදවා ළදරුවා ජීවිතක්ෂයට පමුණුවා පිටතට හැරගන්නේය, මේ ගර්භය විපත්තිවීමෙන් ඇතිවන දුකය — පා උඩුකුරුව හිස යටිව කර්මජ වාතයෙන් යෝනිමාර්ගයකරා පෙරළාගන්නා කල්හි සියගණන් පුරුෂ ප්‍රමාණ ප්‍රපාතයක වැටුනාක්මෙන් දුක් ඇතිවේ, පිටතට නික්මෙන ඒ ළදරුවා කෙසී සිදුරකින් නික්මෙන ඇත් පැටවෙකුමෙන් මහත් සම්බාධයෙන් නික්මේ, මේ බිහිවීම මුල්ව උපදින දුකනම්වේ — ඒ ළදරුවාගේ මුදු මොළොක්

Hosted by Google

ශරීරය ඇල්වීම් ඇඹිම් ආදීයෙහිදී තියුණු මුවහත් ශස්ත්‍රවලින් පලන්නාක් මෙන්ද ඉදිකටුවලින් අනින්නාක් මෙන්ද දුක් උපදින්නේය, මේ මව්කුසින් බිහිවූපසු උපදින දුක නම්වේ— උපන් පසුත් නාමන්ම කොබව ආහාර නොගැණීම් ආදී වශයෙන් පැමිණෙන්නේ ආත්මෝපක්‍රම මූලක දුක නම්වේ, අනුන්විසින් වධ බන්ධනාදියට පැමිණවීමෙන් වන්නේ පරොපක්‍රම මූලක දුක නම්වේ, මෙසේ නොයෙක් ප්‍රකාර වශයෙන් දුක් දකවා නැවත පචස්ඛන්ධ සංඛ්‍යාත ආත්මිය එකම දුක් පිඩක් බවත් දකවා තිබෙසි— යම් නුවනැති පුරුෂයෙක් මහා සමුද්‍රයෙන් දිය බින්දුවක් දිවග තබා සිඳ එම සමුද්‍ර ජලය එතූ රසයයි දැන ගන්නාමෙන් නාත් පසින්ම පචස්ඛන්ධයෙන් යුක්තාවූ ආත්මයද දුකබව දතයුතු— සමුදය සත්‍යය නම්, "යායංතණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනිසෙය්‍යථිදං කාමතණ්හා භවතණ්හා විභවතණ්හා,,යි— නැවතඉපදීම් කරන්නාවූ නන්දිරාග සහගතාවූ ඒ ඒ භවයෙහි ආලය කරන්නාවූ යම් තෘෂ්ණාවකෙණක් ඇද්ද, හේ මෙසේය, කාමතෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය යන මේ ත්‍රිවිධ තෘෂ්ණාවනිසා ජාති ආදි දුක් ඉපදීම වන්නේය— නිරොධ සත්‍යය නම්, "යොතස්සායෙව තණ්හාය අසෙසවිරාග නිරොධොචාගොපටිනිස්සග්ගො මුත්ති අනාලයො,,යි- යම් ඒ තෘෂ්ණාවගේ අශෙෂ විරාග නිරොධයෙක් ත්‍යාගයෙක් අත්හැරීමෙක් නොඇලීමෙක් ඇද්ද හෙනිරොධ සත්‍යය නම්වේ— මාර්ග සත්‍යය නම්, "අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො සෙය්‍යථිදං සම්මාදිට්ඨිසම්මාසංකප්පො සම්මාවාචා සම්මා කම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසතිසම්මාසමාධි,,යි— සච්චානු ලොමිකසම්‍යක් දෘෂ්ටියද අව්‍යාපාදදී සම්‍යක්කල්පනාවද, මුසාවාදාදීයෙන් වෙන්වීම් සංඛ්‍යාත සම්‍යක්වචනයද ප්‍රාණඝාතාදීයෙන් වෙන්වීම් සංඛ්‍යාත සම්‍යක්කර්මාන්තයද මද්‍යවනිද්‍යා

Hosted by Google

## සත්වයන්ගේ පිරිසිදුවීම:

දියෙන් වෙන්වීම් සංඛ්‍යාත සම්‍යක් ජීවිකාවද සත
රසම්‍යක් ප්‍රධන් වීර්‍ය්‍යයයි කියනලද සම්‍යක් ව්‍යා
යාමයද සතර සතිපට්ඨානයයි කියනලද සම්‍යක්
සිහියද තමාගේ සිත මනාව එකඟකර ගැණීම
යයි කියනලද සම්‍යක් සමාධියද මේ ආර්‍ය්‍ය අෂ්ටා
ඟික මාර්ගයනම්වේ, සියළුම සංසාරදුක් සිඳහැ
රීමෙන් සත්වයා පිරිසිදුවන්නාවූ ආර්‍ය්‍ය අෂ්ටා
ඟික මාර්ගයනම් මේය, චතුරාර්‍ය්‍ය සත්‍යධර්ම්මය මේ
සංක්ෂෙපයෙන් දැක්වීමයි.—තවද ශ්‍රේයාර්ථී
ජනි යෙහි දක්වනලද අසත්පුරුෂ සෙවනයෙන්
වැලක සත්පුරුෂ පණ්ඩිතයන් සෙවනය කිරී
මෙන්ද බුද්ධදෙශිත ශ්‍රී සද්ධර්ම්මය බොහොසේ ඇ
සීමෙන් යොනිසොමනස් කාරයයි කියනලද
නිර්වාණගාමී හොඳ නුවනින් යමක් කල්පනාකිරී
මෙන්ද මෙහි දැක්වූ සරණ ශීලය ආදී ධර්ම්මයන්ට
එකඟව හැසිරීමෙන්ද යනාමේ සතර කාරණ
යෝම ලෞකික ලොකොත්තර ප්‍රඥව උපදවා
ගැණීමට ඒකාන්ත කාරණ බැවින් ඇස් කණ්
නාසාදීය විකලත් කමක් නැතිව යහපත් මනුෂ්‍ය
වත් ඉපද උත්තමයන්ගේ මෙවැනි උතුම් අවවාද
අනන්ට දකින්නටත් ලැබුණු සත්පුරුෂයන් විසින් එ
හි නොහික්මී බොහෝ නුණුවනකමින් හැසිර මෙ
ලොවදීත් නින්දවට සහ දුකටත් පැමිණ පරලො
වදීත් සතර අපාදුකට පැමිණ අපමණ දුක්විඳි
න්ට ලැබෙණ බැවින් දෙලොවින්ම සැප කැමති
සැම දෙනාම යහපත් නුවනින් කල්පනාකර මෙ
හි දක්වනලද මේ උතුම් දැහමිතිකම් ආදර ගෞර
වයෙන් අසා බලා තම තමන්ගේ දූ දරු ආදීන්ට
සහ අන්නටද කියාදීමෙන් උගන්වා විසමවූ මිථ්‍යාදෘ
ෂ්ටියටද නොපැමිණ බුද්ධාදී උත්තමයන්ටද ඇතු
ළත්වබොහෝ කුසල් රැස්කිරීමෙන් දෙලෝ ජය
ගෙණ ලෞකික ලෝකොත්තර සැප සිද්ධකර
ගන්ට උත්සාහ කටයුතු—

---

නිමි

—ශි ව ම සතු—

Hosted by Google

Hosted by Google